වාර්ෂික වාර්තාව
ஆண்டு அறிக்கை
ANNUAL REPORT

2017



ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

இலங்கை போக்குவரத்துச் சபை

SRI LANKA TRANSPORT BOARD

අංක : 200, කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05

இல.200, கிருல வீதி, நாராஹேன்பிட்ட, கொழும்பு 05

NO : 200, KIRULA ROAD, NARAHENPITA, COLOMBO 05

වාර්ෂික වාර්තාව

2017

ශ්‍රීලංකා ගමනාගමන මණ්ඩලය

පටුන

1. දැක්ම,මෙහෙවර,අරමුණ

2. හැඳින්වීම

3. සභාපතිතුමාගේ පණිවිඩය

4. කාර්යයසාධනයසහප්‍රගතිසමාලෝචනය

5. මූල්‍ය ප්‍රකාශය

6. විගණකාධිපතිවාර්තාව

දැක්ම

කලාපයේ විශිෂ්ඨතම මගී ප්‍රවාහකයා

මෙහෙවර

මහජනතාවට ආරක්ෂිත, විශ්වාසදායී, සුවපහසු මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවයක් සාධාරණ ගාස්තු ක්‍රමයක් යටතේ සේවයට කැපවූ ඵලදායී කාර්යය මණ්ඩලයක්, ආයතනයේ සියළුම සම්පත් උපරිම ප්‍රයෝජනයට ගනිමින් ආර්ථිකමය වශයෙන් තුලනාත්මකව පවත්වාගෙන යාම.

අරමුණු හා පරමාර්ථ

1. ප්‍රාදේශීය කාර්යාල 12 මඟින් ඩිපෝවන් සඳහා උපදෙස් දීමත් ප්‍රධාන කාර්යාලය හා සම්බන්ධීකරණය කිරීම මඟින් ගුණාත්මක,ප්‍රමාණාත්මක සහ කාර්යක්ෂමව හා ඵලදායී බස් සේවාවක් සැපයීම පිණිස කටයුතු ප්‍රවර්ධනය කිරීම.

2. පාසල් යන ළමයින් සඳහා සතුටුදායක බස් සේවාවක් සැපයීම.

3. මූල්‍යමය ප්‍රතිලාභ නොමැතිවීම හේතුකොටගෙන පෞද්ගලික බස්රථ ධාවකයින් විසින් අතහැරදමා ඇති ආදායම් නොලබන මාර්ගවල බස් සේවා යෙදවීම.

4. පිටකොටුව මධ්‍යම බස් නැවතුම් පොළේ සිට දුර පළාත් වලට දුර ගමන් සේවා සැපයීම.

5. රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ප්‍රවාහන නියෝජිත ආයතන සම්බන්ධීකරණය කිරීම.

6. උත්සව, විශේෂ අවස්ථා, පාර්ලිමේන්තු/ පළාත් සභා මැතිවරණ ආදිය වැනි අවස්ථාවන්වලදී බස් සේවා සම්බන්ධීකරණය කිරීම.

7. තැපැල් සහ පුවත්පත් ප්‍රවාහනය කිරීම.

8. බස් ධාවනය සම්බන්ධයෙන් ප්‍රාදේශිකයන්, මහා භාණ්ඩාගාරය, ජාතික ප්‍රවාහන කොමිෂන් සභාව, පළාත් සභා අදාල අමාත්‍යාංශ සහ අනෙකුත් අදාල නියෝජිත ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම.

9. ශ්‍රී ලංගමයේ රියදුරු පුහුණු පාසැල්වලින් මනා පුහුණුව ලැබූ විනයගරුක රියදුරන් සැපයීම.

10. රියදුරන්, කොන්දොස්තරවරුන්, යාන්ත්‍රික ශිල්පීන් සහ අධීක්ෂණ කාර්යය මණ්ඩලය වෙනුවෙන් සම්මන්ත්‍රණ වැඩමුළු පැවැත්වීම.

11. ප්‍රාදේශීය වැඩපොළවලින් නිෂ්පාදනය කරනු ලබන කට්ටල/ උප කට්ටල ඩිපෝවන් වෙත සැපයීම.

12. සිත්ගන්නා සුළු අඩුකල මිල ගණන්වලට වැඩිහිටියන් සහ ශිෂ්‍යයන් සඳහා වාර ප්‍රවේශපත්‍ර ලබාදීම.

13. පළාත් වැඩපොළවල් සඳහා ඉතා වැදගත් අමතර කොටස් නිකුත් කිරීම සඳහා නාරාහේන්පිට ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලයේ ගබඩාව පවත්වාගන යාම.

14. ඩිපෝවන්වල බස් ධාවනය සම්බන්ධයෙන් ආරක්ෂක විමර්ශන, හදිසි වැටලීම්, සෝදිසි කිරීම් ආදිය පැවැත්වීම.

හැඳින්වීම

සියලුම ආකාරයේ ප්‍රවාහන මාධ්‍යයන් රටේ ආර්ථික සංවර්ධනය සලකා නිසැකවම අත්‍යාවශ්‍ය වේ. මාර්ගස්ථ මගී ප්‍රවාහනය සම්බන්ධයෙන් එය විශේෂයෙන්ම අත්‍යාවශ්‍යවන්නකි. ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටක නගර සහ ග්‍රාම සම්බන්ධතාවය පවත්වාගැනීම පිණිස බස් සේවාව වැදගත් මෙහෙයක් ඉටුකරන අතර මුළු මහත් රටේම ඒකාබද්ධතාවය එමඟින් ඇතිකරයි.

මාර්ග 1200 කට පමණ සම්පූර්ණයෙන් බස් රථ ධාවනයකරන ලද බස් රථ ධාවකයන් 80 දෙනෙකු පමණවිසින් දිවයින පුරා සපයන ලද බස් සේවා ද ලියාපදිංචි කල බස් රථ 3532 ක් ද 1957.10.31 දින 1957 අංක 48 දරණ මෝටර් රථ ප්‍රවාහන පනත මඟින් ජනසතු කරන ලද අතර ඒ අනුව ලංකා ගමනාගමන මණ්ඩලය (ලං.ග.ම) 1958.01.01 දින සිට ක්‍රියාත්මක විය.

එවකට පටන් 1977 වර්ෂය දක්වා මාර්ගස්ථ මගී ප්‍රවාහනය සම්බන්ධයෙන් ලං.ග.ම ඒකාධිකාරිත්වයකින් ක්‍රියාත්මක වූයේය. 1978 අංක 19 දරණ ගමනාගමන මණ්ඩල ව්‍යවස්ථා මඟින් ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය මගින් සම්බන්ධීකරණය කරනු ලබන ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩල 10ක් පිහිටුවා 1978 දී ලංගම විමධ්‍යගත කරන ලදී.

ප්‍රදේශයේ සහ පළාතේ අවශ්‍යතා පිළිබඳ වැඩි වශයෙන් සංවේදීවීමටත් ප්‍රදේශයේ ප්‍රවාහන ගැටළු සඳහා ක්ෂණික විසඳුම් ලබාදීමටත් කුඩා ඒකකවලට හැකිවන බව අපේක්ෂා කල බැවින්, විමධ්‍යගත කිරීමෙන් මගී ජනතාවගේ අවශ්‍යතා වඩා කාර්යක්ෂම හා ඵලදායී ලෙස ඉටු කිරීමට හැකි වෙතැයි රජය අදහස් කළේය.

කෙසේ වුවද ලං.ග.ම විසින් දරණ ලද පාඩු දිගින් දිගටමවැඩිවීම නිසාත් නිදහස් ආර්ථිකය පිළිබඳ නව සංකල්ප නිසාත් දිගින් දිගටම වැඩිවෙමින් පැවති මගී ඉල්ලුම සපුරාලීමට නොහැකි වීම නිසාත් මගීන් ප්‍රවාහය කිරීම සඳහා පෞද්ගලික අංශයට ද අවසර ලබාදෙන ලදී.

රජයේ දැඩි විශ්වාසයකින් පෞද්ගලීකරණය මඟින් රාජ්‍ය අංශය ප්‍රතිව්‍යුහගත කිරීමේ කොටසක් වශයෙන් ලං.ග.ම ජනතාකරණය කිරීමට කටයුතු කළේය. 1987 අංක 23 දරණ රජයේ සංස්ථා හෝ රජය සතු ව්‍යාපාර පොදු සමාගම් බවට පත්කිරීමේ පනත යටතේ ලංගම ජනතාකරණය කරන ලදී. ජනතාකරණය සිදු කල අවස්ථාවේදී පැවති ගමනාගමන මණ්ඩලය ඩිපෝ 93ක් වෙන් වෙන් වශයෙන් සීමාසහිත සමාගම් බවට පත්වූ අතර එම සමාගම් පාලනය කිරීම් සඳහා සේවකයන් අතුරෙන් අධ්‍යක්ෂමණ්ඩලයක් තෝරාගන්නා ලදී. එම සමාගම්වල සම්පූර්ණ කොටස් ප්‍රමාණයෙන් අඩක් කාර්යය මණ්ඩලය වෙත බෙදා දෙන ලද අතර ඉතිරි කොටස් මහා භාණ්ඩාගාරය සතුවිය. ජනතාකරණ වැඩසටහන 1990 වර්ෂයේදී ආරම්භකර 1994වර්ෂයේදී අවසන් කරන ලදී. ජනතාකරණය අවිධිමත් ලෙස ක්‍රියාත්මක කල බැවින් අපේක්ෂා කල ප්‍රතිඵල අත් නොවීය.

1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීමෙන් ඉහත ඩිපෝ ඒකාබද්ධ කර පොකුරු බස් සමාගම් පිහිටුවන ලදී. සේවක අතිරික්තයන්, විනය බරපතල සේ බිඳවැටීම, අසාධාරණ තරහකාරිත්වය, පාසැල් සේවාවන්, අනාර්ථික සේවාවන් වැනි සමාජමය වගකීම, ව්‍යත්තීමය දැනුමක් ඇති අයගේ හිඟය, අකාර්යක්ෂමතාවය, ධාවනය වැය ඉහල යෑම, දේශපාලන හා ව්‍යත්තීය සමිති අනිසි බලපෑම් හා පැතිරී ගිය දූෂණයන් පොකුරු බස් සමාගම් බිඳවැටීමට හේතු වූ සමහර කරුණු වේ.

මෙම ප්‍රශ්නයට විසඳුමක් වශයෙන් "2005 අංක 27 දරණ ශ්‍රී ලංකා ගමනාගමන පනත" මඟින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය 2005.10.19 පිහිටුවන ලදී.

සභාපතිතුමාගේ පණිවිඩය

2017/01/01 සිට 2017/12/31 දක්වා කාල සීමාව සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ (ශ්‍රීලංගම) වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම ගැන බෙහෙවින් සතුටු වෙමි. මා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සභාපතිවරයා ලෙස 2019/12/27 දින වැඩ භාරගත් අතර, සමාලෝචනයට භාජනය වූ කාල සීමාව තුළ මා සභාපති නොවූවත්, 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංගම වාර්ෂික වාර්තාව සඳහා පණිවිඩයක් නිකුත් කිරීමට මම බැඳී සිටිමි.

ශ්‍රීලංකාවේ පවතින විශාල රාජ්‍ය ආයතනවලින් ශ්‍රීලංගමයද එකකි. ජනසතු කිරීමට පෙර ප්‍රවාහන පද්ධතිය සංවිධානය කරනු ලැබුවේ පෞද්ගලික බස් හිමියන් අතළොස්සක් විසිනි.ජාතික ධනය පුද්ගලයන් කිහිප දෙනෙකුගේ අතෙහි සංකේන්ද්‍රණය වීම අසාධාරණ බැවින් ජාතික ධනය මේ රටේ ජනතාව අතර ඒකාකාරව බෙදා හැරිය යුතු බව පැහැදිලිවීම නිසා බස් සේවාව ජනසතුකරන ලදී.ඒ නිසා ශ්‍රී ලංගමෙහි ප්‍රගතිය බොහෝ දුරට රඳා පවතින්නේ ආයතනයේ සේවකයන්ගේ හා කළමනාකාරිත්වයේ ප්‍රයත්නයේ මතය බව අවබෝධ කර ගැනීම සුදුසුය.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් දිනකට ධාවනය කරනු ලබන සාමාන්‍ය බස් රථ සංඛ්‍යාව 5266 කි. ධාවනය කළ මුළු කිලෝමීටර ප්‍රමාණය 0.8% කින් සුළු වශයෙන් අඩුවී කිලෝමීටර් මිලියන 448 ක් විය.මගී කිලෝමීටර්ද 1.8% කින් අඩුවී බිලියන 15.8 විය. 2017 ජූලි 01 වන දින බස් ගාස්තු 6.3% කින් ඉහල නැංවුවද, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මුළු ආදායම 2017 දී 3% කින් පමණක් වර්ධනය වී රු.බිලියන 42.2 විය.ධාවන වියදම 4.6% කින් අඩු වී රු.බිලියන 40.1 ක් විය. 2017 දී මූල්‍ය කාර්යය සාධනය හේතුවෙන් මෙහෙයුම් ලාභය රුපියල් බිලියන 20 ක් පමණ වූ අතර එහි මෙහෙයුම් අලාභය 2016 දී රුපියල් බිලියන 1 යි. බස් ධාවනය අඩු කිරීම ප්‍රධාන වශයෙන් හේතු වූයේ 2017 මැයි මාසයේදී දිවයිනේ බොහෝ ප්‍රදේශවල ඇති වූ ගංවතුර තත්ත්වයයි.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය විසින් සපයන ලද අරමුදල් මඟින් බස් රථ 283 ක් පුනරුත්ථාපනය කරන ලදී.බස් රථවල තදබදය අඩු කිරීම සඳහා බස් රථ මෙහෙයුම් වාර ගණන වැඩි කිරීම, උදේ සහ රාත්‍රී සේවා වැඩි කිරීම, පාසල් බස් සේවා සහ පාසල් බස් රථ වැඩි කිරීම, රියදුරු පුහුණු කිරීමේ කුසලතා වැඩි දියුණු කිරීම, පරිගණක සාක්ෂරතාවය සහ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ නිලධාරීන්ට පුහුණුව, ඒකාබද්ධ බස් කාලසටහන් ස්ථාපිත කළ සෑම කලාපයකම පහසු බහු මාදිලියේ (multi modal) ගෙවීම් ක්‍රම හඳුනාගැනීම සහ බස් හා දුම්රිය ප්‍රවාහන පද්ධති බස් 55 ක් සමඟ ශක්තිමත් කිරීම බස් ප්‍රවාහන සේවා වැඩිදියුණු කිරීම සඳහා ගෙන ඇති පියවර කිහිපයකි.

ජාතික ප්‍රවාහන කොමිෂන් සභාවේ සහය ඇතිව 2017 දී රාජ්‍ය අංශයේ මාර්ග මගී ප්‍රවාහනයේ කාර්යක්ෂමතාව සහ ආවරණය වැඩි දියුණු කිරීම සඳහා ද විශේෂයෙන් අවශ්‍යතා ඇති හා අවදානමට ලක්විය හැකි අංශට මගීන් සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීමට පියවර ගන්නා ලදී.ඒකාබද්ධ කාලසටහනක් යටතේ කඩවත සහ මාතර සම්බන්ධ කරන දක්ෂිණ අධිවේගී මාර්ගය සහ පිටත වටරවුමේ අධිවේගී මාර්ගයේ බස් රථ 50 ක් පමණ ධාවනය විය.සිසු සැරිය යටතේ පාසල් ළමුන් සඳහා නව බස් රථ 90 ක් ඇතුළුව බස් රථ 1389 ක් ධාවනය කර ඇත.රාත්‍රී කාලයේ මගීන්ට ආරක්ෂිත පොදු ප්‍රවාහන සේවාවක් සපයමින් නිසි සැරිය බස් සේවා අඛණ්ඩව ක්‍රියාත්මක විය.මෙම ව්‍යාපෘතිය යටතේ 2017 දී නව බස් රථ 35 ක් යොදවා ඇත. ගැමි සැරිය ව්‍යාපෘතිය ග්‍රාමීය ප්‍රදේශවල ජනතාවට අවශ්‍ය ගමන් පහසුකම් සපුරාලයි. 2017 වර්ෂය තුළ රජය කොළඹ නගරය තුළ තෝරාගත් මාර්ගවල ප්‍රමුඛතා බස් මංතීරු ක්‍රියාත්මක කළේය.

ප්‍රධාන වශයෙන් පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරය සහ කොවිඩ් 19 වසංගතය පැතිර යාම හේතුවෙන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මූල්‍ය කාර්යසාධනය 2019 දී මන්දගාමී බවක් පෙන්නුම් කර ඇති අතර ඒ තත්ත්වය අද දක්වාම අඛණ්ඩව පවතී.දැනට ධාවනය සඳහා මුදා හරින ලද බස් රථ 5790 න් සාමාන්‍යයෙන් දිනකට ධාවනය වන්නේ බස් රථ 5200 ක් පමණක් වන අතර සාමාන්‍ය දෛනික මාර්ග ලේඛන ආදායම දිනකට රු. මිලියන 68 කි.

මණ්ඩලයේ මෙහෙවර හා දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා සමස්ත ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ කාර්යය මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කරන ලද දායකත්වය පිළිබඳව මම ඉතා සතුටු වෙමි.රජයේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට මට සහාය දුන් ගරුප්‍රවාහන ඇමතිතුමා, ගරුරාජ්‍ය අමාත්‍ය බස් ප්‍රවාහන සේවා සහ දුම්රිය මැදිරි සහ මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා, අමාත්‍යාංශ දෙකහිම ලේකම්වරු,මහා භාණ්ඩාගාරයේ නිලධාරීන් යන අයට සහ විශේෂ උනන්දුවක් සහ ඕනැකමක් දැක්වූ අනෙකුත් සියළුම අයටත් මාගේ ස්තුතිය පුද කරමි.

මේ වන විට අපි කොවිඩ් 19 සහ වෙනත් පසුබෑමකට ලක්ව සිටියද, මෙම තත්ත්වයට ඔරොත්තු දීමේ හැකියාව හා ස්ථාවරත්වය, වර්ධනය සහ සමෘද්ධිය කරා ගමන් කිරීමට අපි සියල්ලම එකමුතුව ගමන් කිරීම වැදගත්ය.



කිංස්ලි රණවක
සභාපති
ශ්‍රීලංකා ගමනාගමන මණ්ඩලය

ධාවන කොටස්කාශය

01. 2017 වර්ෂය තුල ධාවනයට දිනකට ලබාදුන් සාමාන්‍ය බස් රථ ප්‍රමාණය 6,010 ක් වූ අතර දිනකට ධාවනය කරන ලද සාමාන්‍ය බස් රථ ප්‍රමාණය 5,266 ක් පමණ වේ. දිනකට ධාවනය කළ සාමාන්‍ය කිලෝමීටර් ප්‍රමාණය මිලියන 1.23 ක් පමණ වේ. උපයනු ලැබූ සාමාන්‍ය දෛනික මාර්ග ලේඛන ආදායම කිලෝමීටරයකට රු 60.63 කි.

02. ශ්‍රීලංගම මඟින් සපයනු ලබන ප්‍රථම සහ රාත්‍රී ගමන්වාර තරකිරීමත් මගී අවශ්‍යතාවය අනුව එම සේවා වර්ධනය කිරීමටත් අවශ්‍ය පියවර ගෙන ඇත.

03. ශ්‍රී ලංගම බස් රථ සේවා සහ දුම්රිය ඒකාබද්ධ සේවය වර්ධනය කිරීම අරමුණු කරගෙන මගී අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන දුම්රිය ස්ථානවල සිට ආරම්භකරන සේවා වර්ධනය කිරීමටත් නව සේවා ආරම්භ කිරීමටත් පියවර ගෙන ඇත.

04. සිසුසැරිය ව්‍යාපෘතිය යටතේ සිසුසැරිය බස් රථ සේවාවන් 740 ක් දක්වා වර්ධනය කිරීමට හැකියාව ලැබී ඇති අතර ඉදිරියටත් සිසුන්ගේ සහ පාසල්වල අවශ්‍යතාවය සහ ඉල්ලීම් සලකා බලා මෙම සේවාව තවදුරටත් පුළුල් කිරීමට අවශ්‍ය විධිවිධාන සකස් කර ඇත.

05. සියළුම බස් රථ සඳහා විද්‍යුත් ටිකට් මැෂින් යොදාගැනීම තුලින් බස් රථ මඟින් මගීන්ට සැපයෙන සේවා කාර්යක්ෂමතාවය ඉහල නංවා ගැනීමටත් ඵලදායීතාවය වර්ධනය කරගැනීමටත් හැකියාව ලැබී ඇත.

සමාජ ප්‍රතිලාභ සඳහා ශ්‍රී ලංගම දායකත්වය

අළුයම ප්‍රථම හා රාත්‍රී අවසන් ගමන්වාර ධාවනය

අළුයම ප්‍රථම සහ රාත්‍රී අවසන් ගමන්වාර සැපයීම තුලින් රටේ ආර්ථිකයේ ශ්‍රම බලකාය සංචලනයට සෘජු දායකත්වයක්ලබාදෙන නමුත් මෙම සේවාව තුලින් ශ්‍රී ලංගමයට අතීතයේ සිට හිමිව ඇත්තේ කීර්තිනාමය පමණි. නමුත් ශ්‍රී ලංගම සිදු කරනු ලබන තවත් සමාජීය වගකීමක් ලෙස සලකා මෙම සේවාව මගී ජනතාවගේ සුවපහසුව පිණිස අඛණ්ඩවම ක්‍රියාත්මක කෙරේ.

ග්‍රාමීය ප්‍රදේශයන්හි බස්රථ ධාවනය

ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා ගම සහ නගර යා කිරීමේ ප්‍රබලතම ප්‍රවාහන මාධ්‍ය ලෙස සෘජුව දායකත්වයක් ලබාදෙනු ලබන්නේ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයයි. මගීන්ගේ අවශ්‍යතා සලකිල්ලට ගනිමින් මෙම සේවා අඛණ්ඩව සැපයීම සඳහා සෑම විටම කටයුතු කරන අතර ඉදිරියේදීද නව බස් රථ මිලදී ගෙන මෙම සේවාව වර්ධනය කිරීමට සැලසුම් සකස් කර ඇත්තේ ග්‍රාමීය ආර්ථිකය ඉහල නැංවීමට ග්‍රාමීය ප්‍රවාහනය විධිමත් කිරීම අත්‍යාවශ්‍ය සාධකයක් වන බැවිනි.

පාසල් සේවා බස්රථ ධාවනය

ශ්‍රී ලංගම විසින් දැයේ හෙට දිනය වෙනුවෙන් පාසල් ළමුන් ප්‍රවාහනය සඳහා විශාල සේවාවක් ඉටු කරනු ලබයි. මගී අවශ්‍යතාවය වැඩි කාලය තුළ ඉහල ලාභයක් ඉපයීමට හැකියාව ඇති අවස්ථා අහිමි කර ගනිමින් දැයේ අනාගත පරපුර නියමිත වේලාවට පාසලට රැගෙන යාම සහ ආපසු නිවෙස් බලා ආරක්ෂිතව ප්‍රවාහනය කිරීම සඳහා ශ්‍රී ලංගම සතු බස්රථ මඟින් ප්‍රශස්ත සේවාවක් සපයනු ලැබේ.

ලේකම් කොට්ඨාශය

<u>අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය</u>

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික මහත්ම/ මහත්මීන් ගණන07 ක් වන අතර එම නියෝජිතයින් පත්කිරීම පහත පරිදි වේ.

ගරු ප්‍රවාහන ඇමතිතුමා විසින් පත්කරන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සංඛ්‍යාව	04
පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සංඛ්‍යාව	01
මහාභාණ්ඩාගාරය අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සංඛ්‍යාව	01
ප්‍රවාහන අමාත්‍යාංශය අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සංඛ්‍යාව	<u>01</u>
මුළු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සංඛ්‍යාව	**<u>07</u>**

2017 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගි වූ සාමාජික මහත්ම/ මහත්මීන්ගේ විස්තර

රමාල් සිරිවර්ධන මහතා	**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික- ශ්‍රී ලංගම**	**සභාපති**	**ශ්‍රී ලංගම**
ඩී.සී.ඩබ්.හපුගොඩ මිය	**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික- ශ්‍රී ලංගම**	**අතිරේක අධ්‍යක්ෂ ජෙනරාල්**	**පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය**
එන්.නාතාවිතාරණ මිය	**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික- ශ්‍රී ලංගම**	**අතිරේක ලේකම් (පාලන/මුදල්)**	**පළාත් පාලන හා පළාත් සභා හා ප්‍රජාතන්ත්‍රවාදි පාලන අමාත්‍යාංශය**
ඒ.ඩී.ජයසේකර මහතා	**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික- ශ්‍රී ලංගම**		
ඒ.ටී.එල්.පී.සමරසිංහ මහතා	**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික- ශ්‍රී ලංගම**	**අතිරේක ලේකම් (තාක්ෂණ)**	**ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය**

2017 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

01 වන රැස්වීම	-	2017.01.04
02 වන රැස්වීම	-	2017.02.07
03 වන රැස්වීම	-	2017.03.09
04 වන රැස්වීම	-	2017.04.06
05 වන රැස්වීම	-	2017.05.04
06 වන රැස්වීම	-	2017.07.18
07 වන රැස්වීම	-	2017.08.15
08 වන රැස්වීම	-	2017.09.19
09 වන රැස්වීම	-	2017.10.10
10 වන රැස්වීම	-	2017.11.16
11 වන රැස්වීම	-	2017.12.19

2017 වර්ෂයෙහි පැවැත් වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර ගණන 11 යි

<u>2017 වර්ෂයේ ලේකම් කොට්ඨාශයේ කාර්යභාර්ය</u>

1. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සභාපතිතුමා කැඳවනු ලබන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

   එම කැඳවීම් අනුව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීමට හා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ තීරණ ක්‍රියාත්මක කරවීම සඳහා ප්‍රධාන විධායක නිලධාරී ප්‍රමුඛ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් හා කොට්ඨාශ හා අංශ ප්‍රධානීන් වෙත දැනුම් දීම.

2. 2005 අංක 27 දරණ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනතේ 11 (අ) වගන්තිය ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති බලතල අනුව ශ්‍රී ලංගම ඉඩම් වත්කම් කළමනාකරණය කිරීම හා යාවත්කාලීන කිරීම සඳහා නව පවරාගැනීම් හෝ පවතින ඉඩම් බැහැර කිරීම් සම්බන්ධ කටයුතු කිරීම.

3. සභාපතිතුමාගේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් පරිදි ශ්‍රී ලංගම අභිමතාර්ථ සපුරාගැනීම සඳහා අවශ්‍ය වන රැස්වීම් කැඳවීම, රැස්වීම් නියෝජනය කිරීම සඳහා එම රැස්වීම්වල තීරණ සභාපතිතුමා ප්‍රමුඛ සාමාජිකයින් වෙත ඉදිරිපත් කිරීම.

<u>ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඉඩකඩම්වලට අදාල කටයුතු ඉටුකිරීම</u>

01. ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහනගර සභා බල ප්‍රදේශයේ සංවර්ධන කටයුත්තක් වෙනුවෙන්ශ්‍රී ලංගමය හා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව සමග කොන්දේසි සහිතව අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ප්‍රකාරව රජයේ තක්සේරු වාර්තාවක් ලබාගෙන 2017/01/25 සිට 2018/01/24 දක්වා කාලයකට බදු ගිවිසුම්ගතව එළඹ ඇත.

2017/01/25 – 2018/01/24 - රු.2,260,000/-

මුදලකට අනුව ගිවිසුම් ගතව මුදාහරින ලදී. ඒ සඳහා 2017/08/14 දින චෙක්පත් අංක: 070132 දරණ ලංකා බැංකුව මඟින් අයකර ඇත.

02. ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ සංවර්ධන කටයුත්තක් වෙනුවෙන් ප්‍රමුඛතාව දෙමින් ශ්‍රී ලංගම හා කේ.ඩී.ඊබට් ඇන්ඩ් සන්ස් හෝල්ඩින්ස් (පුද්) සමාගම සමඟ ඇතිකරගත් ගිවිසුමට අනුව මාතලේ ප්‍රාදේශීය වැඩපල පිහිටි භූමියෙන් බෙදා වෙන්කල ඉඩම් කොටසේ වාහන අලුත්වැඩියාව හා භාණ්ඩ ගබඩා කිරීම සඳහා ඉදිකිරීම සම්බන්ධයෙන්,2016/03/14 – 2018/03/13 - රු.960,000/- ක මුදලකට යටත්ව මුදාහරින ලදි.

03. ශ්‍රී ලංගම හා පිටකොටුව මධ්‍යම බස්රථ සංකීර්ණයෙහි පිහිටි මගී ලැහුම්හල, ශ්‍රී ලංගම අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ප්‍රකාරව මාසික බදු කුලිය ගෙවීමේ පදනම මත මුදාහරින ලදි. ඒ අනුව,2015/12/31 සිට 2020/12/21 දක්වා එම කාලය නියමිතය.

- 2015/12/21 සිට 2017/12/20 දක්වා මසකට රු.120,000/- ක මුදලක්, එම ආයතනය (හේෂාන් කේටර්ස් (පුද්) සමාගම) මඟින් ශ්‍රී ලංගමට ගෙවීම් කටයුතු සිදුකළ අතර, සෑම මසකම ඒ සම්බන්ධ මුදල් ගෙවීම් රිසිට්පතක් මූල්‍ය අංශය මඟින් නිකුත් කර ඇත.

04. කළුතර ඩිපෝව පුළුල් කිරීම සඳහා අත්කරගෙන ඇති අක්කර 4 ක බිම් කොටස සඳහා 44 වගන්තිය යටතේ පැවරුම් සහතිකය ලබාගැනීම සඳහා 2009/08/03 දින සිට ඉල්ලීම් කර ඇති අතර, තවමත් එය ලැබී නොමැත. ඒ සම්බන්ධයෙන් සිහිකැඳවීම් ලිපිද යොමුකර ඇත.

05. කැස්බෑව ඩිපෝ ඉඩමෙන් මාර්ග සංවර්ධනය සඳහා අත්කරගෙන ඇත්තේ හෙක්ටයාර් 0.1490 ක ඉඩම් කොටසක් හා එහි පිහිටි දේපල වේ. මෙම අත්කර ගැනීමට අදාල වන්දි හිමිකම් පරීක්ෂණයට අය ඉදිරිපත් කිරීමෙන් පසු රු.46,390,375/- ක වන්දියක හිමිකමක් ශ්‍රී ලංගමට ප්‍රදානය කෙරුණි.

මෙම වන්දි මුදලින් මුලික ගෙවීම සඳහා රු.16,018,500/- ක මුදලක් චෙක්පත් අංක: 307341 ලංකා බැංකුවේ බත්තරමුල්ල ශාඛාවේ 2016/12/22 දින ශ්‍රී ලංගම සභාපතිතුමා වෙත ලබාදී ඇත. එම චෙක්පත 2017/01/17 දින ශ්‍රී ලංගම සභාපතිතුමාගේ සමාංක සහිත ලිපියක් සමඟ මුදල් අංශයට යොමුකර ඇත. ඒ සඳහා 092386 දරණ 2017/01/17 දිනැති මුදල් භාරගැනීමේ කුවිතාන්සිය ශ්‍රී ලංගම මූල්‍ය අංශය විසින් ලබාදෙන ලදි.

06. කොත්මලේ ඩිපෝ ඉඩම සම්බන්ධව අනවසර පදිංචිකරුවන්ගේ ග්‍රහණයෙන් මුදාගෙන එකී ඉඩම සඳහා වන්දි ගෙවූ බවට ලිපිලේඛන මඟින් තහවුරු කර 44 වගන්තිය යටතේ පැවරුම් සහතිකය 2016/12/19 දින සිට ඉල්ලීම් කර ඇතත්, පැවරුම් සහතිකය මේවන තෙක් ලැබී නැත. එම පැවරුම් සහතිකය රක්ෂිත මායිම් ඉවත්කර ඉතිරි ප්‍රමාණයට මුදාහැරීමට යෝජනා ඉදිරිපත් වුවද එය අවාසි සහගත බැවින් ශ්‍රී ලංගම එකඟත්වය ලැබී නැත.

07. ශ්‍රී ලංගම වෙන්නප්පුව ඩිපෝ ඉඩම සඳහා 44 වගන්තිය යටතේපැවරුම් සහතිකය 2016/10/28 දින සිට ඉල්ලීම් කර ඇතත්, මෙතෙක් ලැබී නොමැත.

08. ගම්පහ බැණ්ඩියමුල්ල ඉඩමෙන් පර්චස් 27 ක් ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය වෙත පවරාදීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ලබාගෙන එකී තීරණ පරිදි මැනුම් කර පිඹුරුපත් සකසා නාගරික සංවර්ධන අධිකාරියේ අවසර ගෙන රජයේ තක්සේරු වටිනාකම වන රු.20,250,000/- ක මුදලක් ගෙවා ඇත. ඒ සඳහා මුදල් කොට්යාශයේ අංක 088475 දරණ රිසිට්පතක් 2017/07/06 දින අප වෙත ලබාදී ඇත.

09. ශ්‍රී ලංගම ගම්පහ ඩිපෝ ඉඩමෙන් අක්කර 02 පර්චස් 38.4 ක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට පැවරීම සඳහා මැන පිඹුරුපත් සකසා ශ්‍රී ලංගම අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ප්‍රකාරව රජයේ තක්සේරු ලබාගෙන ඇත.ඒ අනුව රජයේ තක්සේරු වටිනාකම රු.432,000,000/- වන අතර, මෙය මුදාහැරීම සම්බන්ධව ප්‍රවාහන කළමනාකරණ අමාත්‍යාංශය වෙත යොමුකර ඇත.

10. කම්කරු දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි ගොඩනැගිලි ඉදිකිරීමට අවසරය ශ්‍රී ලංගම මගින් ලබාදී ඇති අතර, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ (ඉඩම් අත්පත්) තැනගේ ලිපියට අනුව මෙම ඉඩම 44 වගන්තිය යටතේ පැවරීම් සහතිකයකින් පමණක් ශ්‍රී ලංගම වෙත අත්කරගෙන ඇති බැවින් අත්පත් කරගැනීමේදි දැරූ වියදම් සහ ඉන් පසු සංවර්ධනයන් වෙතොත් එම වියදම් පමණක් ගෙවීමට තීරණය වී ඇති හෙයින් 17/1932/712/013-1 හා 2017/09/12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පිළිබඳ ප්‍රවාහන කළමනාකරණ අමාත්‍යාංශයට කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යාංශය විසින් යොමුකර ඇත.

11. බදුල්ල ඉඩම් ප්‍රතිසංස්කරණ මණ්ඩලයෙන් මිලදීගෙන ඇති අක්කර 05 ක ඉඩම් කොටස සඳහා ඔප්පු ලබාදෙන ලෙස වසර ගණනාවක සිට ඉල්ලීම් කර ඇතත් මේවනතෙක් ලබාදී නොමැත.මේපිළිබඳ නැවත සාකච්ඡාවක් පැවැත්වීමට කටයුතු යොදා ඇත. මෙම ඉඩමේ අධිකරණ අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි අක්කර 02 ක් ලබාදීම සඳහා ඉඩමේ අයිතිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සතු ඉඩමක් බවට තහවුරු කරගත හැකි ලේඛන ලබාදෙන ලෙස ඉල්ලීමක් අධිකරණ අමාත්‍යාංශය මගින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට යොමුකර ඇතත්, ඒ සම්බන්ධව පිළිතුරු ලිපියක් ලැබී නොමැත.

12. පානදුර බස් නැවතුම්පළහුමිය සම්බන්ධව පානදුර අධිකරණයේ ගොනුකර ඇති නඩු සම්බන්ධව ශ්‍රී ලංගම නීති කොට්ඨාශයට පවරා ඇත. මෙම නඩුව තවමත් අධිකරණයේ විභාග වෙමින් පවතී.

13. 2017 SEMA ආයතනය මඟින් ශ්‍රී ලංගම සම්බන්ධයෙන් අධ්‍යනය කරන ලද ශ්‍රී ලංගම වෙනුවෙන් සකස්කිරීමට නියමිත වාර්තාව සඳහා ඉන්ධනහල් 07 ඉදිකිරීමට සුදුසු බවට යෝජනා කරන ලද අතර ඒ සඳහා ශක්‍යතාවය ඇති ඩිපෝවන් තෝරා ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත.

ආරක්ෂක අංශය

1. දිවයින පුරා පිහිටි ශ්‍රී ලංගමට අයත් ආයතනයන් වෙත ආරක්ෂාව සැපයීම.

2. ශ්‍රී ලංගමට අයත් ප්‍රාදේශීය කාර්යාලයන්, ඩිපෝවන්, උප ඩිපෝවන්, ප්‍රාදේශීය වැඩපලවල් හා රියදුරු අභ්‍යාස විද්‍යාලය යන සියලුම සේවා ස්ථානයන්ට අයත්ව ඉදිරිපත් කරන ලද ලිඛිත පැමිණිලි හා මගී ජනතාව මගින් කරන ලද පැමිණිලි සම්බන්ධයෙන් විමර්ශන සිදු කිරීම.

3. දිවයින පුරා පිහිටි ශ්‍රී ලංගමට අයත් ආයතනයන් වෙත ගිනි නිවන උපකරණ සැපයීම/ අළුත්වැඩියා කිරීම/ අධීක්ෂණය කිරීම්.

4. ශ්‍රී ලංගමට අයත් නඩු ඇපකරයන් වලට මුදල් බැඳීමේදී හා ප්‍රධාන කාර්යාලය සතුව කෙරෙන මූල්‍ය කටයුතු සඳහා දෛනික වශයෙන් ආරක්ෂාව ලබාදීම.

5. ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලයේ ඇතුලු සියලුම සේවා ස්ථානයන් වල සේවක මහත්ම/ මහත්මීන් වෙත නිදහස් ගමන් බලපත්‍ර බෙදා හැරීම් කටයුතු සිදු කිරීම.

6. ශ්‍රී ලංගමට අයත් ආයතනයන්හි වැදගත් ස්ථාන හා ප්‍රභූ ආරක්ෂාව සැපයීම, රථ වාහන නැවැත්වීම, පාලනය කිරීම අදාල ආයතනයන් වෙත කරනු ලබන සියලුම සැපයීම් හා නිකුත් කිරීම් අධීක්ෂණය කිරීම.

7. ප්‍රවාහන අමාත්‍යාංශයට අයත් ආයතන වෙත එනම්, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ජාතික ගමනාගමන කොමිෂන් සභාව, ප්‍රවාහන අමාත්‍යාංශය, ජාතික වෛද්‍ය මධ්‍යස්ථානය වෙත ආරක්ෂාව සැපයීම හා එමගින් ආදායමක් ඉපැයීම.

විශේෂ විමර්ශන ඒකකය

වර්ෂය	නිම කර ඇති විමර්ශන
2017	30

2017වර්ෂය සඳහා හදිසි ඩිපෝ පරීක්ෂණ 10 ක් හා 2017වර්ෂයේ අඩක් අවසන් කරන ලද විමර්ශන ප්‍රමාණය 8ක්ද සිදුකර ඇත.

ඉංජිනේරු කොට්ඨාශය

2017 වර්ෂයේ නව බස්රථ ඩිපෝ අතර බෙදා දීම- ආඥන 44

අ.අ.	ප්‍රාදේශිකය	ඩිපෝව	බස්රථ අංකය	බස්රථ ගණන	ලබාදුන් දිනය	චැසි අංකය	එන්ජින් අංකය
1	කොළඹ	මහරගම	WP-NC-9541	4	2017/06/12	MB1PBEFA5HAGG0702	GHEZ428036
2			WP-NC-9543		2017/06/12	MB1PBEFA8HAGG0628	GTEZ439736
3			WP-NC-9544		2017/06/12	MB1PBEFA5HAGG0232	GTEZ439732
4			WP-NC-9548		2017/06/12	MB1PBEFA6HAGF6660	FDHZ433234
	එකතුව			**4**			
5	නුවරඑළිය	හැටන්	WP-NC-9513	10	2017/05/29	MB1PBEFA0HAGF7335	GYHZ420225
6			WP-NC-9514		2017/05/29	MB1PBEFA3HAGG0231	GTHZ439733
7			WP-NC-9516		2017/05/29	MB1PBEFA4HAGF9816	GTHZ436339
8			WP-NC-9517		2017/06/01	MB1PBEFA2HAGF2461	FGHZ432895
9			WP-NC-9518		2017/06/01	MB1PBEFAXHAGG0713	GYHZ420229
10			WP-NC-9522		2017/05/29	MB1PBEFA0HAGF7304	GYHZ420223
11			WP-NC-9524		2017/06/01	MB1PBEFA7HAGG0233	GTHZ439730
12			WP-NC-9527		2017/05/29	MB1PBEFA6HAGF9817	GTHZ436340
13			WP-NC-9528		2017/05/29	MB1PBEFA6HAGF9820	GTHZ436342
14			WP-NC-9529		2017/06/01	MB1PBEFA6HAGF6593	GAHZ416383
15		නුවරඑළිය	WP-NC-9549	4	2017/06/13	MB1PBEFA1GEAV5443	GAEZ413894
16			WP-NC-9545		2017/06/13	MB1PBEFAXHAGF9822	GTHZ436335
17			WP-NC-9550		2017/06/13	MB1PBEFA3HAGG0715	GHEZ428485
18			WP-NC-9553		2017/06/13	MB1PBEFA2HAGG0611	GTHZ439737
	එකතුව			**14**			

	සම්පූර්ණ එකතුව		**18**			

<u>නව එන්ජින් කට්ටල් සවිකිරීම-2017වර්ෂය</u>

ප්‍රාදේශිකය	I අදියර	II අදියර	නව එන්ජින් කට්ටල්ගණන
කොළඹ ප්‍රාදේශිකය	36	29	65
ගම්පහ ප්‍රාදේශිකය	27	17	44
කළුතර ප්‍රාදේශිකය	15	11	26
මහනුවර ප්‍රාදේශිකය	17	5	22
නුවරඑළිය ප්‍රාදේශිකය	11	1	12
සබරගමුව ප්‍රාදේශිකය	23	10	33
රජරට ප්‍රාදේශිකය	21	16	37
ඌව ප්‍රාදේශිකය	30	11	41
රුහුණ ප්‍රාදේශිකය	33	24	57
වයඹ ප්‍රාදේශිකය	36	16	52
නැගෙනහිර ප්‍රාදේශිකය	36	13	49
උතුර ප්‍රාදේශිකය	18	10	28
මධ්‍යම බස්රථ කාර්යාලය	3	0	3
අධිසුඛෝපභෝගි බස්රථ සංචාරක ප්‍රවාහන ඒකකය (SLTTS)	20	0	20
එකතුව	**326**	**163**	**489**

<u>අලුත් වැඩියා කරන ලද එන්ජින්, ගියර් පෙට්ටි සහ බස්බොඩි ප්‍රමාණය.</u>

අලුත් වැඩියා කරන ලද එන්ජින් ප්‍රමාණය 665

අලුත් වැඩියා කරන ලද ගියර් පෙට්ටි ප්‍රමාණය 827

අලුත් වැඩියා කරන ලද බස්බොඩි ප්‍රමාණය 272

නව එන්ජින් කට්ටල් 489 ක් ලබාගෙන ඇත.

අභ්‍යන්තර විගණන කොට්ඨාශය

2017 වර්ෂයේ සිදු කරන ලද ක්‍රියාකාරකම්වල සාරාංශයක්

<u>මුදල් කොට්ඨාශය</u>

1. 2017 වර්ෂයේ විගණන සැලසුම හා විගණන වැඩසටහන සකස් කිරීම.
2. මුදල් සමීක්ෂණය.
3. මුදල් පොත් පරීක්ෂාව.
4. චේතන අතිකාල පරීක්ෂාව.
5. චේතන/උත්සව අත්තිකාරම් පරීක්ෂාව.
6. කොන්දොස්තර හිඟ මුදල් පරීක්ෂාව.
7. පාරිතෝෂික ගෙවීම් පරීක්ෂාව.
8. දෛනික එකතු කිරීමේ ලේඛන පරීක්ෂාව.
9. දේශීය මිලදී ගැනීම් පරීක්ෂාව.
10. අවසාන ගිණුම් විගණනය.
11. ගිණුම් අංශයේ අනිකුත් ලේඛන පරීක්ෂාව.

<u>තොග ගබඩාව</u>

1. වාර ප්‍රවේශ පත්‍ර ලේඛන පරීක්ෂාව.
2. ගබඩා සමීක්ෂණය.
3. ඉන්ධන පරිභෝජන පරීක්ෂාව.
4. අමතර කොටස් පරිභෝජනය පරීක්ෂාව.
5. ටයර් පරිභෝජනය පරීක්ෂාව.
6. දුණු කොළ පරිභෝජනය පරීක්ෂාව.
7. අපහරණ කටයුතු.

<u>ධාවන කොට්ඨාශය</u>

1. මාර්ග ලේඛන පරීක්ෂාව.
2. අනතුරු ලේඛන පරීක්ෂාව.
3. කාර්ය චක්‍ර ලේඛන පරීක්ෂාව.
4. ධා/51, ධා/50, ධා/40, ධා/41 ලේඛන පරීක්ෂාව.

<u>ඉංජිනේරු කොට්ඨාශය</u>

1. ආපදා අළුත්වැඩියාව.
2. අමතර කොටස් පරිභෝජනය.
3. අකාලයේ අසාර්ථක වන අමතර කොටස් පරීක්ෂාව.
4. ඉංජිනේරු අංශයේ අනෙකුත් ලේඛන පරීක්ෂාව.

<u>වෙනත්</u>

1. විනය ලේඛන පරීක්ෂාව.
2. නිවාඩු ලේඛන පරීක්ෂාව.
3. මණ්ඩලීය වත්කම් පරීක්ෂාව.
4. රියදුරු අභ්‍යාස විද්‍යාලවල ආදායම්, වියදම්, නඩත්තු හා පාලන යන අංශ පරීක්ෂාවට ලක් කිරීම.
5. සංචාරක නිවාඩු නිකේතන පරීක්ෂාව.
6. ශාලිකා ශාලාව හා ක්‍රීඩාංගනය පරීක්ෂාව.
7. ප්‍රධාන කාර්යාලයේ පොදු කාර්ය වියදම් විශ්ලේෂණය. (ජලය, දුරකථන, විදුලිය, ලිපිද්‍රව්‍ය)
8. රාජ්‍ය ප්‍රතිපත්ති හා අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අනුව ක්‍රියාත්මක කරන විශේෂ ව්‍යාපෘති.
9. ප්‍රාදේශීය අභ්‍යන්තර ගිණුම් පරීක්ෂකවරුන්ගේ මාසික සාකච්ඡා පැවැත්වීම.
10. ත්‍රෛමාසිකව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම.
11. සභාපතිතුමා විසින් යොමු කරන විශේෂ පරීක්ෂණ.
12. ප්‍රාදේශීය ඒකෙවල වාර්ෂික විගණන සාකච්ඡා පැවැත්වීම.

මානව සම්පත් කළමනාකරණ කොට්ඨාශය

මාසිකව රුපියල් 30,000/- දීමනාවක් යටතේ හුදෙක් කොන්ත්‍රාත් පදනම මත මාස 06 කාලය සඳහා රියදුරු/කොන්දොස්තරනව පත්වීම් ලබාදීම.

පත්වීමේ ස්වභාවය	සංඛ්‍යාව
කොන්ත්‍රාත් රියදුරු	346
කොන්ත්‍රාත්කොන්දොස්තර	442
එකතුව	788

විධායක ශ්‍රේණියේ පත්වීම් පිළිබඳ විස්තරය

පත්වීමේ ස්වභාවය	සංඛ්‍යාව
ස්ථිර පත්වීම්	35
ආවරණ පත්වීම්/කාර්යය පැවරුම්	49
උසස්වීම්	50
ආවරණ පත්වීම් ස්ථිර කිරීම	-
ස්ථාන මාරුවීම්	47
කොන්ත්‍රාත් පත්වීම්	-
නව බඳවා ගැනීම්	01
එකතුව	182

නැවත පත්වීම් ලබාදීම

පත්වීමේ ස්වභාවය	සංඛ්‍යාව
නැවත පත්වීම්	37
එකතුව	37

ප්‍රායෝගික පුහුණුව ලබාදීම

පත්වීමේ ස්වභාවය	සංඛ්‍යාව
පරිගණක අංශයේ පුහුණු	26
ගිණුම් අංශයේ පුහුණු	05
කාර්මික අංශයේ පුහුණු	18
එකතුව	49

විධායක නොවන ස්ථාන මාරුවීම්

ස්වභාවය	සංඛ්‍යාව
ස්ථාන මාරුවීම්	314
එකතුව	314

විනය අංශය

විනය ලිපිගොනු විස්තරය

ස්වභාවය	සංඛ්‍යාව
අවසන් කරන ලද විනය ලිපිගොනු	2,694
අවසන් කරන ලද අභියාචනා ලිපිගොනු	332
එකතුව	3,026

ජංගම පරීක්ෂණ අංශය

2017 වර්ෂය තුල ජංගම පරීක්ෂණ ප්‍රගති වාර්තාව (දිවයින පුරා)

මාසය	කණ්ඩායම් ගණන	පරීක්ෂණ වාර ගණන	පරීක්ෂා කළ බස්රථ සංඛ්‍යාව	බරපතල විෂමාචාර (iv)	සුළු විෂමාචාර (v)	දඩ ගෙවූ මගින් ගණන	අයකරගත් දඩ මුදල රු:
ජනවාරි	51	725	9,154	68	195	306	113,162.00
පෙබරවාරි	47	612	8,889	59	198	311	115,583.00
මාර්තු	45	658	8,318	58	182	260	91,662.00
අප්‍රේල්	51	711	9,579	61	260	461	153,672.00
මැයි	44	868	8,783	58	187	287	102,095.00
ජූනි	46	600	8,602	86	233	302	112,629.00
ජූලි	42	645	8,548	92	169	315	117,064.00
අගෝස්තු	42	629	9,122	77	175	348	125,330.00
සැප්තැම්බර්	44	603	7,729	76	151	291	102,245.00
ඔක්තෝම්බර්	46	620	8,523	90	180	277	100,826.00
නොවැම්බර්	39	469	6,392	62	146	220	78,832.00
දෙසැම්බර්	34	430	5,135	64	117	158	60,466.00
එකතුව	**531**	**7,570**	**98,774**	**852**	**2,193**	**3,536**	**1,273,566.00**

2017වර්ෂය තුල ජංගම පරීක්ෂණ ප්‍රගති වාර්තාව (ප්‍රධාන කාර්යාලය)

මාසය	කණ්ඩායම් ගණන	පරීක්ෂණ වාර ගණන	පරීක්ෂා කළ බස්රථ සංඛ්‍යාව	බරපතල විෂමාචාර (iv)	සුළු විෂමාචාර (v)	දඩ ගෙවූ මගින් ගණන	අයකරගත් දඩ මුදල රු:
ජනවාරි	06	89	1,305	24	34	50	17,454.00
පෙබරවාරි	05	68	1,021	20	23	37	14,196.00
මාර්තු	05	52	814	14	15	40	14,900.00
අප්‍රේල්	04	67	1,150	16	13	41	14,043.00
මැයි	04	60	783	15	10	27	10,412.00
ජූනි	04	70	979	23	18	39	18,822.00
ජූලි	04	61	936	38	16	40	13,782.00
අගෝස්තු	04	65	960	33	15	48	18,548.00
සැප්තැම්බර්	04	59	838	26	10	38	14,772.00
ඔක්තෝම්බර්	04	67	878	31	07	18	6,624.00
නොවැම්බර්	04	50	715	19	08	24	9,402.00
දෙසැම්බර්	04	51	690	17	03	16	6,660.00
එකතුව	**52**	**759**	**11,069**	**276**	**172**	**418**	**159,615.00**

සැලසුම් හා සංවර්ධන අංශය

සැලසුම් සංවර්ධන අංශයේක්‍රියාකාරී සැලසුම				
යෝජිතක්‍රියාකාරකම	භෞතික ඉලක්කය			
	කාර්තුව			
	1	2	3	4
2018 වර්ෂය සඳහා සංවර්ධන හා ක්‍රියාකාරී සැලසුම් සැකසීම	සකස්කර ඉදිරිපත් කර ඇත.			
2017 වර්ෂයේ ජනවාරි මාසය සඳහා ප්‍රගති වාර්තා සැකසීම	සකස්කර ඉදිරිපත් කර ඇත.			
2017 වර්ෂයේ පෙබරවාරි මාසය සඳහා ප්‍රගති වාර්තා සැකසීම	සකස්කර ඉදිරිපත් කර ඇත.			
2017 වර්ෂයේ මාර්තු මාසය සඳහා ප්‍රගති වාර්තා සැකසීම	සකස්කර ඉදිරිපත් කර ඇත.			
2017 වර්ෂයේ අප්‍රේල් මාසය සඳහා ප්‍රගති වාර්තා සැකසීම	සකස්කර ඉදිරිපත් කර ඇත.			
2017 වර්ෂයේ මැයි මාසය සඳහා ප්‍රගති වාර්තා සැකසීම	සකස්කර ඉදිරිපත් කර ඇත.			
2017 වර්ෂයේ ජුනි මාසය සඳහා ප්‍රගති වාර්තා සැකසීම	සකස්කර ඉදිරිපත් කර ඇත.			
2017 වර්ෂයේ ජූලි මාසය සඳහා ප්‍රගති වාර්තා සැකසීම	සකස්කර ඉදිරිපත් කර ඇත.			
2017 වර්ෂයේ අගෝස්තු මාසය සඳහා ප්‍රගති වාර්තා සැකසීම	සකස්කර ඉදිරිපත් කර ඇත.			
2017 වර්ෂයේ සැප්තැම්බර් මාසය සඳහා ප්‍රගති වාර්තා සැකසීම	සකස්කර ඉදිරිපත් කර ඇත.			
2017 වර්ෂයේ ඔක්තෝම්බර් මාසය සඳහා ප්‍රගති වාර්තා සැකසීම	සකස්කර ඉදිරිපත් කර ඇත.			
2017 වර්ෂයේ නොවැම්බර් මාසය සඳහා ප්‍රගති වාර්තා සැකසීම	සකස්කර ඉදිරිපත්කර ඇත.			
2017 වර්ෂයේ දෙසැම්බර් මාසය සඳහා ප්‍රගති වාර්තා සැකසීම	සකස්කර ඉදිරිපත් කර ඇත.			
2018 - 2021 වර්ෂය සඳහා සංයුක්ත සැලසුම සැකසීම	සකස්කර ඉදිරිපත් කර ඇත.			
මණ්ඩලයට අදාල සියළු සංඛ්‍යාත්මක තොරතුරු රැස්කිරීමහා යාවත්කාලීන කිරීම.	වර්ෂය පුරාවට සකස්කර ඉදිරිපත් කර ඇත.			
මාසිකව ලාභාලාභ වාර්තාව හා මුදල් ප්‍රවාහ වාර්තාසැකසීම (ප්‍රාදේශීය වැඩපොළ/ රියදුරු පුහුණු පාසැල්/ සංචාරක බංගලා ඇතුළුව)	වර්ෂය පුරාවට සකස්කර ඉදිරිපත් කර ඇත.			
ප්‍රාදේශීය වැඩපොළ, රියදුරු පුහුණු පාසැල්, සංචාරක බංගලා පිළිබඳ ප්‍රගති වාර්තා සැකසීම.	වර්ෂය පුරාවට සකස්කර ඉදිරිපත් කර ඇත.			
විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව සැකසීම හාඉදිරිපත් කිරීම.	වර්ෂය පුරාවට සකස්කර ඉදිරිපත් කර ඇත.			
ප්‍රවාහන අමාත්‍යාංශය හා වෙනත් රාජ්‍ය ආයතන සඳහාඉල්ලා සිටින විශේෂවාර්තා සකසා යැවීම.	වර්ෂය පුරාවට සකස්කර ඉදිරිපත් කර ඇත.			

ටෙන්ඩර් මණ්ඩලය

2017/01/01 සිට ටෙන්ඩර් මණ්ඩලය මගින් පහත සඳහන් ක්‍රියාකාරකම් වලට කැඳවූ මිල ගණන් වල සාරාංශය

අනු අංකය	දිනය	කරන ලද කාර්යය	කාර්යය අංකය	ටෙන්ඩරය විවෘත කළ දිනය
01	2017-01-19	ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලයේ භාවිතයෙන් ඉවත් කරන ලද ටෝනර් විකිණීම	ශ්‍රීලංගම/ටෙ.ම/නෙර්/Scrap/(2017)	2017-01-27
02	2017-01-19	ශ්‍රී ලංගම නීති කොට්ඨාශයට අයත් පරිගණක කාර්යාලයේ ඇලුමිනියම් වහලයක් සවිකිරීම.	SLTB/TS/Civil/2017/02	2017-02-06
03	2017-01-19	ශ්‍රී ලංගම ප්‍රධාන විධායක නිලධාරී කාර්යාලයට අයත් කාර්යය මණ්ඩල කාර්යාලයේ ඇලුමිනියම් පාර්ටිෂන් දොරවල් සවි කිරීම.	SLTB/TS/Civil/2017/03	2017-02-06
04	2017-01-19	තලංගම ඩිපෝවේ ඉංජිනේරු ගරාජයේ වහල අළුත්වැඩියා කිරීම.	SLTB/TS/Civil/2017/04	2017-02-06
05	2017-01-19	මාවනැල්ල ඩිපෝවේ යෝජිත වැසිකිළි ඉදිකර ගැනීම.	SLTB/TS/Civil/2017/05	2017-02-07
06	2017-01-19	New Insurance coverage for year - 2017 (01)	SLTB/TS/GEN/25/2017	2017-01-24
07	2017-01-24	ශ්‍රී ලංගම සඳහා පහසු ගෙවීමේ පදනම මත ආසන (50-54) අධි සුඛෝපභෝගී බස්රථ 08 ක් මිලදී ගැනීම.	SLTB/TS/GEN/2017/65	2017-02-14
08	2017-01-24	ශ්‍රී ලංගම සඳහා ආසන (42 – 45) දුර ගමන් සේවා බස්රථ 20 ක් පහසු ගෙවීමේ පදනම මත මිලදී ගැනීම.	SLTB/TS/GEN/2017/65-I	2017-02-15
09	2017-01-31	Bid for the 125 Nos. of computers, UPS Machines & 60 Nos. Printers to SLTB.	SLTB/TS/GEN/2017/74-I	2017-02-14
10	2017-01-31	ශ්‍රී ලංගම වෙත මාසික කුළී ගෙවීමේ පදනම මත වාහන ලබාගැනීම සඳහා මිල ගණන් කැඳවීම.	SLTB/TS/GEN/2017/96-II	2017-02-22
11	2017-02-03	New Insurance Coverage for year 2017 (02)	SLTB/TS/GEN/25 II/2017	2017-02-13
12	2017-02-03	Additional details for the supply, Delivery & Installation of 110 Nos. Finger print Machines for SLTB depots.	SLTB/TS/GEN/52/2016	2017-02-13
13	2017-02-09	Quotation for the supply of HP Scan Jet Scanner for Secretariat Division.	SLTB/TS/GEN/99/2017	2017-02-23
14	2017-02-13	ශ්‍රී ලංගම සඳහා ආසන 32-35 නව කුඩා බස්රථ 250 ක් මිලදී ගැනීම.	MT/04/09/CT/430	2017-03-23
15	2017-02-13	Bid for the obtaining of new insurance coverage for Orugodawatte fuel filling station	SLTB/TS/GEN/25/Orugodawatta/FS/2017	2017-02-21
16	2017-02-21	Quotation for supply of ID card printing materials for SLTB	SLTB/TS/GEN05/2017	2017-03-06
17	2017-02-21	ශ්‍රී ලංගම අශෝක් ලේලන්ඩ් සහ ටාටා බස්රථ මාදිලි සඳහා සිලින්ඩර් බ්ලොක් හා සිලින්ඩර් හෙඩ් මිලදී ගැනීම.	SLTB/TS/GEN/2017/02-01	2017-03-10
18	2017-02-21	ශ්‍රී ලංගම සඳහා ඡායා පිටපත් යන්ත්‍ර සහ ෆැක්ස් යන්ත්‍ර මිලදී ගැනීම හා සැපයීම.	SLTB/TS/GEN/Photocopy & Fax Machine/107/2017	2017-03-07
19	2017-02-21	ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලයේ ඡායා පිටපත් යන්ත්‍ර අළුත්වැඩියා කරගැනීම සඳහා මිල ගණන් කැඳවීම	SLTB/TS/Photocopy Machine Repairs/2017	2017-02-27
20	2017-03-03	Bid for the supply & Installation of Local Area Network	SLTB/TS/GEN/74-III/2017	2017-03-22
21	2017-03-06	ශ්‍රී ලංගම අම්පාර ටයර් කම්හලේ බහින් කුඩු විකිනීම සඳහා මිල ගණන් කැඳවීම.	SLTB/TS/GEN/93	2017-03-20
22	2017-03-06	Quotation for the supply & Delivery of Stationary Items for SLTB	SLTB/TS/GEN/2017/19	2017-03-27
23	2017-03-17	ශ්‍රී ලංගම දුර ගමන් සේවා බස්රථ සඳහා ආසන වෙන්කරවා ගැනීම (Online Seat Reservation) මිල ගණන් කැඳවීම.	SLTB/TS/GEN/2017/100	2017-04-20
24	2017-04-11	ශ්‍රී ලංගම බස්රථ සඳහා නව බැටරි මිලදී ගැනීම	SLTB/TS/GEN/28/2017	2017-05-03
25	2017-04-20	අශෝක් ලේලන්ඩ් හිනෝ එන්ජින් සඳහා පූර්ණ අලුත්වැඩියා කටයුතු සේවා සැපයීම.	SLTB/TS/GEN/2017/55	2017-05-03
26	2017-04-20	වයඹ, ඌව, රජරට, නැගෙනහිර, මහනුවර සහ නුවරඑළිය ප්‍රාදේශික වෙත ආරක්ෂක සේවාවන් ලබාගැනීම.	SLTB/TS/GEN/PS/2017/01	2017-05-15
27	2017-04-24	යූ-ටෝන්ග් බස්රථ සඳහා අවශ්‍ය නව ටයර් 600 ක් සැපයීම හා ප්‍රවාහනය කිරීම.	SLTB/TS/GEN/2017/65	2017-05-16
28	2017-05-05	ප්‍රධාන කාර්යාලයේ ආපන ශාලාව පවත්වාගෙන යාම සඳහා ටෙන්ඩර්පත් කැඳවීම	SLTB/TS/Canteen/2017	2017-05-29

29	2017-05-23	ශ්‍රී ලංගම බස්රථ සඳහා නව ටයර් කට්ටල 33672 ක් සැපයීම හා ප්‍රවාහනය	MT/04/09/CT/434	2017-06-20
30	2017-05-23	ශ්‍රී ලංගම බස්රථ සඳහා ලිහිසි තෙල් මිලදී ගැනීම	MT/04/09/CT/435	2017-06-21
31	2017-05-23	2017 වර්ෂය සඳහා ටයර් නැවත පිරවීම සහ පෙරසවි කිරීම.	MT/04/09/CT/436	2017-06-22
32	2017-05-30	Repairing of Engineering office building for pool vehicle unit at Meethotamulla Depot	SLTB/TS/Civil/2017/16-VI	2017-06-09
33	2017-06-02	Repairs & Maintenance of main building and yard at Aralaganwila bus stand	SLTB/TS/GEN/2017/16-VII	2017-06-16
34	2017-06-02	Supply and Delivery of tools & machinery	SLTB/TS/GEN/2017/55-I	2017-06-23
35	2017-06-02	Supply and Delivery of 90,000 meters of rexine	SLTB/TS/GEN/2017/28	2017-06-27
36	2017-06-12	ශ්‍රී ලංගම රියදුරු අභ්‍යාස විද්‍යාලය සඳහා යතුරුපැදි 24 ක් මිලදී ගැනීම.	SLTB/TS/GEN/39/2017	2017-06-21
37	2017-07-07	Quotation for the supply & Delivery of Identity card printing Row Materials for SLTB	SLTB/TS/GEN/26/2017	2017-07-24
38	2017-07-07	Quotation for the supply of Server Machine for Finger print Machines to SLTB	SLTB/TS/GEN/2017/74	2017-07-05
39	2017-07-07	ශ්‍රී ලංගම ඩිපෝවන්වල භාවිතා කරනු ලබන GPRS ටිකට් යන්ත්‍ර සඳහා අවශ්‍ය (තර්මල් කඩදාසි) ටිකට්රෝල් සැපයීම සහ ප්‍රවාහනය කිරීම	SLTB/TS/GEN/2017/36-2	2017-07-24
40	2017-07-07	ප්‍රධාන කාර්යාලීය ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා ටෙන්ඩර්පත් කැඳවීම.	SLTB/TS/CANTEEN/2017	2017-07-25
41	2017-07-07	Paint requirements, for the year 2017	SLTB/TS/GEN/2017/04	2017-07-26
42	2017-07-17	Quotation for the procuring of Spare Parts for Engine Overhauling	SLTB/TS/GEN/2017/02	2017-07-20
43	2017-07-17	Quotation for the Repairing damaged Boundary wall and Anderson Plats side at Shilika Ground	SLTB/TS/CIVI/2017/16-VIII	2017
44	2017-07-17	253-3596 කැබ් රථයේ A/C පද්ධතිය අළුත්වැඩියා කිරීම (රජරට ප්‍රාදේශිකය)	SLTB/TS/GEN/2017/95	2017-08-08
45	2017-07-18	ශ්‍රී ලංගම වෙත මාසික කුලී ගෙවීමේ පදනම මත වාහන ලබාගැනීම සඳහා මිල ගණන් කැඳවීම.	SLTB/TS/GEN/2017/96-III	2017-08-09
46	2017-08-01	Quotation for the main gate (With Coloumns) paving interlock stones at entrance way Katharagama Circuit Bunglow – Katharagama2017-08-15	SLTB/TS/CIVIL/2017/16/IV	2017-08-15
47	2017-08-01	Quotation for the construction of Entrance Road way at Elpitiya Depot	SLTB/TS/CIVIL/2017/16/X	2017-08-15
48	2017-08-16	Quotation for the supply & Delivery of printers for supply division & Udahamulla Depot	SLTB/TS/GEN/2017/74-III	2017-09-04
49	2017-08-21	Construction of Septic Tank for Aluthgama Depot	SLTB/TS/GEN/16/XI	2017-09-17
50	2017-08-21	Proposed new toilet unit for north Western province in Wennappuwa Depot	SLTB/TS/GEN/16/XII	2017-09-07
51	2017-09-04	ශ්‍රී ලංගම අධිවේගී මාර්ග සඳහා අවශ්‍ය නව ටයර් සහ ටයර් කිට් මිලදී ගැනීම - (648ක්)	SLTB/TS/GEN/65-I/2017	2017-09-19
52	2017-09-04	කිරිඳිවැල බස් නැවතුම්පළ විවෘත කිරීම.	SLTB/TS/GEN/2017/DIGITAL NAVE BOARD/101	2017-09-20
53	2017-09-27	Alteration and Renovation to lavatory blocks & septic tank in Kirindiwela Depot/Alteration and renovation to lavatory blocks & septic tank of Engineering Section in Kirindiwela Depot	SLTB/TS/GEN/2017/16/XI	2017-10-11
54	2017-09-27	Repairing of work shop roof (without Valance & gutter) at Udugama Depot	SLTB/TS/CIVIL/2017/16/X-II	2017-10-11
55	2017-09-28	කොළඹ නගර ප්‍රාදේශීය තුල පහත පා පුවරුව සහිත බස්රථ යෙදවීමට ටෙන්ඩර් කැඳවීම	SLTB/TS/GEN/2017/102	2017-10-12
56	2017-10-10	bid for the obtaining of new Insurance Coverage for Rathmalana Fuel filling Station	SLTB/TS/GEN/25/Rathmalana/ FS/ 2017	2017-10-24
57	2017-10-12	සබරගමුව ප්‍රාදේශීය කාර්යාලය වරකාපොල උප ඩිපෝවේ ස්ථාපිත කිරීම.	SLTB/TS/Civil/16/17	2017-11-06
58	2017-10-12	තලංගම ඩිපෝවේ ඉංජිනේරු ගරාජයේ වහළ අළුත්වැඩියා කිරීම.	SLTB/TS/Civil/16/15	2017-11-06
59	2017-10-12	ශ්‍රී ලංගම ප්‍රාදේශීය කාර්යාල පරිශ්‍රයේ ගොඩනැගිලිවල පිටත බිත්ති පින්තාරු කිරීම.	SLTB/TS/Civil/16/16	2017-11-06
60	2017-10-16	හොරණ ඩිපෝවේ වැසිකිළි පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම.	SLTB/TS/Civil/2017/16-XIII	2017-11-06

61	2017-10-16	තෙල්දෙණිය ඩිපෝවේ ඉංජිනේරු කාර්යාලය අළුත්වැඩියා කරගැනීම.	SLTB/TS/Civil/2017/16-XIV	2017-11-06
62	2017-10-24	Supply & Delivery of Break Spray, Battery spray & Oil Seals to SLTB	MT/04/09/MT/485	
63	2017-10-24	Supply & Delivery of fuel Injection Pump Spares	MT/04/09/MT/484	
64	2017-11-02	2017/ 2018 වර්ෂයට ශ්‍රී ලංගම බස්රථ සඳහා අවශ්‍ය ටියුබ් හා කාර්පට් මිලදී ගැනීම.	SLTB/TS/GEN/79/2017	2017-11-22
65	2017-11-02	Quotation for the supply & Delivery of ID Card printing Machines for SLTB	SLTB/TS/GEN/05/2017	2017-11-06
66	2017-11-02	Dot Matrix Printers 50 ක් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.	SLTB/TS/GEN/2017/74-IV	2017-11-20
67	2017-11-02	රෝල බෙයාරින්, බෝල් බෙයාරින් සහ නීඩ්ල් බෙයාරින් මිලදී ගැනීම.	SLTB/TS/GEN/2017/02/II	2017-11-23
68	2017-11-09	Quotation for the supply and delivery of ID card printing Raw materials for SLTB	SLTB/TS/GEN/26/2017/II	2017-11-21
69	2017-11-09	භාණ්ඩ නිකුත් කිරීමේ වවුවර්පත් S-06 සහ භාණ්ඩ භාර ගැනීමේ වවුවර්පත් S-05 සඳහා මිල ගණන් කැඳවීම	SLTB/TS/GEN/05 (I),(II)/2017	2017-11-30
70	2017-11-15	Quotation for the supply & Delivery of color printers for chairman office	SLTB/TS/GEN/2017/74-V	2017-11-29
71	2017-11-15	Quotation for the supply & Delivery Multimedia Projector for D.T.S. Pothuhara	SLTB/TS/GEN/2017/10	2017-12-04
72	2017-11-15	නිල වාහන රියදුරු මහතුන් සඳහා 2018 වර්ෂය වෙනුවෙන් නිල ඇඳුම් ලබාදීම.	SLTB/TS/Gen/Drivers Uniform/2017	2017-12-05
73	2017-12-11	Repairing of Damaged Roof & Rainwater Guttersof the Engineering Section at Ja-Ela Depot	SLTB/TS/Civil/2017/16-XVII	2017-12-18
74	2017-12-11	Demolishing works at Orugodawatta Fuel Station	SLTB/TS/Civil/2017/16-XVIII	2017-12-18
75	2017-12-18	Quotation for the supply & Delivery of MS office 2016 software package for SLTB	SLTB/TS/GEN/103/2017	2017-12-22

තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ කොට්ඨාශය

2017 වර්ෂයේ දී ක්‍රියාකාරකම්
1. පරිගණක 150 ක් ඩිපෝ සඳහා ලබා දීම.
2. මුද්‍රණ යන්ත්‍ර 150 ක් ඩිපෝ සඳහා ලබා දීම.
3. UPS යන්ත්‍ර 150 ක් ඩිපෝ සඳහා ලබා දීම.
4. LAN ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම.
5. ඇඟිලි සලකුණු යන්ත්‍ර ඩිපෝ සඳහා ලබා දීම.

සම්පාදක අංශය

සම්පාදක අංශය **2017.01.01** දින සිට **2017.12.31** වැනිදිනට ප්‍රගතිය						
අනු අංකය	විෂයක්ෂේත්‍රය	ව්‍යාපෘතියේනම	**2017**වර්ෂයසඳහා වෙන් කරන ලද මුදල (රු.මී)	මූල්‍යප්‍රගතිය	නිමවුම්ඉලක්කය	**භෞතිකප්‍රගතිය (2017.03.31 දිනට)**
01	**සියළු මිළදී ගැනීම් හා විකිණීම් සිදු කිරීම.**	**මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය ද්‍රව්‍යමිලට ගැනීම.**	1000	-	කුඩාබස්රථ 250 ක් මිළදී ගැනීම.	මූලිකතාක්ෂණ ඇගයීම් කමිටු වාර්තාව ඉදිරිපත්කල අතර CAPC පිළිගෙන ඇත.මෙම වර්ෂය සඳහානියමිත ප්‍රසම්පාදන නොමැති බැවින් මෙම කටයුතු නවතා ඇත.2018 අයවැය සඳහා මෙමයෝජනාව නැවත ඉදිරිපත් කර භාණ්ඩාගාරයේ නිර්දේශය ලබාගෙන ඇත.
02			4500	-	ආසන 40-46 කුඩා බස්රථ 900 ක් මිළදී ගැනීම.	මෙම බස්රථ මිලදීගැනීම සඳහා කැබිනට් අනුමැතය ලැබී තිබූ අතර තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් ලංසුලේඛණ සකසා ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කර ඇත.එසේ වුවද ඉන්දියානු ණය ආධාරක්‍රමය යටතේ මෙම මුදල් ලබා දීමට නොහැකි බව දන්වා ඇත.2018 අයවැය වාර්තාව සඳහානැවත යෝජනාවක් ලෙස ඉදිරිපත් කර ඇත.
03			100	99.54	ආසන 40-45 බස්රථ 20 ක් මිළදී ගැනීම.	2017 වර්ෂයේ බස්රථ 18 ක් මිලදීගෙන ඇත.
04			100		අධිසුඛෝපභෝගී බස්රථ 08 ක් මිළදී ගැනීම.	තෝරාගත්සැපයුම්කරුවන් විසින් නියමිත ප්‍රමිතියට අදාලව කටයුතු සිදු නොවී බැවින් මෙමව්‍යාපෘතිය ආරම්භ කිරීම නවතා ඇත.
05			2400		පතුලපහත් බස්රථ 100 මිළදී ගැනිම	2017 අයවැයතුලින් මුදල් වෙන් කර නොමැත
06			216	25.02	රියදුරු අභ්‍යාස විද්‍යාල සඳහා වෑන් රථ 24 ක්මිලදී ගැනීම	2017 වර්ෂයේ වෑන් රථ 07 ක් මිලදීගෙන ඇත.
07			20.40		සිමියුලේටර් 24 ක් මිලදි ගැනිම	මහා භාණ්ඩාගාරයේඅනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.
08			157.78		බස් රථ ඇණියපවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ඔයිල්හා ග්‍රීස්මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම	2017 වර්ෂයතුළින් මුල්‍ය ප්‍රතිපාදන වෙන් කර නොමැත. අනුමත සැපයුම්කරුවන් විසින් ඩිපෝමට්ටමින් මුදල් වැයකර මිලදී ගැනීම සිදු කරනු ලබයි.

09			14355.45		ඩිසල්ලිටර් 151,110,000 මිළදී ගැනීම.	වෙළඳපොළමිළ ගණන් අනුව ඩිපෝ මට්ටමින් තම අවශ්‍යතාවයන් මිලදී ගැනීම සිදු කරයි.
10	**සියළු මිළදී ගැනීම් හා විකිණීම් සිදු කිරීම.**	**මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය ද්‍රව්‍ය මිලට ගැනීම.**	1032	-	බස් රථ නඩත්තුව , අලුත්වැඩියාව සහ කට්ටල් නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමතර කොටස් මිළදී ගැනීමට කටයුතුසිදුකිරීම.	ඩබ්-08, ඩබ්-23, ඩබ්-21, ඩබ්-22, ඩබ්-36 සහ ඩබ්-10 මිළ ගණන් අනුමත කර ප්‍රාදේශිකයන් වෙත යවා ඇත.ඩබ්-05 යටතේ අමතර කොටස් මිළදී ගැනීමට අමාත්‍ය මණ්ඩලප්‍රසම්පාදන කමිටුව වෙත යොමුකර එම අනුමැතිය මත දැනට අමතර කොටස් මිළදී ගැනීම සිදු කරනු ලබයි.
11			161.03	-	බස්රථ නඩත්තුව සහඅළුත්වැඩියාව සඳහා අවශ්‍ය දුණුකොළ, මිළදී ගැනීමට අවශ්‍ය කටයුතු සැලසීම.	අවශ්‍යතාවය අනුව අනුමත ආයතනයවෙතින් ඩිපෝ මට්ටමින් මිළදීගැනීමට උපදෙස් දී ඇත.
12			1063.41	-	බස්රථඇණියපවත්වාගෙන යාමට අවශ්‍ය ටයර් පිරවීමසහ පෙරසවි කිරීම සඳහා අවශ්‍ය කටයුතු සැලසීම.	අවශ්‍යතාවය අනුවඅනුමත ආයතනය වෙතින් ඩිපෝ මට්ටමින් ටයර් පිරවීම සහ පෙරසවි කර ගැනීමට උපදෙස් ලබාදීඇත.
13			44.43		අවශ්‍යපරිදි ටිකට් රෝල් සහ ටිකට් පොත් මිළදී ගැනීම.	අවශ්‍යතාවයඅනුව අනුමත ආයතනය වෙතින් ඩිපෝ මට්ටමින් මිළදීගැනීමට උපදෙස් ලබාදී ඇත.
14			0.81		අවශ්‍යතා පරිදිවාර ප්‍රවේශපත්‍ර මුද්‍රණයකර සැපයීම.	අවශ්‍යතාවයපරිදි වාර ප්‍රවේශපත්‍ර ලබා ගෙන ඩිපෝ සඳහා නිකුත් කර ඇත.
15			0.81		ශ්‍රීලංගම මෙහෙයුම්/පාලන කටයුතු සඳහා අවශ්‍ය කාර්යාලීය උපකරණ සහ ලිපි ද්‍රව්‍යමිළදීගෙන සැපයීම.	අවශ්‍යතාවය පරිදි ලබාදීමට අවශ්‍යකටයුතු සිදුකර ඇත.
16			61.73	2.24	ශ්‍රීලංගම ගොඩනැගිලි වල සහ අංගන වල විදුලි නඩත්තු සහ නව ව්‍යාපෘති සඳහා අවශ්‍යද්‍රව්‍ය මිළදීගෙන සැපයීම.	අවශ්‍යතාවය පරිදි අංගනවල සහ නවව්‍යාපෘති සඳහා මිලියන 0.48 ක මුදලක් ප්‍රධාන කාර්යාලය මගින් වැය කොට විදුලිනඩත්තු සිදු කර ඇත.

17			12	9.63	අවශ්‍යතාවයපරිදි පරිඝණක සහ UPS 100 ක් මිළදී ගැනීම.	UPS 100 ක් සහ පරිගණක යන්ත්‍ර 100 ක් මිලදිගෙන ඩිපෝ සඳහා ලබා දී ඇත.
18			10	0.59	අවශ්‍යතාවයපරිදි ඇඟිලි සලකුණු යන්ත්‍ර 100 ක් මිළදී ගැනීම.	දෙවනඅදියර වනවිට ඇඟිලි සලකුණු යන්ත්‍ර 16 ක් ලැබී ඇත.
19			මණ්ඩලය මගින් මුදල් වෙන්කිරීමක් සිදුකර නොමැත.	339.66	අබලි බස්රථ සහභාවිතයෙන් ඉවතලන අබලි ද්‍රව්‍ය ඇතුළු අභාවිත අමතර කොටස් ටෙන්ඩර් මගින් සහප්‍රසිද්ධ වෙන්දේසි මගින් ක්‍රමාණුකූලව විකිණීම.	2017-12-31 වනදිනට අබලි ද්‍රව්‍ය විකුණා රු.339,663,925.00 මුදලක ආදායමක් ලබාගෙන ඇත.

පුහුණු, පර්යේෂණ හා සංවර්ධන කොට්ඨාශය

2017 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා සිදුකළ පුහුණු කටයුතු පිළිබඳ විස්තර

2017 ජනවාරි මස සිට 2017 දෙසැම්බර් මස දක්වා ශ්‍රීලංගම පුහුණු, පර්යේෂණ හා සංවර්ධන කොට්ඨාශය මගින් සිදු කළ පුහුණු වැඩමුළු පිළිබඳ විස්තර පහත දැක්වේ.

අනු අංකය	කාර්ය පුහුණු වැඩසටහන	ඉටු කල ප්‍රමාණය	පිරිවැය
01	මගී ප්‍රවාහන රියදුරු බලපත්‍ර පුහුණු කිරීමේ පුහුණු වැඩ සටහන්	3331	රු.2,671,504.03
02	ඉහළ කළමනාකාරිත්වය සඳහා ඉංග්‍රීසි පාඨමාලාව	20	රු.1,125,00.00
03	කම්කරු නීති සහ කාර්මික ආරවුල් පිළිබඳ පුහුණු වැඩසටහන් (වැඩමුළු 04)	334	රු.2,217,62.00
04	Microsoft Excel – Advanced Analysis Tools Adams Skills Development center	07	රු. 112,000.00
05	ප්‍රවාහන කළමනාකරණ උසස් පාඨමාලාව	04	රු. 180,000.00
06	පරිගණක සාක්ෂරතා හා ව්‍යාපාර කළමනාකරණ පාඨමාලාව (1 අදියර)	1502	රු.11,265,000.00
07	බැහැර ගත පුහුණු වැඩසටහන (වැඩ සටහන් 02)	165	රු.1,633,500.00
08	රිය අනතුරු අවම කිරීම පිළිබඳ පුහුණු වැඩ සටහන් (1 -අදියර)	105	රු.22,992.00

නීති කොටියාශය

1. ශ්‍රීලංගමට අයත් ප්‍රාදේශිය කාර්යාල හා සියලුම ඩිපෝවලට එරෙහිව බාහිර පාර්ශවයන් විසින් පවරනු ලබන හා ශ්‍රී ලංගම විසින් අනෙකුත් පාර්ශවයන්ට එරෙහිව පවරනු ලබන සියලුම නඩු සඳහා දිවයින පුරා පිහිටි සියලුම අධිකරණවල පවතින නඩු සම්බන්ධව කටයුතු මෙහෙයවීම.

   මේ යටතේ

   i ශ්‍රී ලංගම නඩු සඳහා නීති නිලධාරීන් හැකි සෑම අවස්ථාවකදීම එම අධිකරණවල පෙනී සිටීම. (විශේෂයෙන් ශ්‍රී ලංගම සභාපතිතුමා අධ්‍යක්ෂක මණ්ඩලයට එරෙහිව පවරා ඇති නඩු සඳහා පෙනී සිටීම.)

   ii නඩුවලට අදාල අධිකරණමය ලේඛන සැකසීම.

   iii ඩිපෝ හා ප්‍රාදේශිය කාර්යාලවල සිටින උසාවි නිලධාරීන් සඳහා අවශ්‍ය නීති උපදෙස් ලබාදීම.

   iv එම නිලධාරීන් සමග බාහිර නීතිඥ මහතුන් හා නීතිපති දෙපාර්තමේන්තුවේ රජයේ නීතිඥ මහතුන් සම්බන්ධීකරණය කිරීම.

   v නීතිපති දෙපාර්තමේන්තුවේ රජයේ නීතිඥ මහතුන් හා සම්බන්ධ වෙමින් නීති සාකච්ඡාවලට සහභාගි වෙමින් නඩු කටයුතු මෙහෙයවීම.

2. ශ්‍රී ලංගමට අයත් ප්‍රාදේශිය කාර්යාල, ඩිපෝ හා ප්‍රධාන කාර්යාලයේ අනෙකුත් අංශවල පවතින නෛතික ගැටලු හා පරිපාලනමය ගැටලුවලට අවශ්‍ය නීතිමය උපදෙස් ලබාදීම.

3. ශ්‍රී ලංගම හා බාහිර පාර්ශවයන්සමඟ එළඹෙන බදු ගිවිසුම්, සැපයුම් ගිවිසුම්, ආරක්ෂක ගිවිසුම්, පොදුගිවිසුම් ආදී ගිවිසුම් සකස් කිරීම.

4. ශ්‍රී ලංගම සතු ඉඩම් සම්බන්ධ ගැටලු වලදී ලේකම් කොටියාශයට අවශ්‍ය උපදෙස් ලබාදීම, බාහිර ආයතන සමග පැවැත්වෙන සාකච්ඡාවලට සහභාගිවීම සහ වාර්තා සැකසීම.

5. සභාපතිතුමා විසින් යොමු කරනු ලබනගැටලු සඳහා අවශ්‍ය අවස්ථාවලදී කැබිනට් සංදේශ සැකසීම.

මේ අනුව නීති කොටියාශය තුළ ශ්‍රී ලංගම සහකාර නීති කාර්යයන් ඉටු කරනු ලබන අතර 2017 වර්ෂයේ මෙම නිලධාරි මහතුන් විසින් ඉටු කරනු ලැබූ ඉහත කී සියලුම කාර්යයන් පිළිබඳව වාර්තාවක් සැකසීම ඉතා සංකීර්ණ වන අතර එසේ වුවද 2017 වර්ෂය තුළ නීති කොටියාශය විසින් විශේෂිතව සිදුකරනු ලැබූ කාර්යයන් පහත පරිදි වේ.

1 2017 වර්ෂය තුළ මහේස්ත්‍රාත් අධිකරණ සඳහා සිතාසි 35 ක් ද, දිසා අධිකරණ සිතාසි 33 ක් ලැබී ඇති අතර එකී නඩුවල ඉදිරි කටයුතු සිදු කිරීම.

2 2017 වර්ෂය තුළ නීති කොටියාශය මගින් සකසනු ලැබූ ගිවිසුම් සංඛ්‍යාව 32 ක් වේ.

3 ශ්‍රී ලංගම බස්රථ වලට අවශ්‍ය අමතර කොටස් මිලදී ගැනීම වෙනුවෙන් සී/ස නිම්බස් ඔටෝමෝටිව් ප්‍රයිවට් ලිමිටඩ් සමාගම වෙත ගෙවිය යුතු හිඟ මුදල් නොගෙවීම සම්බන්ධයෙන් එම සමාගම විසින් බෙරුම්කරණයට යොමු වී තිබූ අතර, එකී බෙරුම්කරණ ප්‍රධානය 2017.05.29 දින ලබාදෙන ලදී. ඒ අනුව එම සමාගමට ගෙවිය යුතු මුදල ඇ.ඩො 1,365,375.77 ක් වූ අතර, එකී මුදල හා ඊට අදාල පොළිය ගෙවා එහි කටයුතු අවසන් කරන ලදී.

4 එසේම සී/ස වේරහැර ඉංජිනියරින් සර්විසස් සමාගම විසින් 2004.07.06 දිනට එම සමාගම වෙත අයවිය යුතු රු. 235,850,767.20 ක මුදලක් හා ඊට අදාල සම්පූර්ණ මුදල ගෙවා නිමවන තෙක් 6.3% ක වාර්ෂික පොළියක් ගෙවන ලෙසට ශ්‍රී ලංගමට එරෙහිව පවරා තිබූ බෙරුම්කරණ නඩුවේ ලබාදී තිබූ බෙරුම්කරණ ප්‍රදානය ක්‍රියාත්මක කරවා ගැනීම පිණිස එම සමාගම විසින් කොළඹ වාණිජ මහාධිකරණයේ HC/ARB/484/05 නඩුව පවරා තිබිණ. එකී බෙරුම්කරණ තීරණය ඉවත් කරන ලෙසට ශ්‍රී ලංගම විසින් කොළඹ වානිජ මහාධිකරණයේ අංක HC/ARB/124/04 දරණ නඩුව පවරා ඉල්ලීමක් කර තිබුණි. එම නඩු 02ම ඒකාබද්ධව අධිකරණයේ කැඳවූ අතර, එම සමාගම අධිකරණයේ පෙනී නොසිටීම මත 2007 වර්ෂයේදී HC/ARB/484/05 දරණ නඩුව නිෂ්ප්‍රභා කර තිබුණි. අනතුරුව 2016 වර්ෂයේදී පමණ මෙම සමාගම විසින් මෙම නඩු 02 (දෙක) නැවත විවෘත අධිකාරණයේ කැඳවීමට ඉල්ලීමක් කර තිබුණි. මෙම නඩු දෙක ගරු අධිකරණයේ කැඳවුණු අතර 2017.11.07 වන දින මෙම සමාගම විසින් එකී ඉල්ලීම ඉවත්කර ගැනීම හේතුවෙන් එම නඩුවල කටයුතු අවසන් විය.

5 එසේම, නීතිපති දෙපාර්තමේන්තුව විසින් 2016 සහ 2017 වර්ෂවලදී ශ්‍රී ලංගම නඩු වෙනුවෙන් පෙනී සිටීම හා අනෙකුත් කටයුතු සිදුකිරීම වෙනුවෙන් 2017.10.19 දින නඩු 112 කට අදාල බිල්පත් සඳහා රු. 5,725,162.08 ක මුදලක් ද, 2017.12.15 දින නඩු 57 කට අදාල බිල්පත් සඳහා රු. 3,195,950.00 ක මුදලක් ද ශ්‍රී ලංගම විසින් නීතිපති දෙපාර්තමේන්තුව වෙත ගෙවීම සිදුකර ඇත.

<u>වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති</u>

1. සංස්ථාගත තොරතුරු

1.1 වාර්තාකරණ ආයතනය

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වූ කලී 2005 අංක 27 දරණ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනත යටතේ පාර්ලිමේන්තුව විසින් පනවන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. මණ්ඩලයේ ලියාපදිංචි කළ කාර්යාලය කොළඹ 05, කිරුල පාරේ අංක 200 දරණ ස්ථානයේ පිහිටා ඇති අතර ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය එම ස්ථානයේම පිහිටා ඇත.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය (ශ්‍රී ලංගම) වූ කලී ප්‍රවාහන අමාත්‍යාංශයේ විෂය පථය යටතේ පවත්නා ආයතනයකි.

1.2 ප්‍රධාන කාර්යයන්

වර්ෂය තුළදී මණ්ඩලයේ ප්‍රධාන කාර්යය වූයේ ජනතාවට මාර්ග මගී ප්‍රවාහන සේවා ලබාදීමය. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ අරමුණ වනුයේ, ‘‘ජනතාවට සාධාරණ ගාස්තු ක්‍රමයක් යටතේ ආරක්ෂිත විශ්වාස කටයුතු සහ සුවපහසු මාර්ග ප්‍රවාහන සේවාවක් ලබාදීමයි.’’

2. සකස් කිරීමේ පදනම

2.1 පිළිපැදීම පිළිබඳ ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශ සකස් කරනු ලැබ ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරනු ලැබූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලවය. 2017 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය ඇතුළුව ඒ දක්වා වූ සියළුම කාලපරිච්ඡේද සඳහා ශ්‍රී ලං.ග.ම. විසින් ස්වකීය මූල්‍ය ප්‍රකාශ සකස් කරනු ලැබුවේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී.ල.ගි.ප්‍ර.) අනුකූලවය. 2017 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මෙම මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලං.ග.ම. විසින් සකස් කරනු ලැබ ඇත්තේ නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලවය.

මූල්‍ය ප්‍රකාශ සමන්විත වන්නේ, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, සම්පූර්ණ ආදායම පිළිබඳ ප්‍රකාශය, සාමාන්‍ය කොටස්වල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් වලිනි.

2.2 මැනීමේ පදනම

මූල්‍ය ප්‍රකාශ සකස් කරනු ලැබ ඇත්තේ ඓතිහාසික පිරිවැය පදනම මතය.

2.3 සංසන්දනාත්මක තොරතුරු

පවත්නා කාල පරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අවබෝධය ඉහල නැංවීම සඳහා සහ අන්තර් කාල පරිච්ඡේද සංසන්දනාක්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශවල වාර්තා කර ඇති සියලුම වටිනාකම් පිළිබඳව කලින් කාල පරිච්ඡේදයට අදාල ප්‍රමාණාත්මක, කථන සහ විස්තරාත්මක තොරතුරු ඇතුළු සංසන්දනාත්මක තොරතුරු එළිදරව් කරනු ලැබේ.

වෙනත් ආකාරයට දක්වා තිබේ නම් මිස පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම මූල්‍ය ප්‍රකාශවල ඉදිරිපත් කර ඇති සියලුම කාලපරිච්ඡේදවලට නොවෙනස්වම අදාල කරගනු ලැබ ඇත.

මූල්‍ය ප්‍රකාශවල සඳහන් අයිතමයන්ට අදාල ඉදිරිපත් කිරීම් හෝ වර්ගීකරණය සංශෝධනය කරනු ලැබ ඇති අවස්ථාවලදී, වඩාත් හොඳ ඉදිරිපත් කිරීමක් ලබාදීම පිණිස, පවත්නා වර්ෂයට අනුකූල වන පරිදි සංසන්දනාත්මක මූල්‍යමය වටිනාකම නැවත වර්ගීකරණය කරනු ලැබ ඇත.

2.4 ඇස්තමේන්තු සහ විනිශ්චයන් භාවිතා කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාල කරගැනීම සහ වාර්තා කර ඇති වත්කම්, බැරකම්, ආදායම සහ වියදම් ප්‍රමාණයන් කෙරෙහි බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන කළමණාකාරීත්වය විසින් සිදු කිරීම අවශ්‍ය වන්නේය.

විනිශ්චයන් සහ ඇස්තමේන්තු පදනම් වී ඇත්තේ, අතීත අත්දැකීම් සහ අවස්ථාගත කරුණු යටතේ සාධාරණයයි විශ්වාස කරනු ලබන අපේක්ෂාවන් ඇතුළු වෙනත් සාධක මතය. එමනිසා සත්‍ය අත්දැකීම් සහ ප්‍රතිඵල, මෙම විනිශ්චයන්ට සහ ඇස්තමේන්තුවලට වඩා වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු පාදක වූ උපකල්පන අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. ප්‍රතිශෝධනය බලපාන්නේ ඇස්තමේන්තුව ප්‍රතිශෝධනය කළ කාල පරිච්ඡේදයට පමණක් නම් එම කාල පරිච්ඡේදයේදීද ප්‍රතිශෝධනය පවත්නා සහ අනාගත යන කාල පරිච්ඡේද දෙකටම බලපාන්නේ නම්, ප්‍රතිශෝධනය කළ කාල පරිච්ඡේදය සහ අනාගත කාල පරිච්ඡේදයේදීද ගිණුම්කරණ ඇස්තමේන්තු පිළිබඳ ප්‍රතිශෝධන පිළිගනු ලැබේ.

2.5 වත්කම් සහ ඒවා අගය කිරීමේ පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇති වත්කම් වනුයේ මුදල්, බැංකු ශේෂ සහ මණ්ඩලයේ ව්‍යාපාරික කටයුතුවල සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය හෝ වාර්තාකරණ දිනයේ සිට එක් වර්ෂයක් යන දෙකෙන් කෙටි කාලය තුළ මුදල් වශයෙන් උපලබ්ධි කරගනු ලැබීමට අපේක්ෂා කරනු ලබන අයිතමයන්ය. ජංගම වත්කම් හැර සෙසු වත්කම් වනුයේ වාර්තාකරණ දිනයේ සිට එක් වර්ෂයක කාල පරිච්ඡේදයෙන් ඔබ්බට තබා ගැනීමට මණ්ඩලය අපේක්ෂා කරන වත්කම්වේ.

3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී යොදා ගන්නා ලද ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා ඇත.

3.1 දේපල, පිරියත හා උපකරණ

දේපල, පිරියත සහ උපකරණ සඳහන් කරනු ලැබ ඇත්තේ සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිකාරක අලාභ තිබේ නම් ඒවා කපා හැරීමෙන් පසු පිරිවැය වශයෙනි.

(අ) අයිති වත්කම්

දේපල, පිරියත හා උපකරණ අයිතමයක පිරිවැය සමන්විත වන්නේ, එය මිලට ගත් මිලෙන් සහ එහි අපේක්ෂිත භාවිතය සඳහා එම වත්කම ක්‍රියාකාරක තත්ත්වයට ගෙන ඒමට සෘජුවම ආරෝපණය කළ හැකි යම් පිරිවැයක් තිබේ නම් එයින් ද වේ. තනිව ගොඩනැඟුණු වත්කම්වල පිරිවැයට ද්‍රව්‍යවල සහ සෘජු ශ්‍රමයේ පිරිවැයද අපේක්ෂිත භාවිතය සඳහා එම වත්කම ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒමට සෘජුවම ආරෝපණය කළ හැකි යම් පිරිවැයක් තිබේ නම් එම පිරිවැය ද ඇතුළත්වේ. අයිතම ගලවා ඉවත් කිරීමේ සහ ඒවා පිහිටුවන ස්ථානයේ නැවත ගබඩා කිරීමේ පිරිවැය සහ සුදුසුකම් ලබන වත්කම් පිළිබඳ ණය ගැණුම් පිරිවැයද මෙයට ඇතුළත්වේ.

වත්කමක වැදගත් අංශ වෙන් වෙන්ව හඳුනාගනු ලබන අතර, එය වෙන් වෙන්ව ක්ෂය කරනු ලැබේ.

(ආ) තදනත්තර පිරිවැය

දේපල, පිරියත හා උපකරණ අයිතමයක යම් කොටසක් සම්බන්ධයෙන් වන විට එම කොටසේ අන්තර්ගත වී ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභ මණ්ඩලයට ගලා ඒමේ සම්භාවිතාවයක් තිබේ නම් සහ එහි පිරිවැය විශ්වාසදායී ලෙස මැනිය හැකි වන්නේ නම්, එම කොටස ප්‍රසම්පාදනය කිරීමේ පිරිවැය එම අයිතමයේ ධාරක අගය පිළිගනු ලැබේ. ප්‍රසම්පාදනය කරන ලද කොටසේ ධාරක අගය පිළිගැනීමෙන් බැහැර කෙරේ.

දේපල, පිරියත සහ උපකරණ එදිනෙදා අළුත්වැඩියා කිරීමේ පිරිවැය එය දරණ අවස්ථාවේදී ලාභාලාභ ගිණුමෙහි පිළිගනු ලැබේ.

(ඇ) ක්ෂය කිරීම

ක්ෂය ප්‍රමාණය ගණනය කරනු ලබන්නේ වත්කමක පිරිවැයෙන් හෝ පිරිවැය සඳහා ආදේශනය කළ වෙනත් මුදල් ගණනයෙන් එහි ශේෂ වටිනාකම අඩු කළ විට ලැබෙන ක්ෂය කළ හැකි මුදල මත වේ. දේපල,පිරියත සහ උපකරණ අයිතමයක එක් එක් කොටස ප්‍රයෝජනයට ගත හැකි ඇස්තමේන්තු කළ ජීවිත කාල පදනම අනුව සරල රේඛා පදනම මත ලාභ අලාභ ගිණුමේ ක්ෂය කිරීම් පිළිගනු ලබන අතර, ඊට හේතුව වත්කමේ අන්තර්ගත ආර්ථික ප්‍රතිලාභවල අපේක්ෂිත පරිභෝජන රටාව එහි ඉතා සමීපව පිළිබිඹුවීමය. කල්බදු කාල පරිච්ඡේදය අවසාන වන විට සමාගම හිමිකාරීත්වය ලබාගැනීම සාධාරණව නිසැක වන්නේ නම් මිස කල්බදු කාල පරිච්ඡේදය සහ කල්බදු දෙන ලද වත්කම් ප්‍රයෝජනයට ගත හැකි ජීවිත කාල පරිච්ඡේදය යන දෙකෙන් කෙටි කාල පරිච්ඡේදය සඳහා කල්බදු දෙන ලද වත්කම් ක්ෂය කරනු ලැබේ. ඉඩම් ක්ෂය කරනු නොලැබේ.

ඇස්තමේන්තු කළ ප්‍රයෝජනවත් ජීව කාල පහත දැක්වේ.

වත්කම් ගණය	ප්‍රයෝජනවත් ජීවිත කාලය (අවුරුදු)	ක්ෂය කරනු ලබන ප්‍රමාණය (%)
ගොඩනැඟිලි	40	2.5%
බස්රථ සහ වෙනත් වාහන	8	12.5%
පිරියත සහ උපකරණ	10	10%
ගෘහ භාණ්ඩ සහ සවිකුරු	10	10%
පරිගණක	4	25%
බස් එන්ජින්	5	20%

වත්කම් ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය ප්‍රයෝජනයට ගත හැකිව තිබෙන අවස්ථාවේදී වන අතර, වත්කම් ක්ෂය කිරීම අවසාන වන්නේ වත්කම්, වත්කම විකිණීමට තිබෙන ලෙස වර්ගීකරණය කරනු ලබන දිනය සහ වත්කම පිළිගැනීමෙන් ඉවත් කරනු ලබන දිනය යන දින දෙකෙන් කලින් එළඹෙන දිනයේ දීය.

ක්ෂය කිරීමේ ක්‍රමය, ප්‍රයෝජනයට ගත හැකි ජීවිත කාල වටිනාකම් එක් එක් මුදල් වර්ෂය අවසානයේදී සමාලෝචනය කරනු ලබන අතර, අවශ්‍ය නම් නැවත ගලපනු ලැබේ.

(ඈ) පිළිගැනීම ඉවත් කිරීම

දේපල, පිරියත සහ උපකරණ අයිතමයන් අපහරණය කරනු ලැබූ විට හෝ එය ප්‍රයෝජනයට ගැනීමෙන් හෝ අපහරණය කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා කරනු නොලබන විට එම අයිකමයේ ධාරක මුදල පිළිගැනීම ඉවත් කරනු ලැබේ. එම පිළිගැනීම ඉවත් කිරීමෙන් හටගන්නා වාසි හෝ පාඩු ලාභාලාභ ගිණුමේ වෙනත් ආදායම් තුළ පිළිගනු ලැබේ.

3.2 කල්බදු දෙනු ලැබූ වත්කම්

හිමිකාරීත්වයේ සියලුම අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු තරමින් මණ්ඩලය භාරගන්නා කල්බදු, මූල්‍ය කල්බදු වශයෙන් වර්ගීකරණය කරනු ලැබේ. ආරම්භක පිළිගැනීම සිදු කරනු ලැබූ විට, කල්බදු දෙන ලද වත්කමේ සාධාරණ වටිනාකම සහ අවම කල්බදු ගෙවීම්වල වර්තමාන වටිනාකම යන දෙකෙන් අඩු වටිනාකමට සමාන මුදලකට වත්කම් මැන ප්‍රාග්ධනගත කරනු ලැබේ. ආරම්භක පිළිගැනීමට අනතුරුව, එම වත්කමට අදාල වන ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුකූලව වත්කම් ගිණුම්ගත කරනු ලැබේ.

සෙසු කල්බදු වනුයේ ක්‍රියාත්මක වන කල්බදු වන අතර, ආයෝජන දේපල සම්බන්ධයෙන් හැරුනු විට කල්බදු දෙනු ලබන වත්කම්, මූල්‍ය තත්ත්වය පිළිබඳ මණ්ඩලයේ ප්‍රකාශයේ පිළිගනු නොලැබේ.

3.3 ආයෝජන දේපල

ආයෝජන දේපල යනු බදු ආදායමක් උපයා ගැනීමට හෝ ප්‍රාග්ධනය වර්ධනය කර ගැනීමට හෝ ඒ දෙකම සඳහා බලපානු ලබන, එනමුත් භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනය භාවිතා කරමින් සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී විකිණීම හෝ පරිපාලන කාර්යයන් සඳහා තබා ගනු නොලබන දේපල වන්නේය. ආයෝජන දේපල මනිනු ලබන්නේ පිරිවැයට අනුවය.

දේපල භාවිතය ආයෝජන දේපලවල සිට හිමිකරු පදිංචි දේපලවලට මාරු වූ විට, එම දේපල, පිරියත සහ උපකරණ වශයෙන් වර්ගීකරණය කරනු ලැබේ.

3.4 කරගෙන යනු ලබන ප්‍රාග්ධන වැඩ

ශේෂ පත්‍රයේ දිනයේදී ප්‍රාග්ධනගත කරනු නොලැබූ, වර්ෂය තුළදී දරණ ලද ප්‍රාග්ධන වියදම්, කරගෙන යනු ලබන ප්‍රාග්ධන වැඩ ලෙස දක්වා ඇති අතර, වර්ෂය තුළ ප්‍රාග්ධනගත කරනු ලැබ ඇති සහ භාවිතයට යොදා ගෙන ඇති වත්කම් දේපල, පිරියත සහ උපකරණ විෂයට මාරු කරනු ලැබ ඇත.

3.5 අස්පෘශ්‍යනීය වත්කම්

වත්කම්වලට ආරෝපණය කළ හැකි ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒමේ සම්භාවිතාවයක් තිබේ නම් සහ වත්කම්වල පිරිවැය අස්පෘශ්‍ය වත්කම් - 38 වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව විශ්වාසදායක ලෙස මැනිය හැකි වන්නේ නම් සහ පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානි අලාභ අඩු කොට ඉදිරියට ගෙන යනු ලබන්නේ නම් යම් වත්කමක් අස්පෘශ්‍යනීය වත්කමක් ලෙස පිළිගනු ලැබේ.

නියත ජීවිත කාල ඇති අස්පෘශ්‍යනීය වත්කම් ප්‍රයෝජනවත් ආර්ථික ජීවිත කාලය පුරා ක්‍රමක්ෂය කරනු ලබන අතර, අස්පෘශ්‍යනීය වත්කම් හානියට පත්විය හැකි බවට ඇඟවීමක් තිබෙන ඕනෑම අවස්ථාවකදී හානියට පත්වීම පිළිබඳ තක්සේරුවක් කරනු ලැබේ. නියත ප්‍රයෝජනවත් ජීවිත කාලයක් තිබෙන අස්පෘශ්‍යනීය වත්කමකට අදාල ක්‍රමක්ෂය කාලච්ඡේදය සහ ක්‍රමක්ෂ ක්‍රමය යටත් පිරිසෙන් එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේදී සමාලෝචනය කරනු ලැබේ.

නිශ්චිත නොවන ප්‍රයෝජනවත් ජීවිත කාල ඇති අස්පෘශ්‍යනීය වත්කම් තනි තනිව හෝ මුදල් ජනනය වන ඒකක මට්ටමේදී හානියට පත්වීම සම්බන්ධයෙන් වාර්ෂිකව පරීක්ෂා කරනු ලැබේ.

3.6 මූල්‍ය නොවන වත්කම් හානියට පත්වීම

හානියට පත්වන බවට යම් හැඟීමක් තිබේද යන බව නිශ්චය කිරීම සඳහා වත්කම්වල ධාරක ප්‍රමාණය, වාර්තා කරන එක් එක් දිනයේදී සමාලෝචනය කරනු ලැබේ. එබඳු යම් හැඟවීමක් තිබේ නම් එවිට වත්කම වෙනුවෙන් අය කරගත හැකි මුදල ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක ධාරක මුදල හෝ මුදල් ජනනය වන ඒකකය එහි අයකර ගත හැකි මුදලට වැඩි වන්නේ නම් හානියට පත්වීමේ අලාභයක් පිළිගනු ලැබේ. අයකර ගත හැකි මුදල නිශ්චය කිරීම සඳහා භාවිතා කරනු ලබන ඇස්තමේන්තුවල වෙනසක් තිබුණේ වී නම් හානියට පත්වීමේ අලාභය ප්‍රතිශෝධනය කරනු ලැබේ.

3.7 වට්ටෝරු බඩු

වට්ටෝරු බඩු මනිනු ලබන්නේ පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි කළ හැකි වටිනාකම යන දෙකෙන් අඩු මුදලට අනුවය.

වට්ටෝරු බඩුවල පිරිවැය සමන්විත වන්නේ මිලට ගැනීම්වල සියලුම පිරිවැය පරිවර්තනය කිරීමට සහ බඩු වට්ටෝරු අයිතමයන් දැනට බඩු පවත්නා ස්ථානවලට සහ තත්ත්වයට ගෙන ඒමට දැරීමට සිදුවන වෙනත් පිරිවැය වලිනි.

උපලබ්ධි කරගත හැකි ශුද්ධ වටිනාකම වනුයේ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු කරගෙන යන අතරතුරේදී තක්සේරු කරන ලද විකුණුම් මිලෙන් ඇස්තමේන්තු කළ සම්පූර්ණ කිරීමේ පිරිවැය සහ විකිණීම සඳහා අවශ්‍ය ඇස්තමේන්තුවල පිරිවැය අඩු කිරීමෙන් ලැබෙන වටිනාකමයි.

වට්ටෝරු බඩුවල පිරිවැය නියම කරනු ලබන්නේ ඒවා එකිනෙකෙහි පිරිවැය නිශ්චිතව හඳුනාගැනීම සහ පළමුව ඇතුළු කළ දෙය පළමුව බැහැර කිරීමේ සූත්‍ර භාවිතා කිරීම මඟිනි.

3.8 මූල්‍ය වත්කම්

3.8.1 ආරම්භක පිළිගැනීම සහ ගණනය කිරීම

39 වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවල විෂය පථය තුළ මූල්‍ය වත්කම් අදාල පරිදි ලාභ හෝ අලාභ මඟින් දැක්වෙන සාධාරණ මූල්‍ය වටිනාකමෙන් යුත් මූල්‍ය වත්කම්, ණය සහ ලැබිය යුතු දෑ කල් පිරීම තෙක් තබාගනු ලබන ආයෝජන විකිණීමට තිබෙන මූල්‍ය වත්කම් යනුවෙන් වර්ගීකරණය නිශ්චය කරනු ලැබේ.

සියලුම මූල්‍ය වත්කම් ආරම්භයේදී පිළිගනු ලබන්නේ එහි සාධාරණ වටිනාකමට සාධාරණ වටිනාකම නොවන වත්කම් සම්බන්ධයෙන් වන විට ලාභාලාභ ගිණුම මඟින් සෘජුව ආරෝපණය කළ හැකි ගනුදෙනු කිරීමේ පිරිවැයද එකතු කිරීම මඟිනි.

ශ්‍රී ලංගමයේ මූල්‍ය වත්කම්වලට, මුදල් සහ කෙටි කාලීන ආයෝජනද, වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දේවල්ද, කාර්යය මණ්ඩල ණය සහ වෙනත් ලැබිය යුතු දේවල්ද ඇතුළත්වේ.

3.8.2 තදනන්තර මැනීම

මූල්‍ය වත්කම් තදනන්තරව මැනීම ඒවායේ වර්ගීකරණය මත රඳා පවතියි.

(අ) ලාභාලාභ හිණුම් මඟින් සාධාරණ වටිනාකම මත මූල්‍ය වත්කම්

ලාභාලාභ හිණුම් මඟින් සාධාරණ වටිනාකම මත මූල්‍ය වත්කම්වලට වෙළෙඳාම සඳහා තබාගනු ලබන මූල්‍ය වත්කම් සහ ලාභාලාභ හිණුම් මඟින් සාධාරණ වටිනාකම මත ආරම්භක පිළිගැනීම මත නම් කරන ලද මූල්‍ය වත්කම් ඇතුළත් වේ. මූල්‍ය වත්කම් ලබාගෙන ඇත්තේ විකිණීම සඳහා හෝ නුදුරු කාලයේදී නැවත මිලට ගැනීම සඳහා නම්, එම වත්කම් වෙළෙඳාම සඳහා ලබා ගනු ලබන වත්කම් වශයෙන් වර්ගීකරණය කරනු ලැබේ.

(ආ) ණය සහ ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ වූ කලී සක්‍රීය වෙළෙඳපලක මිල ඉදිරිපත් නොකළ ස්ථාවර හෝ නිශ්චය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වන්නේය. ආරම්භක ගණනයෙන් අනතුරුව එබඳු මූල්‍ය වත්කම් හානියට පත්වීම අඩු කළ ඵලදායී පොළී ප්‍රමාණ ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂ පිරිවැය මත තදනන්තරව ගණනය කරනු ලැබේ. ක්‍රමක්ෂය කළ පිරිවැය ගණන් බලනු ලබන්නේ අත්පත් කර ගැනීමේ යම් වට්ටමක් හෝ පරිතෝෂිතයක් සහ ඵලදායී පොළී ප්‍රමාණයේ අත්‍යාවශ්‍ය කොටසක් වන ගාස්තු හෝ පිරිවැය ගැනද සැලකිල්ලට ගනිමින්ය. ඵලදායී පොළී ප්‍රමාණයේ ක්‍රමක්ෂය, ආදායම් ප්‍රතිශතයෙහි මූල්‍ය ආදායමෙහි ඇතුළත් කර තිබේ.

හානියට පත්වීමෙන් පැන නඟින අලාභ, ආදායම් ප්‍රකාශයෙහි මූල්‍ය පිරිවැයෙහි පිළිගනු ලැබේ.

(ඇ) කල්පිරීම දක්වා තබාගනු ලබන ආයෝජන

නියමිත හෝ නිශ්චය කරනු ලැබීමට හැකි ගෙවීම් සහ නියමිත කල් පිරීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් ඒවා කල්පිරීම දක්වා තබා ගැනීමේ ධනාත්මක චේතනාවක් සහ හැකියාවක් ශ්‍රී ලංගමයට තිබෙන විට කල්පිරීම දක්වා ලබා ගනු ලබන වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. ආරම්භක ගණනයෙන් අනතුරුව කල්පිරීම දක්වා ලබා ගනු ලබන ආයෝජන ඵලදායී පොළී ක්‍රමය භාවිතා කරමින් හානිය අඩු කොට ක්‍රමක්ෂ පිරිවැයට අනුව ගණනය කරනු ලැබේ. ක්‍රමක්ෂ පිරිවැය ගණන් බලනු ලබන්නේ අත්කර ගැනීමට අදාල යම් වට්ටමක් හෝ පාරිතෝෂිතයක් සහ ඵලදායී පොළී ප්‍රමාණයේ අවශ්‍ය කොටසක් සහ ගාස්තු සහ පිරිවැය සැලකිල්ලට ගනිමින්ය. ඵලදායී පොළී ප්‍රමාණයේ ක්‍රමක්ෂයන්ට ආදායම් ප්‍රකාශයේ සඳහන් මූල්‍ය ආදායමද ඇතුළත්වේ. හානියට පත්වීමෙන් පැන නඟින අලාභ ආදායම් ප්‍රකාශයෙහි මූල්‍ය පිරිවැයක් ලෙස පිළිගනු ලැබේ.

(ඈ) විකිණීමට තිබෙන මූල්‍ය ආයෝජන

විකිණීමට තිබෙන මූල්‍ය ආයෝජනවලට සාධාරණත්ව කොටස් සහ ණය සුරකුම් ඇතුළත්වේ. විකිණීමට ඇති ආකාරය අනුව වර්ගීකරණය කරන ලද සාධාරණත්ව කොටස් ආයෝජන වනුයේ වෙළෙඳාම සඳහා තබා ඇති ලෙස වර්ගීකරණය කරනු ලැබුණේවත්, ලාභ අලාභ හිණුම මඟින් සාධාරණ වටිනාකමක් ලෙස නම් කරනු ලැබුණේවත් නොමැති ආයෝජනයන්ය. මෙම ගණයට අයත් ණය සුරකුම් වනුයේ අනිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහා තබාගැනීමට අපේක්ෂා කරනු ලබන්නාවූද, ද්‍රවශීලතා අවශ්‍යතාවයන්ට ප්‍රතිචාර වශයෙන් හෝ වෙළෙඳපොල තත්ත්වයන්ගේ වෙනස්වීම්වලට ප්‍රතිචාර වශයෙන් හෝ විකුණනු ලැබිය හැකි සුරකුම්ය.

ආරම්භක ගණනය කිරීමෙන් අනතුරුව විකිණීමට තිබෙන මූල්‍ය ආයෝජනයන් ආයෝජනය පිළිගැනීම ඉවත් කර ගනු ලබන තෙක් විකිණීමට තිබෙන සංචිතයේ සෙසු පූර්ණ ආදායම් ලෙස පිළිගන්නා ලද උපලබ්ධි නොවූ ලැබීම් හෝ අලාභ සමඟ සාධාරණ වටිනාකමකට පසුව ගණනය කරනු ලැබේ.

3.8.3 පිළිගැනීම ඉවත් කිරීම

i. වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිවාසිකම් කල් ඉකුත් වී ඇති විට,

ii. වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමට තමන්ට තිබෙන අයිතිවාසිකම් ශ්‍රී ලංගම විසින් පවරා දී ඇති විට හෝ ලැබුණු මුදල් ප්‍රවාහ සම්පූර්ණයෙන්ම සැලකිය යුතු තරමේ ප්‍රමාණයකින් තොරව එතෙරවීමේ වැඩ පිළිවෙලක් යටතේ තුන්වන පාර්ශවයකට ගෙවීමේ බැඳීමකට එළඹී ඇතිවිට සහ

(අ) වත්කමෙහි සියලුම අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු තරමින් ශ්‍රී ලංගම විසින් පවරාදී ඇත්තාවූ හෝ

(ආ) වත්කමෙහි සියලුම අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු තරමින් ශ්‍රී ලංගම පවරාදී හෝ රඳවාගෙන නොමැති, එහෙත් වත්කමෙහි පාලනය පවරා දී ඇති අවස්ථාවකදී

මූල්‍ය වත්කමක් හෝ (අදාල අවස්තාවකදී මූල්‍ය වත්කමෙන් කොටසක් හෝ එක සමාන මූල්‍ය වත්කම් සමූහයකින් කොටසක්) පිළිගැනීමෙන් ඉවත් කරනු ලැබේ.

3.8.4 මූල්‍ය වත්කම් හානියට පත්වීම

මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානියට පත් වී ඇති බවට යම් විෂය මූල සාක්ෂියක් තිබේද යන බව වාර්තා කරන එක් එක් දිනයකදී ශ්‍රී ලංගම විසින් තක්සේරු කරනු ලැබේ. වත්කමේ ආරම්භක පිළිගැනීමට පසුව සිදු වූ සිද්ධි එකක හෝ වැඩි ගණනක ප්‍රතිඵලයක් ලෙස හානියට පත් වූ බවට විෂය මූලික සාක්ෂි තිබේ නම් පමණක් සහ අලාභ සිද්ධිය මඟින් විශ්වාසවන්ත ලෙස ඇස්තමේන්තු කළ හැකි මූල්‍ය වත්කමේ හෝ මූල්‍ය වත්කම් සමූහයේ ඇස්තමේන්තු කළ හැකි අනාගත මුදල් ප්‍රවාහ කෙරෙහි බලපෑමක් ඇති කෙරේ නම් යම් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානියට පත් වූ ලෙස සලකනු ලැබේ. ණයකරු හෝ ණයකරුවන් කණ්ඩායම සැලකිය යුතු තරමේ මූල්‍ය දුෂ්කරතාවයන් පැහැරහැරීම් හෝ අපචාරවලට යටත්වීමේ සහ ඔවුන් වස්තු භංගත්වයට පත්වීමේ හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයකට යටත්වීමේ සම්භාවිතාවය අත්දැකීම් සහ පැහැරගැනීම්වලට සම්බන්ධ ආර්ථික තත්ත්වයක් පිළිබඳ වෙනස්වීම් වැනි ඇස්තමේන්තු කළ හැකි අනාගත මුදල් ප්‍රවාහයන්හි ගණනය කළ හැකි තරම් පහත වැටීමක් තිබෙන බව නිරීක්ෂණය කළ හැකි දත්තවලින් දැක්වෙන බවට ඇඟවීම්ද, හානියට පත්වීම් පිලිබඳ සාක්ෂිවලට ඇතුළත්ව විය හැකිය.

3.9 මුදල් සහ මුදල් සමානයන්

මුදල් සහ මුදල් සමානයන් සමන්විත වන්නේ මුදල් ශේෂ, ඉල්ලුම් තැන්පතු, මුදල්වලට පහසුවෙන් පරිවර්තනය කළ හැකි කරනු ලැබිය හැකි සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යය සඳහා ඉල්ලූවිට ආපසු ගෙවිය යුතු බැංකු අයිරා අඩු කළ විට වටිනාකම වෙනස්වීමේ නොවැදගත් අවදානමට යටත් අධික ද්‍රවශීලතාවයෙන් යුත් කෙටි කාලීන ආයෝජන වලිනි.

3.10 මූල්‍ය බැරකම්

අංක 39 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ විෂය පථය තුළ මූල්‍ය බැරකම්වල ආරම්භක පිළිගැනීම සහ ගණනය කිරීම ලාභාලාභ ගිණුම මඟින් ක්‍රමක්ෂ පිරිවැය මත සාධාරණ වටිනාකමෙන් යුත් මූල්‍ය බැරකම් ලෙස හෝ අදාල පරිදි ඵලදායක රැකවරණයකදී රැකවරණ සාධාරණ පත්‍ර ලෙස නම් කරන ලද ව්‍යුත්පන්න ලෙස වර්ගීකරණය කරනු ලැබේ. ස්වකීය මූල්‍ය බැරකම් ආරම්භයේදී පිළිගැනීම පිළිබඳ වර්ගීකරණය ශ්‍රී ලංගම විසින් නිශ්චය කරනු ලැබේ.

සියලුම මූල්‍ය බැරකම් ආරම්භයේදී සාධාරණ වටිනාකම මත පිළිගනු ලබන අතර, ණය සහ ඉල්ලා ගත් මුදල් ක්‍රමක්ෂ පිරිවැය මත ඉදිරියට ගෙන යනු ලැබේ. සෘජුව ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැය මෙයට ඇතුළත් වේ. වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ ශ්‍රී ලංගමයේ මූල්‍ය බැරකම්වලට ඇතුළත් වේ.

3.10.1 තදනන්තර ගණනය කිරීම

මූල්‍ය බැරකම් පිළිබඳ තදනන්තර ගණනය කිරීම් කරනු ලබන්නේ ක්‍රමක්ෂ පිරිවැය මතය.

3.10.2 පිළිගැනීම ඉවත් කිරීම

බැරකම් යටතට වැටෙන බැඳීමක් බේරුම් කරනු ලබන හෝ අවලංගු කරනු ලබන හෝ අවසන් වන අවස්ථාවේදී මූල්‍ය බැරකම් පිළිගැනීම ඉවත් කෙරෙන්නේය.

3.11 මූල්‍ය සාධන හිලව් කිරීම

මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් හිලව් කරනු ලබන්නේ සහ ශුද්ධ මුදල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තා කරනු ලබන්නේ පිළිගන්නා ලද මුදල් ගණන් හිලව් කිරීමට වර්තමානයේ ක්‍රියාත්මක කළ හැකි නෛතික අයිතිවාසිකමක් සහ ශුද්ධ පදනමක් මත නිරවුල් කිරීමට හෝ සමගාමීව වත්කම් උපලබ්ධි කරගැනීමට සහ බැරකම් නිරවුල් කිරීමට චේතනාවක් තිබෙන්නේ නම් පමණකි.

3.12 පශ්චාත් රැකියා ප්‍රතිලාභ

3.12.1 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සමාගම

1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීමේ පනත යටතේ නියමිත පරිදි සුදුසුකම් ඇති සියලුම සේවකයන් සඳහාවූ ප්‍රතිලාභ සැලැස්ම මණ්ඩලය විසින් යොදා ගනු ලැබ ඇත. ප්‍රතිලාභ සැලැස්ම සඳහා බැහැරින් අරමුදල් සපයනු නොලැබේ. සේවය කළ සෑම වර්ෂයක් සඳහාම එක් මසක වැටුපක් විශ්‍රාම ගැන්වීමේදී සේවකයන්ට ලබා දෙනු ලැබේ.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි පිළිගනු ලැබ ඇති බැරකම වනුයේ, වාර්තා කරන දිනයේදී ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය භාවිතා කරමින් අර්ථ දක්වන ලද ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන වටිනාකමයි. මේ අයිතමය සඳහන් කර ඇත්තේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ජංගම නොවන බැරකම් යටතේය. ආයු ගණන වාසි හෝ අලාභ එය පැන නඟින මූල්‍ය වර්ෂය තුළ ආදායමක් හෝ වියදමක් ලෙස සෙසු පූර්ණ ආදායමෙහි පිළිගනු ලැබේ.

3.12.2 අර්ථ දක්වන ලද දායකත්ව සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල්වලට සහ සේවක භාරකාර අරමුදලේ දායක මුදල්වලට සුදුසුකම් ඇති සියලුම සේවකයින් අදාල ව්‍යවස්ථාවලට අනුකූලව අදාල දායකත්ව අරමුදල්වලින් ආවරණය කෙරේ. අර්ථ දක්වන ලද දායකත්ව සැලසුම්වලට ගෙවන සේවා යෝජකයාගේ දායක මුදල් ලාභාලාභ ගිණුමේ වියදමක් ලෙස පිළිගනු ලැබේ.

3.13 වෙළෙඳ සහ කළ යුතු වෙනත් ගෙවීම්

වෙළෙඳ සහ කළ යුතු වෙනත් ගෙවීම් පිරිවැය අනුව දක්වනු ලැබේ.

3.14 ප්‍රතිපාදන

අතීත සිද්ධියක ප්‍රතිඵලයක් ලෙස විශ්වාස කටයුතුව ඇස්තමේන්තු කළ හැකි වර්තමාන නෛතික හෝ අනුමිත බැඳීමක් මණ්ඩලයට තිබේ නම් සහ බැඳීම ඉටු කිරීම පිණිස ආර්ථික ප්‍රතිලාභ බැහැරට ගලා යෑමක අවශ්‍යතාවය සම්භාවී වන්නේ නම් යම් ප්‍රතිදානයක් පිළිගනු ලැබේ.

3.15 සෙමෙන් අලෙවි වන තොග සඳහා ප්‍රතිපාදන

බඩු වට්ටෝරු පිළිබඳව මණ්ඩලය විසින් නිතිපතා කරනු ලබන තක්සේරුවලදී වට්ටෝරු භාණ්ඩ හානියට පත්වීම මණ්ඩලය හඳුනාගනු ලැබූ විට සෙමෙන් අලෙවි වන තොග සඳහා ප්‍රතිපාදන සලස්වනු ලැබේ.

3.16 ප්‍රාග්ධන බැඳීම් සහ අවිනිශ්චිත බැරකම්

අවිනිශ්චිත බැරකම් යනු ආර්ථික ප්‍රතිලාභ පැවරීමට සම්භාවී නොවන හෝ විශ්වාස කටයුතු ලෙස ගණනය කරනු ලැබිය නොහැකි අවස්ථාවලදී ඇතැම් අනාගත සිද්ධි හෝ වර්තමාන බැඳීම් මඟින් පමණක් පැවැත්ම තහවුරු කරනු ලබන විභව බැඳීම් වන්නේය.

පූර්ණ ආදායම් ප්‍රකාශය

3.17 ආදායම

මණ්ඩලයේ ආදායම සමන්විත වන්නේ මගී ප්‍රවාහනය මඟින් ලැබෙන ආදායමෙනි.

3.17.1 ආදායම පිළිගැනීම

ආදායම පිළිගනු ලබන්නේ ආර්ථික ප්‍රතිලාභ මණ්ඩලය වෙත ගලා එනු ඇතැයි සම්භාවීවන්නාවූ, ආදායම සහ දරන ලද හෝ දැරීමට තිබෙන ආශ්‍රිත පිරිවැය විශ්වාස කටයුතු ලෙස ගණනය කළ හැකි වන්නාවූ ප්‍රමාණයටය. ආදායම ගණනය කරනු ලබන්නේ ලැබුණු හෝ ලැබීමට ඇති ප්‍රතිශ්‍යාවේ සාධාරණ වටිනාකමෙන් වෙළෙඳ වට්ටම් සහ විකුණුම් බදු අඩු කොට මණ්ඩලය තුළ විකුණුම් බැහැර කිරීමෙන් අනතුරුවය.

(අ) භාණ්ඩ විකිණීම

භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම පිළිගනු ලබන්නේ භාණ්ඩවල හිමිකාරීත්වයේ සැලකිය යුතු තරම් වූ අවදානම් සහ ප්‍රදානයන් සාමාන්‍යයෙන් භාණ්ඩ භාරදෙන අවස්ථාවේදී ගැණුම්කරු වෙත මාරු වූ විටය.

(ආ) සේවාවන් ඉටු කිරීම

සේවාවන් සැපයීමෙන් ලැබෙන ආදායම පිළිගනු ලබන්නේ සේවාවන් සපයනු ලබන හෝ ඉටු කරනු ලබන කාල පරිච්ඡේදය තුළදීය.

(ඇ) වෙනත් ආදායම්

ලාභාංශවලින් ලැබෙන ආදායම පිළිගනු ලබන්නේ ගෙවීම් ලැබීමට මණ්ඩලයට තිබෙන අයිතිවාසිකම තහවුරු කරනු ලැබූ විටදීය.

දේපල, පිරියත සහ උපකරණ අපහරණය කිරීමෙන් ලැබෙන ලාභ හෝ අලාභ අපහණයෙන් ලැබෙන මුදලින් වත්කම්වල ධාරක වටිනාකමෙන් සහ ඒ සම්බන්ධ වියදම්වලින් අඩු කරනු ලැබ පිළිගනු ලැබේ.

විදේශ මුදල් ඉපැයුම් සහ අලාභ ශුද්ධ පදනමක් මත වාර්තා කරනු ලැබේ.

අබලි ද්‍රව්‍ය විකිණීමෙන් ලැබෙන ආදායම පිළිගනු ලබන්නේ භාණ්ඩවල හිමිකාරීත්වයේ සැලකිය තරම්වූ අවදානම් සහ ප්‍රදානයන් සාමාන්‍යයෙන් භාණ්ඩ භාර දෙන අවස්ථාවේදී ගැණුම්කරු වෙත මාරු වූ විටදීය.

ආයෝජන දේපල මත ක්‍රියාත්මක වන කල්බදුවලට ලැබෙන කුලී ආදායම කල්බදු කාලය පුරා සරල රේඛා පදනමක් මත ගිණුම්ගත කරනු ලැබේ.

3.18 ආණ්ඩුවේ ආධාර මුදල්

ආධාර මුදල් භාර ගන්නා බවට සහ ඊට අදාල කොන්දේසි සියල්ලක්ම ඉටු කරනු ලබන බවට සාධාරණ සහතිකයක් තිබෙන අවස්ථාවලදී ආණ්ඩුවේ ආධාර මුදල් පිළිගනු ලැබේ. ආධාර මුදල වියදම් අයිතමයක් හා සම්බන්ධ වන අවස්ථාවකදී එය හානිපූර්ණය කිරීමට අපේක්ෂා කරන පිරිවැය වියදම් කරනු ලබන කාල පරිච්ඡේද පුරා ක්‍රමානුකූල පදනමක් මත ආදායමක් ලෙස පිළිගනු ලැබේ.

ආධාර මුදල වත්කමක් හා සම්බන්ධ වන විට, එය අදාල වත්කමෙහි අපේක්ෂිත ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා සමාන කොටස්වලින් ආදායමක් ලෙස පිළිගනු ලැබේ.

ශ්‍රී ලංගමට මූල්‍ය නොවන ආධාර ලැබෙන විට වත්කම හා ආධාර මුදල නාමික මුදල් ගණන් අනුව වාර්තාගත කරනු ලබන අතර අපේක්ෂිත ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරාවට පාදක වූ වත්කමෙහි ප්‍රතිලාභයෙහි පරිභෝජන රටාවට අනුව සමාන වාර්ෂික කොටස්වලින් ලාභයට හෝ අලාභයට මුදා හරිනු ලැබේ. පවත්නා අදාල වෙළෙඳපොල පොළී ප්‍රමාණයට අඩු පොළී ප්‍රමාණයන් මත ආණ්ඩුව හෝ සම්බන්ධ ආයතන විසින් ණය හෝ ඊට සමාන ආධාර ලබා දෙනු ලබන විට මෙම වාසිදායක පොළිය ආණ්ඩුවෙන් ලැබෙන ආධාරයක් ලෙස සලකනු ලැබේ.

3.19 වියදම් පිළිගැනීම

3.19.1 ක්‍රියාත්මක කිරීමේ වියදම්

ව්‍යාපාරයේ එදිනෙදා කටයුතුවලදී හා දේපල, පිරියත සහ උපකරණ කාර්යක්ෂම තත්ත්වයෙන් පවත්වාගෙන යන යාමේදී දරන සියලුම වියදම් වර්ෂයේ ලාභය ගණන් බැලීමේදී පූර්ණ ආදායම් ප්‍රකාශයට ඇතුළත් කරනු ලැබ ඇත. මූල්‍ය වත්කම් හානියට පත්වීම සෙමෙන් අලෙවි වන තොග දන්නා සියලුම බැරකම් හා දේපල, පිරියල සහ උපකරණ ක්ෂය කිරීම සඳහාද ප්‍රතිපාදන සලස්වා තිබේ.

3.19.2 කල්බදු ගෙවීම්

ක්‍රියාත්මකව පවතින කල්බදු යටතේ කරනු ලබන ගෙවීම් කල්බදු කාලපරිච්ඡේදය තුළ සරල රේඛා පදනම මත ලාභාලාභ ගිණුමේ පිළිගනු ලැබේ.

මූල්‍ය කල්බදු යටතේ කරනු ලබන අවම කල්බදු ගෙවීම, මූල්‍ය වියදම සහ හිඟව පවත්නා බැරකමේ අඩුවීම අතරේ අනුපාතිකව බෙදා වෙන් කරනු ලැබේ. බැරකමේ ඉතිරි ශේෂය මත අඛණ්ඩ කාලීන පොළී ප්‍රමාණයක් ඇති වන පරිදි මූල්‍ය වියදම කල්බදු කාල පරිච්ඡේදය තුළ එක් එක් කාල පරිච්ඡේදය සඳහා වෙන් කරනු ලැබේ.

3.19.3 ණයට ගැනීමේ පිරිවැය

වත්කමක අපේක්ෂිත භාවිතය හෝ විකිණීම සඳහා එය සූදානම් කිරීම පිණිස අත්‍යාවශ්‍යයෙන්ම සැලකිය යුතු කාලයක් ගත වන වත්කම් අත්කර ගැනීම ඉදිකිරීම හෝ නිෂ්පාදන සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි ණයට ගැනීමේ පිරිවැය අදාල වත්කම්වල කොටසක් ලෙස ප්‍රාග්ධනගත කරනු ලැබේ. පොළිය සහ අරමුදල් ණයට ගැනීම සම්බන්ධයෙන් මණ්ඩලය දරන සෙසු පිරිවැය ණයට ගැනීමේ පිරිවැයට ඇතුළත් වේ.

3.19.4 ශුද්ධ මූල්‍ය ආදායම/ වියදම

මූල්‍ය ආදායම සමන්විත වන්නේ ආයෝජනය කරන ලද අරමුදල් සහ කාර්යය මණ්ඩල ණය මත ලැබෙන පොළී ආදායම සහ ලාභාලාභ ගිණුම මඟින් සාධාරණ වටිනාකමට අනුව මූල්‍ය සම්පත්වල සාධාරණ වටිනාකමේ සිදුවන වෙනස්කම්වලිනි. පොළී ආදායම ලාභාලාභ ගිණුමේ උපචිත වන ආකාරයට ඵලදායී පොළී ක්‍රමය භාවිතා කරමින් පිළිගනු ලැබේ.

මූල්‍ය පිරිවැය සමන්විත වන්නේ ණය ගැනීම් මත පොළී වියදම් ප්‍රතිපාදන මත වට්ටම් ලිහිල් කිරීම ලාභාලාභ ගිණුම මඟින් සාධාරණ වටිනාකමට අනුව මූල්‍ය සම්පත්වල සාධාරණ වටිනාකමේ සිදුවන වෙනස්කම් මූල්‍ය වත්කම් මත පිළිගන්නා ගන්නා ලද භානිකාරක අලාභ සහ සුදුසුකම් ලබන වත්කමක් අත්පත් කරගැනීමට, ඉදිකිරීමට හෝ නිෂ්පාදනය කිරීමට සෘජුව ආරෝපණය කළ නොහැකි ණය ගැනීම් පිරිවැය යනාදියෙන් වන අතර ඵලදායී පොලී ක්‍රමය භාවිතා කරමින් ලාභාලාභ ගිණුමේ පිළිගනු ලැබේ.

3.20 සම්බන්ධ පාර්ශව ගනුදෙනු

එක් පාර්ශවයකට අනෙක් පාර්ශවය සම්බන්ධයෙන් මූල්‍ය සහ ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිපත්ති තීරණ කෙරෙහි පාලනය කිරීමේ හෝ සැලකිය යුතු තරමේ බලපෑම් කිරීමේ හැකියාවක් ඇති ගනුදෙනු සම්බන්ධයෙන් මිළක් අය කරගනු ලැබේද නැද්ද යන බව නොසලකාම එළිදරව් කිරීම් සිදු කර තිබේ.

3.21 මුදල් ප්‍රවාහය

“ වක්‍ර ක්‍රමය ” භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා ලැබුණු පොළිය සහ ලැබුණු ලාභාංශ ආයෝජන මුදල් ප්‍රවාහ ලෙස වර්ගීකරණය කරනු ලැබ ඇති අතර, ගෙවන ලද ලාභාංශ සහ ගෙවන ලද ලාභාංශ සහ ගෙවන ලද පොළිය මූල්‍යකරණ මුදල් ප්‍රවාහ ලෙස වර්ගීකරණය කරනු ලැබ ඇත.

3.22 වාර්තා කිරීමෙන් පසුව සිදුවන සිද්ධි

වාර්තාකරණ කාල පරිච්ඡේදයෙන් පසුව සිදුවන සිද්ධීන් යනු වාර්තාකරණ කාල පරිච්ඡේදයේ අවසානය සහ මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීමට අවසර දෙනු ලැබූ දිනය අතරතුර සිදුවන වාසිසහගත සහ වාසිසහගත නොවන සිද්ධීන්ය.

වාර්තාකරණ කාල පරිච්ඡේදයෙන් පසුව සිදුවන සිදුවීම්වල වැදගත්කම සැලකිල්ලට ගනු ලබන අතර, අවශ්‍ය අවස්ථාවලදී මූල්‍ය ප්‍රකාශවල සුදුසු ගැලපීම් හෝ එළිදරව් කිරීම් සිදු කරනු ලැබේ.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ

2017 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය

(සියළු සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලිනි)

වත්කම්	සටහන්	2017.12.31	2016.12.31
ජංගම නොවන වත්කම්		රු.	රු.
දේපල පිරියත හා උපකරණ	01	10,340,953,795.10	11,074,489,726.67
වෙනත් මූල්‍ය වත්කම්	02	34,715,625.00	33,187,500.00
කෙරිගෙන යන වැඩ - ගොඩනැගිලි		1,979,981.66	49,230,113.33
අක්‍රිය ගිණුම	03	9,935,459,128.35	9,935,459,128.35
		20,313,108,530.11	**21,092,366,468.35**
ජංගම වත්කම්			
තොගය	04	1,152,423,351.51	966,282,963.41
වෙළඳ සහ වෙනත් ලැබිය යුතු	05	2,578,805,886.07	2,604,212,422.26
වෙනත් මූල්‍ය වත්කම්	06	722,230,401.83	507,506,924.57
මුදල් හා මුදල් වලට සමාන දෑ	07	3,629,870,322.71	3,129,581,014.93
මුළු ජංගම වත්කම්		**8,083,329,962.12**	**7,207,583,325.18**
මුළු වත්කම්		**28,396,438,492.23**	**28,299,949,793.53**
ස්කන්ධය හා වගකීම්			
ස්කන්ධය හා සංචිත			
ස්කන්ධ ප්‍රාග්ධනය		350,000,000.00	350,000,000.00
සමුච්චිත අලාභය	08	(43,540,320,699.21)	(45,122,503,972.91)
භාණ්ඩාගාර කොටස් ප්‍රාග්ධනය		3,944,890,550.00	3,944,890,550.00
සේවක කොටස්		411,144,470.00	411,144,470.00
රජයේ ප්‍රතිදාන	09	2,981,392,312.95	2,981,392,312.95
සංචිත	10	5,470,757,941.09	5,470,757,941.09
විකිණීම සඳහා ඇති සංචිත		34,465,625.00	32,937,500.00
මුළු ස්කන්ධය		**(30,347,669,800.17)**	**(31,931,381,198.86)**
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික සඳහා වෙන්කිරීම්	11	14,507,027,675.50	13,600,701,184.62
වෙනත් ජංගම නොවන වගකීම්	12	3,965,136,292.55	6,242,426,105.76
අක්‍රිය ගිණුම	13	26,054,954,882.06	26,054,954,882.06
		44,527,118,850.11	**45,898,082,172.44**
ජංගම වගකීම්			
වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු	14	13,521,208,530.62	13,443,997,348.07
බැංකු අයිරාව	07	695,780,911.67	889,251,471.89
මුළු ජංගම වගකීම්		**14,216,989,442.29**	**14,333,248,819.96**
මුළු ස්කන්ධ හා වගකීම්		**28,396,438,492.23**	**28,299,949,793.53**

01 සිට 21 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

.....	.....	.....
සභාපති	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී- මුදල්	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය.	ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය.	ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

2017 ජනවාරි 01 සිට 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා ලාභාලාභ වාර්තාව

-

(සියළු සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලිනි)		2017 රු.	2016 රු.
විස්තරය	සටහන්		
ආදායම	15	33,928,662,066.75	30,260,909,879.80
මෙහෙයුම් වියදම්	16	34,143,564,271.79	34,566,216,508.75
ක්ෂයකිරීම්වලට පෙර මෙහෙයුම් ලාභය/ (අලාභය)		**(214,902,205.04)**	**(4,305,306,628.95)**
වෙනත් ආදායම්	17	12,315,919,738.55	13,149,498,370.04
වෙනත් ආදායම් ගැලපීමෙන් පසු ලාභය/(අලාභය)		**12,101,017,533.51**	**8,844,191,741.09**
පරිපාලන වියදම්	18	10,726,847,931.00	10,327,880,818.69
ක්ෂයවලට පසු මෙහෙයුම් ලාභය/ (අලාභය)		**1,374,169,602.51**	**(1,483,689,077.60)**
මූල්‍ය හා වෙනත් වියදම්	19	735,401,293.11	720,243,563.50
මූල්‍ය ආදායම්		80,426,024.50	56,663,229.15
ශුද්ධ මූල්‍ය පිරිවැය		**(654,975,268.61)**	**(663,580,334.35)**
නිෂ්පාදන අලාභයට පෙර ලාභ/ (අලාභ)		**719,194,333.90**	**(2,147,269,411.94)**
නිෂ්පාදන අලාභය	20	67,225,998.59	129,115,453.55
රාජ්‍ය ප්‍රතිපාදන හා වෙන්කිරීම්වලට පෙර ලාභ/ (අලාභ)		**651,968,335.31**	**(2,276,384,865.49)**
රාජ්‍ය ප්‍රතිපාදන හා වෙන්කිරීම්	21	964,741,253.85	1,643,765,692.04
වර්ෂයේ ශුද්ධ ලාභ/ (අලාභය)		**1,616,709,589.16**	**(632,619,173.46)**
වෙනත් විස්තීර ආදායම්			
මූල්‍ය වත්කම්වල ශුද්ධ සාධාරණ වටිනාකම (AFS)		1,528,125.00	(14,468,750.00)
වර්ෂය සඳහා වෙනත් විස්තීර ආදායම්		**1,528,125.00**	**(14,468,750.00)**
වර්ෂය සඳහා මුළු විස්තීර ආදායම		**1,618,237,714.16**	**(618,150,423.46)**

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

(සියළු සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලිනි)	2017	2016
මෙහෙයුම් කටයුතු තුලින් ජනිත වූ මුදල් ප්‍රවාහය		
ශුද්ධ ලාභය/ (අලාභය)	1,616,709,589	(632,619,173)
ගැලපුම්		
ක්ෂය	2,120,238,485	2,053,500,078
ලාභ/ අලාභ ගැලපුම්	(34,526,315)	6,459,103,136
රජයේ ප්‍රතිදාන - වර්ෂය තුල නිදහස් කරන ලද	(964,741,254)	(1,643,765,692)
පොළි ආදායම්	(80,426,025)	(56,663,229)
මූල්‍ය පිරිවැය	735,401,293	720,243,563
බස් රථ ඉවත් කිරීමේ ලාභය	(88,428,250)	(30,681,282)
අඩමාණ ණය සඳහා වෙන් කිරීම	(303,063)	(5,312,181)
පාරිතෝෂික සඳහා වෙන් කිරීම්	3,588,757,243	1,144,831,512
මෙහෙයුම් ලාභය/(අලාභය) මෙහෙයුම් ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර	**6,892,681,703**	**8,008,636,732**
තොගය වැඩිවීම්/ අඩුවීම්	(186,140,388)	(93,979,747)
ලැබිය යුතු වෙළෙඳ හා වෙනත් ලැබීම් වැඩිවීම්/ අඩුවීම්	25,709,600	363,384,723
කෙරිගෙන යන වැඩ වැඩිවීම්/ අඩුවීම්	47,250,132	-
ණයහිමියෝ වැඩිවීම්/ අඩුවීම්	1,787,815,527	386,503,425
උපචිත වියදම් වැඩිවීම්/ අඩුවීම්	(1,530,443,997)	(1,889,342,758)
ජංගම වත්කම් (අක්‍රිය ගිණුම්) අඩු වීම්/වැඩි වීම්	-	(84,034)
ජංගම වගකීම් (අක්‍රිය ගිණුම්) අඩු වීම්/වැඩි වීම්	-	6,100
මෙහෙයුම් කටයුතුවලින් ජනිත වූ මුදල් ප්‍රවාහය	**7,036,872,576**	**6,775,124,441**
පාරිතෝෂික ගෙවීම්	(2,682,430,752)	(4,265,421,472)
මෙහෙයුම් කටයුතු සඳහා යෙදවූ මුදල්	**4,354,441,824**	**2,509,702,969**
ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ජනිත වූ මුදල් ප්‍රවාහය		
දේපල පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම්	(1,387,384,553)	(81,424,894)
ඉවත් කිරීම හා විකිණීම තුලින් ලැබෙන මුදල්	89,110,250	30,974,282
වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	(215,627,830)	(30,665,089)
කෙටි කාලීන ආයෝජන ඉවත් කිරීම හා විකිණීම තුලින් ලැබෙන මුදල්	904,352	(2,909,207)
පොළී ආදායම	80,426,025	56,663,229
ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ජනිත වූ මුදල් ප්‍රවාහය	**(1,432,571,756)**	**(27,361,679)**
මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ජනිත වූ මුදල් ප්‍රවාහය		
මූල්‍ය පිරිවැය	(545,947,848)	(396,844,389)
රජයේ ප්‍රතිදාන ලැබීම්	964,741,254	2,547,871,304
ශුද්ධ සංචලන කල්බදු ණයහිමි/කල්බදු ගෙවීම්	(2,646,903,606)	(2,510,917,552)
මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ජනිත වූ මුදල් ප්‍රවාහය	**(2,228,110,200)**	**(359,890,637)**
වසර මුදල් හා මුදල් වලට ආසන්න අයිතමයන් (අඩුවීම්/වැඩිවීම්)	**693,759,868**	**2,122,450,653**
වසර ආරම්භයේ මුදල් හා මුදල් වලට ආසන්න අයිතමයන්ගේ ශේෂය	**2,240,329,543**	**117,878,890**
වසර අවසාන මුදල් හා මුදල් වලට ආසන්න අයිතමයන්ගේ ශේෂය	**2,934,089,411**	**2,240,329,543**

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ

2017දෙසැම්බර් 31 දිනට නිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

(සියළු සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලිනි)

	ස්කන්ධ ප්‍රාග්ධනය	සේවක කොටස්	රජයේ ප්‍රතිදාන	සංචිත	භාණ්ඩාගාර කොටස් ප්‍රාග්ධනය	විකිණීම සඳහා ඇති සංචිත	සමුච්චිත ලාභය/ අලාභය	එකතුව
2015.12.31 දිනට ශේෂය	350,000,000.00	411,144,470.00	2,981,392,312.95	5,470,757,941.09	3,944,890,550.00	32,937,500.00	(45,122,503,972.91)	(31,931,381,198.87)
ආරම්භක ශේෂයට කල ගැලපුම්								-
වර්ෂයේ එකතු කිරීම්							(34,526,315.46)	(34,526,315.46)
වර්ෂයේ ඉවත් කිරීම්							-	
2016.12.31 දිනට ගැලපුම් කරන ලද ශේෂය	**350,000,000.00**	**411,144,470.00**	**2,981,392,312.95**	**5,470,757,941.09**	**3,944,890,550.00**	**32,937,500.00**	**(45,157,030,288.37)**	**(31,965,907,514.33)**
වර්ෂයේ එකතු කිරීම්	-	-		-	-	-	1,616,709,589.16	1,616,709,589.16
වර්ෂයේ ඉවත් කිරීම්	-	-		-	-	1,528,125.00		1,528,125.00
විස්තරාත්මක ආදායම් ලාභය/අලාභය								
2017.12.31 දිනට ශේෂය	**350,000,000.00**	**411,144,470.00**	**2,981,392,312.95**	**5,470,757,941.09**	**3,944,890,550.00**	**34,465,625.00**	**(43,540,320,699.21)**	**(30,347,669,800.17)**

(සියළු සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලිනි)

01.දේපල පිරියත හා උපකරණ

නිදහස් දේපල

	ඉඩම් හා ගොඩනැගිලි	පිරියත හා යන්ත්‍රෝපකරණ	කාර්යාල උපකරණ	මෝටර් රථ	ධාවනයෙන් ඉවත් කළ වෙනත් වාහන	වායු සමීකරණ	පරිගණක
2015.12.31 දිනට ශේෂය	319,799,318.62	143,518,090.40	146,766,327.12	255,838,752.76	1,041,195.32	7,528,897.24	42,506,956.72
ගැලපුම්							
එකතු කිරීම්							
ඉවත් කිරීම්							
2016.12.31 දිනට ශේෂය	**319,799,318.62**	**143,518,090.40**	**146,766,327.12**	**255,838,752.76**	**1,041,195.32**	**7,528,897.24**	**42,506,956.72**
කල්බදු වත්කම් මාරුකිරීම්							
එකතු කිරීම්	47,250,131.67	19,454,448.37	5,904,062.53	38,160,500.00	-	901,400.12	11,086,994.50
ඉවත් කිරීම්							
2017.12.31 දිනට ශේෂය	**367,049,450.29**	**162,972,538.77**	**152,670,389.65**	**293,999,252.76**	**1,041,195.32**	**8,430,297.36**	**53,593,951.22**

කල්බදු වත්කම්

	ඉඩම් හා ගොඩනැගිලි	පිරියත හා යන්ත්‍රෝපකරණ	කාර්යාල උපකරණ	මෝටර් රථ	ධාවනයෙන් ඉවත් කළ වෙනත් වාහන	වායු සමීකරණ	පරිගණක
2015.12.31 දිනට ශේෂය	-	-					-
ගැලපුම්							
එකතු කිරීම්							
ඉවත් කිරීම්							
2016.12.31 දිනට ශේෂය	-	-					-
නිදහස් දේපල මාරුකිරීම්							
එකතු කිරීම්							
ඉවත් කිරීම්							
2017.12.31 දිනට ශේෂය	-	-					-

(සියළු සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් ද

01.දේපල පිරියත හා උපකරණ

නිදහස් දේපල

	බස්රථ	ධාවනයෙන් ඉවත් කල බස්රථ	තුවක්කු	බස්රථ එන්ජින්	ටිකට් මැෂින්	වෙනත් වත්කම්	පරිසණක මෘදුකාංග	එකතුව
2015.12.31 දිනට ශේෂය	12,594,954,109.28	1,367,754,792.20	34,750.00	1,004,482,160.40	154,972,383.94	35,591,118.21	9,510,486.00	16,084,299,338.21
ගැලපුම්								-
								-
එකතු කිරීම්		-						-
ඉවත් කිරීම්								-
2016.12.31 දිනට ශේෂය	**12,594,954,109.28**	**1,367,754,792.20**	**34,750.00**	**1,004,482,160.40**	**154,972,383.94**	**35,591,118.21**	**9,510,486.00**	**16,084,299,338.21**
								-
කල්බදු වත්කම් මාරුකිරීම්	734,400,000.00	-	-	-			-	734,400,000.00
එකතු කිරීම්	-	923,402,386.72		1,132,171,180.23	31,645,396.20	1,810,439.34		2,211,786,939.68
ඉවත් කිරීම්	(923,402,386.72)	(923,402,386.72)						(1,846,804,773.44)
2017.12.31 දිනට ශේෂය	**12,405,951,722.56**	**1,367,754,792.20**	**34,750.00**	**2,136,653,340.63**	**186,617,780.14**	**37,401,557.55**	**9,510,486.00**	**17,183,681,504.45**
								-
								-

කල්බදු වත්කම්

	බස්රථ	ධාවනයෙන් ඉවත් කල බස්රථ	තුවක්කු	බස්රථ එන්ජින්	ටිකට් මැෂින්	වෙනත් වත්කම්	පරිසණක මෘදුකාංග	එකතුව
2015.12.31 දිනට ශේෂය	12,979,201,671.84	-	-	-	-	-	-	12,979,201,671.84
ගැලපුම්								-
								-
එකතු කිරීම්								-
ඉවත් කිරීම්								-
2016.12.31 දිනට ශේෂය	**12,979,201,671.84**	-	-	-	-	-	-	**12,979,201,671.84**
නිදහස් දේපල මාරුකිරීම්	(734,400,000.00)							(734,400,000.00)
එකතු කිරීම්	99,000,000.00				-			99,000,000.00
ඉවත් කිරීම්								-
								-
2017.12.31 දිනට ශේෂය	**13,812,601,671.84**	-	-	-	-	-	-	**12,343,801,671.84**

නිදහස් දේපල

ක්ෂය

	ඉඩම් හා ගොඩනැගිලි	පිරියක හා යන්ත්‍රෝපකරණ	කාර්යාල උපකරණ	මෝටර් රථ	ධාවනයෙන් ඉවත් කළ වෙනත් වාහන	වායු සමීකරණ	පරිගණක
2015.12.31 දිනට ශේෂය(සංශෝධිත)	160,955,158.87	129,724,066.42	113,265,573.79	226,183,213.02	520,385.32	3,169,810.34	36,580,766.61
අධි ක්ෂය ගැලපීම - 2016							
ඉවත් කිරීම්							
2016.12.31 දිනට ශේෂය	**160,955,158.87**	**129,724,066.42**	**113,265,573.79**	**226,183,213.02**	**520,385.32**	**3,169,810.34**	**36,580,766.61**
වර්ෂයේ ක්ෂය	886,501.72	2,936,937.49	6,904,085.81	9,730,992.60	-	761,286.86	5,706,846.96
එකතු කිරීම්							
ඉවත් කිරීම්							
කල්බදු වත්කම් ක්ෂය මාරුකිරීම්							
2017.12.31 දිනට ශේෂය	**161,841,660.59**	**132,661,003.91**	**120,169,659.60**	**235,914,205.62**	**520,385.32**	**3,931,097.20**	**42,287,613.57**

කල්බදු වත්කම්

ක්ෂය	ඉඩම් හා ගොඩනැගිලි	පිරියක හා යන්ත්‍රෝපකරණ	කාර්යාල උපකරණ	මෝටර් රථ	ධාවනයෙන් ඉවත් කළ වෙනත් වාහන	වායු සමීකරණ	පරිගණක
2015.12.31 දිනට ශේෂය	-	-					-
ගැලපුම්							
එකතු කිරීම්							
ඉවත් කිරීම්							
2016.12.31 දිනට ශේෂය	-	-					-
වර්ෂයේ ක්ෂය							
එකතු කිරීම්							
ඉවත් කිරීම්							
නිදහස් දේපල ක්ෂය මාරුකිරීම්							
2017.12.31 දිනට ශේෂය	-	-					-
මුලු වත්කම්	**367,049,450.29**	**162,972,538.77**	**152,670,389.65**	**293,999,252.76**	**1,041,195.32**	**8,430,297.36**	**53,593,951.22**
මුලු ක්ෂය කිරීම්	**161,841,660.59**	**132,661,003.91**	**120,169,659.60**	**235,914,205.62**	**520,385.32**	**3,931,097.20**	**42,287,613.57**
ශුද්ධ පොත් අගය	**205,207,789.70**	**30,311,534.86**	**32,500,730.05**	**58,085,047.14**	**520,810.00**	**4,499,200.16**	**11,306,337.65**

නිදහස් දේපල

ක්ෂය

	බස්රථ	ධාවනයෙන් ඉවත් කල බස්රථ	තුවක්කු	බස්රථ එන්ජින්	ටිකට් මැෂින්	වෙනත් වත්කම්	පරිසණක මෘදුකාංග	එකතුව
2015.12.31 දිනට ශේෂය(සංශෝධිත)	11,344,840,445.00	1,368,047,792.20	34,750.00	1,003,657,160.40	70,742,169.65	13,924,148.70		14,471,645,440.32
අධි ක්ෂය ගැලපීම - 2016		(293,000.00)						(293,000.00)
ඉවත් කිරීම්								-
								-
2016.12.31 දිනට ශේෂය	**11,344,840,445.00**	**1,367,754,792.20**	**34,750.00**	**1,003,657,160.40**	**70,742,169.65**	**13,924,148.70**	-	**14,471,352,440.32**
								-
වර්ෂයේ ක්ෂය	1,953,057,971.18		-	107,165,886.70	29,949,796.02	3,138,179.19	-	2,120,238,484.53
එකතු කිරීම්		922,720,386.72				-		922,720,386.72
ඉවත් කිරීම්	(922,720,386.72)	(922,720,386.72)						(1,845,440,773.44)
කල්බදු වත්කම් ක්ෂය මාරුකිරීම්	275,374,500.00							275,374,500.00
2017.12.31 දිනට ශේෂය	**12,650,552,529.46**	**1,367,754,792.20**	**34,750.00**	**1,110,823,047.10**	**100,691,965.67**	**17,062,327.89**	-	**15,944,245,038.13**
								-

කල්බදු වත්කම්

ක්ෂය	බස්රථ	ධාවනයෙන් ඉවත් කල බස්රථ	තුවක්කු	බස්රථ එන්ජින්	ටිකට් මැෂින්	වෙනත් වත්කම්	පරිසණක මෘදුකාංග	එකතුව
2015.12.31 දිනට ශේෂය	3,517,658,843.06	-	-	-		-	-	3,517,658,843.06
ගැලපුම්								-
එකතු කිරීම්								-
ඉවත් කිරීම්								-
								-
2016.12.31 දිනට ශේෂය	**3,517,658,843.06**	-	-	-		-	-	**3,517,658,843.06**
								-
වර්ෂයේ ක්ෂය								-
එකතු කිරීම්								-
ඉවත් කිරීම්								(275,374,500.00)
නිදහස් දේපල ක්ෂය මාරුකිරීම්	(275,374,500.00)							
2017.12.31 දිනට ශේෂය	**3,242,284,343.06**	-	-	-		-	-	**3,242,284,343.06**
මුලු වත්කම්	**26,218,553,394.40**	**1,367,754,792.20**	**34,750.00**	**2,136,653,340.63**	**186,617,780.14**	**37,401,557.55**	**9,510,486.00**	**29,527,483,176.29**
මුලු ක්ෂය කිරීම්	**15,892,836,872.52**	**1,367,754,792.20**	**34,750.00**	**1,110,823,047.10**	**100,691,965.67**	**17,062,327.89**	-	**19,186,529,381.19**
ශුද්ධ පොත් අගය	**10,325,716,521.88**	-	-	**1,025,830,293.53**	**85,925,814.47**	**20,339,229.66**	**9,510,486.00**	**10,340,953,795.10**

	පිරිවැය - ඉඩම් හා ගොඩනැගිලි	2017.12.31	2016.12.31
101-1	ඉඩම් හා ගොඩනැගිලි	270,039,443.14	270,039,443.14
101-1-A	වෙස්කෝ - ඉඩම් හා ගොඩනැඟිලි	17,606,792.92	17,606,792.92
101-1-B	ඩිපෝ/ ගරාජ් - ඉඩම් හා ගොඩනැඟිලි	12,780,411.77	12,780,411.77
101-1-C	ඉඩම් සහ ගොඩනැගිලි - (තාවකාලික)	540,742.70	540,742.70
101-1-D	ඉඩම් හා ගොඩනැගිලි - (නවාතැන්)	14,007,685.89	14,007,685.89
101-1-E	ඉඩම් හා ගොඩනැගිලි - (වෙනත්)	51,774,373.87	4,524,242.20
101-1-F	ශ්‍රී ලංගම - ක්‍රීඩාපිටිය	300,000.00	300,000.00
	එකතුව	**367,049,450.29**	**319,799,318.62**

	පිරිවැය - මෝටර් රථ	2017.12.31	2016.12.31
101-5-A	වෑන්, ලොරි සහ වෙනත් රථ	271,472,828.03	239,513,228.03
101-5-B	කාර්, යතුරු පැදි සහ බයිසිකල්	22,526,424.73	16,325,524.73
	එකතුව	**293,999,252.76**	**255,838,752.76**

	ක්ෂය වෙන්කිරීම් - ඉඩම් හා ගොඩනැඟිලි	2017.12.31	2016.12.31
104-1-A	ඉඩම් සහ ගොඩනැගිලි - (තාවකාලික)	540,742.70	540,742.70
104-1-B	ඉඩම් හා ගොඩනැගිලි	139,599,071.83	138,713,131.86
104-1-C	ඉඩම් හා ගොඩනැඟිලි - වේරහැර	8,742,038.00	8,742,038.00
104-1-D	ඉඩම් හා ගොඩනැඟිලි - ඩිපෝ/ ගරාජ්	5,947,599.68	5,947,599.68
104-1-E	ඉඩම් හා ගොඩනැඟිලි - බස්	4,981,605.27	4,981,043.52
104-2	ඉඩම් හා ගොඩනැඟිලි - වෙනත්	2,030,603.11	2,030,603.11
	එකතුව	**161,841,660.59**	**160,955,158.87**

02. වෙනත් මූල්‍ය වත්කම්

විකිණිය හැකි ආයෝජන

ගිණුම් සංකේත	විස්තරය	2017.12.31			2016.12.31		
		කොටස් ගණන	පිරිවැය	වෙළෙඳ අගය	කොටස් ගණන	පිරිවැය	වෙළෙඳ අගය
105-2-D	ලංකා අශෝක් ලේලන්ඩ් සමාගම - කොටස් ආයෝජනය	31250	250,000.00	34,715,625.00	31250	250,000.00	33,187,500.00
	එකතුව	31250	250,000.00	**34,715,625.00**	31250	250,000.00	**33,187,500.00**

සටහන්	නොනිමි වැඩ - ගොඩනැගිලි ගිණුම	2017.12.31	2016.12.31
		රු.	රු.
102-2	නොනිමි වැඩ - ගොඩනැගිලි ගිණුම	49,230,113.33	49,230,113.33
	නිදහස් දේපල මාරුකිරීම්	(47,250,131.67)	
	2017.12.31 දිනට ශේෂය	**1,979,981.66**	**49,230,113.33**

03. අක්‍රිය ගිණුම්

		2017.12.31	2016.12.31
		රු.	රු.
203-2-13	අක්‍රිය ගිණුම් - හර ශේෂ	9,935,459,128.35	9,935,459,128.35
	එකතුව	**9,935,459,128.35**	**9,935,459,128.35**

04. තොගය

ගිණුම් සංකේත	විස්තරය	2017.12.31 රු.	2016.12.31 රු.
106-1	තොග ගිණුම	971,538,630.12	817,776,589.64
106-2	ඉන්ධන ගිණුම	123,607,411.20	116,123,597.04
106-3	ආයුධ හා උපකරණ ගිණුම	8,056,161.27	2,643,648.85
106-4	මාර්ගස්ථ තොගය ගිණුම	42,340,852.69	25,120,440.14
	නොනිමි වැඩ (ප්‍රාදේශීය වැඩපල) ගිණුම	6,880,296.23	4,618,687.74
	එකතුව	**1,152,423,351.51**	**966,282,963.41**

05. වෙළඳ හා වෙනත් ලැබිය යුතු ගිණුම්

05.1 අත්තිකාරම්

ගිණුම් සංකේත	විස්තරය	2017.12.31 රු.	2016.12.31 රු.
107-1	වේතන අත්තිකාරම් ගිණුම - 4040	15,416,483.88	12,317,349.62
107-2	උත්සව අත්තිකාරම් ගිණුම - 5012	148,485,752.07	95,100,278.44
107-3	ක්‍රීඩා අත්තිකාරම් ගිණුම - 5012/1	8,473,707.35	8,935,286.95
107-4	විශේෂ ණය අත්තිකාරම් ගිණුම - 5012/2	3,326,177.92	9,205,107.92
107-5	වෙනත් අත්තිකාරම් ගිණුම	14,413,854.22	11,908,773.37
107-6	ස්ථානීය මිලදී ගැනීම් අත්තිකාරම් ගිණුම	1,566,251,070.87	1,635,847,558.26
107-7	ශ්‍රී ලංගම අත්තිකාරම් ගිණුම	3,025,977.50	6,497,765.88
107-8	විශේෂ අත්තිකාරම් ගිණුම - 4040/1	724,701.19	853,673.25
	එකතුව	**1,760,117,725.00**	**1,780,665,793.69**

05.2 වෙනත් ලැබිය යුතු ගිණුම්

ගිණුම් සංකේත	විස්තරය	2017.12.31 රු.	2016.12.31 රු.
108-1	විවිධ ණය ගැනියෝ ගිණුම	111,795,741.57	101,155,750.06
108-2	වෙළෙඳ ණය ගැනියෝ ගිණුම	20,074,155.09	19,632,109.73
108-3	ලැබිය යුතු ආදායම් ගිණුම	243,166,958.35	233,785,840.62
108-4	යුධ හමුදා - ලැබිය යුතු කුලී ගිණුම	136,922,501.07	199,354,786.76
108-5	පොලිස් ගමන් බලපත්‍ර ලැබිය යුතු ගාස්තු ගිණුම	282,304,641.68	246,396,779.18
108-6	උසාවි ඇප තැන්පත් ගිණුම	7,430,520.79	7,431,520.78
108-7	වෙනත් තැන්පතු ගිණුම	4,514,383.46	4,275,848.13
108-8	කොන්දොස්තර ගිහ මුදල	7,687,289.99	11,595,695.50
108-9	පරිත්‍යාග - සුනාමි	-	-
108-10	විශ්වාස ඇප අරමුදල් ගිණුම	108,534.76	335,605.25
108-11	ඉන්ධන විකුණුම් පාලන ගිණුම	2,298,220.05	2,152,605.95
108-12	ලක්දිව ඉංජිනියරින් - ඒකල	2,955.50	(7,594.00)
108-13	මුදල් අයකැමි හිඟය ගිණුම	34,388,213.51	34,776,498.80
108-14	ඉදිරියට ගෙවූ වියදම් ගිණුම	7,707,245.14	2,677,445.13
108-23	බොල් ණය සඳහා වෙන්කිරීම් ගිණුම	(39,713,199.89)	(40,016,263.32)
	එකතුව	**818,688,161.07**	**823,546,628.57**
	එකතුව	**2,578,805,886.07**	**2,604,212,422.26**

6. වෙනත් මූල්‍ය වත්කම්

ගිණුම් සංකේත	විස්තරය	2017.12.31 රු.	2016.12.31 රු.
105-1	භාණ්ඩාගාර බිල්පත් ගිණුම	7,749,998.26	7,749,998.34
105-2-B	විශ්වාස ඇප ආයෝජන ගිණුම	486,167.17	459,734.64
105-2-C	සේවක ආරක්ෂක ඇප ආයෝජන ගිණුම	34,404,126.99	24,853,227.24
105-2-D	ස්ථාවර තැන්පතු ගිණුම	677,394,983.87	471,344,486.42
105-2-F	වෙනත් ආයෝජන ගිණුම	2,195,125.54	3,099,477.93
	එකතුව	**722,230,401.83**	**507,506,924.57**

7. මුදල් හා මුදල් වලට සමාන දෑ

ගිණුම් සංකේත	විස්තරය	2017.12.31 රු.	2016.12.31 රු.
105-2-A	කෙටි කාලීන ආයෝජන	3,494,735.37	551,000.00
105-2-E	ඉතිරි කිරීමේ ගිණුම්	1,115,827,630.46	894,689,424.39
	එකතුව	**1,119,322,365.83**	**895,240,424.39**

07. බැංකුවේ ඇති මුදල්

ගිණුම් සංකේත	විස්තරය	2017.12.31 රු.	2016.12.31 රු.
109-1	ප්‍රධාන කාර්යාලය	1,530,697,794.96	1,079,539,867.45
	ප්‍රාදේශීය කාර්යාලය හා ඩිපෝ	419,653,025.37	682,787,495.97
	ප්‍රාදේශීය වැඩපල, රියදුරු අභ්‍යාස විද්‍යාල හා ඉන්ධන පිරහුම්හල්	190,729,298.65	94,231,541.79
	එකතුව	**2,141,080,118.98**	**1,856,558,905.21**

07. බැංකු අයිරාව

ගිණුම් සංකේත	විස්තරය	2017.12.31 රු.	2016.12.31 රු.
109-1	ප්‍රධාන කාර්යාලය	472,101,231.07	622,146,516.33
	ප්‍රාදේශීය කාර්යාලය හා ඩිපෝ	223,679,680.60	267,104,955.56
	එකතුව	**695,780,911.67**	**889,251,471.89**

07. අතැති මුදල්

ගිණුම් සංකේත	විස්තරය	2017.12.31 රු.	2016.12.31 රු.
110-1	අතැති මුදල් ගිණුම	28,648,092.60	14,537,045.68
110-2	සුළු මුදල් අග්‍රිමය ගිණුම	2,088,762.76	2,211,229.61
110-3	මාර්ගස්ථ මුදල් ගිණුම	129,607,514.49	233,489,397.98
110-4	මුද්දර අග්‍රිමය ගිණුම	129,080.00	106,723.00
110-5	නිල වාහන අග්‍රිමය	591,236.50	564,651.42
110-6	ආදායම් අවිනිශ්චිත ගිණුම	208,403,151.55	126,872,637.64
	එකතුව	**369,467,837.90**	**377,781,685.33**

08. සමුච්චිත අලාභය

		2017.12.31	2016.12.31
	සමුච්චිත අලාභය	රු.	රු.
201	පෙර වර්ෂයේ සමුච්චිත අලාභය	(45,122,503,972.91)	(40,456,366,711.46)
	පාරිතෝෂික අඩුවෙන් ගණනය 2015	-	(7,056,959,842.92)
	ක්ෂය වැඩියෙන් ගණනය 2015	-	2,924,748.82
	ගැලපීම් සිදුකළ ශේෂය	(45,122,503,972.91)	(47,510,401,805.56)
	පාරිතෝෂික අඩුවෙන් ගණනය 2016	-	(4,026,356,194.97)
	ක්ෂය වැඩියෙන් ගණනය 2016	-	293,000.00
201-1	එකතු - පෙර වර්ෂයේ ලාභාලාභ ගැලපුම් ගිණුම	(34,526,315.46)	7,046,580,201.08
	වසර සඳහා ලාභය හෝ අලාභය	1,616,709,589.16	(632,619,173.46)
	එකතුව	**(43,540,320,699.21)**	**(45,122,503,972.91)**

කොටස් ප්‍රග්ධනය

		2017.12.31	2016.12.31
		රු.	රු.
202-5	කොටස් ප්‍රග්ධනය	3,368,242,400.00	3,368,242,400.00
202-6	කොටස් ප්‍රග්ධනය - භාණ්ඩාගාර ගිණුම	576,648,150.00	576,648,150.00
	එකතුව	**3,944,890,550.00**	**3,944,890,550.00**

09. රජයේ ප්‍රතිදාන

		2017.12.31	2016.12.31
		රු.	රු.
202-3	2017.01.01 දිනට ශේෂය	2,981,392,312.95	2,077,286,701.27
	2017 වර්ෂය සඳහා භාණ්ඩාගාර ලැබීම්	-	1,539,038,388.86
	වර්ෂය සඳහා වෙන්කිරීම්	-	634,932,777.18
	2017.12.31 දිනට ශේෂය	**2,981,392,312.95**	**2,981,392,312.95**

10. සංචිත

		2017.12.31	2016.12.31
		රු.	රු.
201-2	ප්‍රාග්ධන සංචිත ගිණුම	22,295,374.57	22,295,374.57
201-3	රක්ෂණ සංචිත ගිණුම	292,329.36	292,329.36
201-4	සේවක වන්දි අරමුදල් ගිණුම	2,988,322.52	2,988,322.52
201-5	මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ගිණුම	2,667,679.00	2,667,679.00
201-6	වාර ප්‍රවේශපත්‍ර අරමුදල් ගිණුම	272,672.50	272,672.50
201-8	වත්කම් ප්‍රත්‍යාගණන ගිණුම	140,397,051.58	140,397,051.58
201-9	ප්‍රාග්ධන සංචිත හා වෙනත් සංචිත	5,301,844,511.56	5,301,844,511.56
	එකතුව	**5,470,757,941.09**	**5,470,757,941.09**

11. විශ්‍රාමික පාරිතෝෂික සඳහා වෙන් කිරීම්

ගිණුම් සංකේත	විස්තරය	2017.12.31 රු.	2016.12.31 රු.
202-1	වර්ෂයේ ආරම්භක ශේෂය	13,600,701,184.62	5,637,975,107.08
	2015 වර්ෂය සඳහා ගැලපුම්	-	7,056,959,842.92
	ගැලපීම් සිදුකළ ශේෂය	13,600,701,184.62	12,694,934,950.00
	2016 වර්ෂය සඳහා ගැලපුම්	-	4,026,356,194.97
	ප්‍රවර්තන වර්ෂය සඳහා වෙන් කිරීම්	3,588,757,243.11	1,144,831,511.75
	වසර තුළ කරන ලද ගෙවීම්	(2,682,430,752.23)	(4,265,421,472.10)
	වර්ෂයේ අවසාන ශේෂය	**14,507,027,675.50**	**13,600,701,184.62**

12. වෙනත් ජංගම නොවන වගකීම්

ගිණුම් සංකේත	විස්තරය	2017.12.31 රු.	2016.12.31 රු.
202-20	ලංකා අශෝක් ලේලන්ඩ් සමාගම	29,400,000.00	-
202-21	දිගු කාලීන වගකීම් - ශ්‍රී ලංගම අර්ථ සාධක අරමුදල	1,860,824,837.37	1,860,824,837.37
202-22	කල්බදු ණයහිමි - ලංකා බැංකුව	-	50,176,308.00
202-23	කල්බදු ණයහිමි - මහජන බැංකුව	2,244,042,977.96	4,695,590,582.96
202-2	පොලී අවිනිශ්චිත ගිණුම	(169,131,522.78)	(364,165,622.57)
	එකතුව	**3,965,136,292.55**	**6,242,426,105.76**

13. අක්‍රිය ගිණුම්

		2017.12.31 රු.	2016.12.31 රු.
203-2-12	අක්‍රිය ගිණුම් -බැර ශේෂ	26,054,954,882.06	26,054,954,882.06
	එකතුව	**26,054,954,882.06**	**26,054,954,882.06**

14. වෙළඳ හා වෙනත් ගෙවීම්

14.1 ණය හිමියෝ

ගිණුම් සංකේත	විස්තරය	2017.12.31 රු.	2016.12.31 රු.
203-1-1	වෙළෙඳ ණය හිමියෝ ගිණුම	3,506,085,807.42	2,434,887,483.03
203-1-2	ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා ගිණුම	44,935,419.47	49,659,705.20
203-1-3	වෙනත් ණය හිමියෝ ගිණුම	127,397,176.88	137,398,234.55
203-1-4	ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා ගිණුම	606,295.40	725,209.86
203-1-5	අගරු වෙක් ගිණුම	-	7,138,279.35
203-1-6	නොගෙවූ වේතන අඩුකිරීම් ගිණුම	15,528,124.05	16,146,247.82
203-1-7	සුනාමි අරමුදල ගිණුම	879,704.43	879,704.43
203-1-8	ගෙවිය යුතු තෙවන පාර්ශවීය ගෙවීම් ගිණුම	38,866,608.58	49,013,863.21
203-1-9	7070 සේ.අ.අ. ණය ගිණුම	27,750,174.74	27,656,773.49
203-1-10	7082 සේ.අ.අ. රූපවාහිනී ණය ගිණුම	9,297,609.39	9,361,482.39
203-1-11	7075 සේ.අ.අ. නිවාස ණය ගිණුම	211,272,210.58	211,989,835.37
203-1-12	7078 සේ.අ.අ. ණය ගිණුම	576,741.11	582,827.11
203-1-13	දඩ අරමුදල ගිණුම	26,944,823.77	52,777,642.81
203-1-14	ක්‍රීඩා සභා ගිණුම	9,518,118.85	6,649,939.64
203-1-15	වෘත්තීය සමිති ගිණුම	29,739,106.03	32,348,307.43
203-1-16	අවමංගල්‍යාධාර සමිති ගිණුම	64,097,000.43	79,181,800.66
203-1-17	සුභසාධක සංගමය ගිණුම	38,761,249.29	47,834,203.88
203-1-18	ආපනශාලා අයකිරීම් ගිණුම	3,905,713.61	4,734,080.20
203-1-19	බැංකු ණය ගිණුම- (වේතනයෙන් අයවිය යුතු)	42,143,617.43	52,877,199.68
203-1-19	බැංකු ණය ගිණුම	492,599,865.47	714,732,356.51
203-1-20	ගෙවිය යුතු රක්ෂණ ගිණුම	1,361,611.14	1,196,434.39
203-1-21	මුද්දර ගාස්තු අයකිරීම් ගිණුම	19,074,080.24	18,351,745.06
203-1-22	දඩ අයකිරීම් ගිණුම	457,792,134.21	414,058,991.66
203-1-23	දඩ අරමුදලට අයකිරීම් ගිණුම	113,633,402.87	102,478,963.29
203-1-24	නොගෙවූ වේතනයෙන් අඩුකිරීම්	6,478,762.08	8,597,020.07
203-1-25	ටෙන්ඩර් තැන්පතු ගිණුම	16,402,568.18	10,821,070.48
203-1-26	වෙනත් තැන්පතු ගිණුම	5,787,910.52	5,872,396.72
203-1-27	අවිනිශ්චිත ගිණුම	390,909.74	390,909.74
203-1-28	තැන්පතු - බාහිර පාර්ශව ගිණුම	3,378,975.00	2,747,251.74
203-1-29	තැන්පතු - ටෙන්ඩර් (ප්‍රධාන කාර්යාලය) ගිණුම	10,875,805.28	6,467,582.00
203-1-30	සේවක තැන්පතු ගිණුම	148,150,574.34	139,731,869.20
203-1-31	ගෙවිය යුතු විවිධ ගිණුම	24,457,863.69	10,662,079.67
203-1-32	අර්ථසාධක අරමුදල් අධිභාර ගිණුම	91,227,198.28	143,942,364.76
203-1-33	සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් අධිභාර ගිණුම	5,121,707.97	3,798,120.60
203-1-35	ගෙවිය යුතු කුලී ගාස්තු ගිණුම	5,796,342.49	7,292,355.07
203-1-36	ගෙවිය යුතු දොඹකර ගාස්තු ගිණුම	102,260.25	163,110.25
203-1-37	ගෙවිය යුතු යෝග්‍යතා සහතික ගාස්තු ගිණුම	112,144.00	107,743.00
203-1-38	විශ්වාස බැදුම්කර	54,644.46	36,550.20
203-1-51	තැන්පතු - බාහිර පාර්ශව (සේවක ආරක්ෂණ)	457,000.00	454,000.00
203-1-54	කල්බදු ණයහිමි - මහජන බැංකුව	2,401,547,605.09	2,077,579,757.00
203-1-55	කල්බදු ණයහිමි - ලංකා බැංකුව	-	272,443,247.78
203-1-56	ඉඩම් විකුණුම් අත්තිකාරම් ලැබීම්	1,000,000,000.00	-
203-1-57	ලංකා අශෝක් ලේලන්ඩ් ණය ගිණුම	182,004,806.43	413,689,754.51
	එකතුව	**9,185,113,673.19**	**7,577,458,493.81**

14.2 උපචිත වියදම්

ගිණුම් සංකේත	විස්තරය	2017.12.31 රු.	2016.12.31 රු.
203-3-1	ගෙවිය යුතු විගණන ගාස්තු ගිණුම	4,695,273.78	4,854,003.78
203-3-2	දේශීය මිලදී ගැණුම් අවිනිශ්චිත ගිණුම	393,241.35	(124,730.00)
203-3-3	සේ.අ.ආ. ගෙවිය යුතු (ශ්‍රී ලංගම) ගිණුම	607,284,153.12	611,284,703.97
203-3-4	සේ.අ.ආ. ගෙවිය යුතු (මහ බැංකුව) ගිණුම 2017 ට පෙර	1,680,688,187.66	3,394,752,974.69
203-3-4	සේ.හා.අ. ගෙවිය යුතු (මහ බැංකුව) ගිණුම 2017	171,828,031.93	182,086,376.88
203-3-5	සේ.හා.අ. ගෙවිය යුතු (මහ බැංකුව) ගිණුම	40,459,519.44	35,512,144.82
203-3-6	වේතන පාලන ගිණුම	894,137,992.48	963,696,168.88
203-3-7	උපචිත වියදම් ගිණුම	375,003,635.25	387,072,031.24
203-3-7	උපචිත වියදම් ගිණුම - කල්බදු ණයභාරම්	462,195,448.00	287,405,180.00
203-3-7	උපචිත වියදම් ගිණුම - සිය කැමැත්තෙන් විශ්‍රාම ගැන්වීමේ වන්දි	99,409,374.42	-
	එකතුව	**4,336,094,857.43**	**5,866,538,854.26**
	මුලු එකතුව	**13,521,208,530.62**	**13,443,997,348.07**

15. ආදායම

ගිණුම් සංකේත	විස්තරය	2017.12.31 රු.	2016.12.31 රු.
301-1	මාර්ග ලේඛන ආදායම	27,201,511,515.84	25,931,696,087.79
301-2	වාර ප්‍රවේශ පත්‍ර	949,530,161.80	876,115,142.23
301-3	විශේෂ වාරිකා	383,290,025.01	348,510,755.59
301-4	තැපැල් ප්‍රවාහන	41,540,828.82	57,021,669.39
301-5	හමුදා ගමන් අවසරපත්‍ර	227,121,572.60	214,911,537.95
301-6	පොලිස් ගමන් බලපත්‍ර	530,727,069.25	490,907,790.63
301-7	හමුදා විශේෂ වාරිකා	28,251,350.60	49,358,892.85
301-8	පුවක්පත් ප්‍රවාහනය	2,708,853.00	1,569,749.00
301-9	වෙනත් ගමන් අවසරපත්‍ර	49,251,314.97	42,017,786.68
301-10	භාණ්ඩ ප්‍රවාහන ආදායම	34,139,203.20	40,017,719.70
301-11	සුභසාධන වාරිකා	2,722,880.98	1,577,581.75
301-12	පොලිස් වවුචර්පත්	40,456,386.00	21,663,259.50
302-1-1	ගැමි සැරිය	9,007,703.00	-
302-1-2	සිසු සැරිය	160,367,057.17	170,842,084.50
302-1-3	නිසි සැරිය	10,172,722.03	6,949,690.50
302-4-D	වාර ප්‍රවේශපත්‍ර ප්‍රතිපාදන	4,257,863,422.48	2,007,750,131.74
	එකතුව	**33,928,662,066.75**	**30,260,909,879.80**

16. ආයතන හා පරිපාලන වියදම්

ගිණුම් සංකේත	විස්තරය	2017.12.31 රු.	2016.12.31 රු.
401-1	බස් රථ ධාවන වියදම්	15,100,888,983.61	15,732,233,924.42
401-2	සෘජු ඉන්ධන හා ලිහිසි	13,066,713,637.08	12,852,826,927.07
401-3	වෙනත් සෘජු වියදම්	4,022,903,679.92	3,965,858,315.19
402-3-1	ක්ෂය - බස්රථ	1,953,057,971.18	2,015,297,342.07
	එකතුව	**34,143,564,271.79**	**34,566,216,508.75**

බස් රථ ධාවන වියදම්

		2017.12.31	2016.12.31
401-1-1	වේතන - රියදුරු හා කොන්දොස්තර	3,384,396,984.04	3,484,500,755.44
401-1-14	වේතන - ඉංජිනේරු කණ්ඩායම්	1,022,245,691.64	1,112,833,969.91
401-1-3	අතිකාල - ලේඛනගත රියදුරු හා කොන්දොස	1,312,984,399.07	1,314,197,501.12
401-1-4	අතිකාල - ලේඛනගත නොවන රියදුරු හා ෙ	568,031,098.45	363,884,069.14
401-1-16	අතිකාල - ඉංජිනේරු	350,842,003.51	300,471,016.39
401-1-6	ගමන් වියදම් - රියදුරු/කොන්දොස්තර	7,682,713.32	14,900,829.52
401-1-18	ගමන් වියදම් - ඉංජිනේරු	5,113,956.30	5,835,069.50
401-1-2	ජීවනාංක දීමනාව - රියදුරු/කොන්දොස්තර	1,860,518,302.69	1,822,898,722.43
401-1-15	ජීවනාංක දීමනාව - ඉංජිනේරු	529,250,301.75	540,918,071.90
401-1-5	බස් සේවක - අන්තර්කාල	46,797,341.65	24,366,394.86
401-1-7	උනන්දු කිරීමේ දීමනා - රියදුරු/ කොන්දොස	1,273,033,666.96	1,271,371,507.03
401-1-17	උනන්දු කිරීමේ දීමනා - ඉංජිනේරු	254,485,099.26	218,987,168.94
401-1-8	පැමිණීමේ දීමනා - රියදුරු/කොන්දොස්තර	11,259,316.04	7,106,617.16
401-1-19	පැමිණීමේ දීමනා - ඉංජිනේරු	19,769,963.93	22,300,754.15
401-1-10	විශේෂ දීමනා - රියදුරු/කොන්දොස්තර	2,297,909,977.43	2,738,898,489.70
401-1-20	විශේෂ දීමනා - ඉංජිනේරු	656,356,126.34	924,610,581.36
401-1-23	බස් පිරිසිදු කිරීමේ හා බලාගැනීමේ දීමනා	29,803,831.44	30,036,547.62
401-1-9	රාත්‍රී නවාතැන් දීමනා - රියදුරු/කොන්දොස්	34,353,300.64	8,656,660.90
401-1-11	මාර්ග ලේඛන පරීක්ෂා කිරීමේ වියදම්	8,090,227.35	10,960,199.73
401-1-12	සේ.අ.අ. - රියදුරු හා කොන්දොස්තර	731,535,185.55	807,761,321.58
401-1-21	සේ.අ.අ. - ඉංජිනේරු	223,813,474.67	259,787,463.68
401-1-13	සේ.හා.අ. - රියදුරු හා කොන්දොස්තර	178,322,250.03	199,876,014.91
401-1-22	සේ.හා.අ. - ඉංජිනේරු	55,566,516.58	64,106,341.71
401-1-24	වෙනත් විවිධ්‍ය වියදම්	238,727,254.97	182,967,855.74
	එකතුව	**15,100,888,983.61**	**15,732,233,924.42**

සෘජු ඉන්ධන තෙල් හා ලිහිසි

401-2-A	බස් රථ සඳහා තෙල් හා ලිහිසි (සෘජු පිරිවැය)	334,814,410.94	358,237,115.93
401-2-B	බස් රථ සඳහා ඉන්ධන (සෘජු පිරිවැය)	12,731,899,226.14	12,494,589,811.14
	එකතුව	**13,066,713,637.08**	**12,852,826,927.07**

වෙනත් සෘජු විවිධ්‍ය පිරිවැය

401-3-1	අමතර කොටස්	1,492,360,630.35	1,544,950,797.69
401-3-2	නව ටයර් හා ටියුබ්	781,026,652.46	775,655,613.29
401-3-3	නැවත පිරවූ ටයර්	1,214,490,110.80	1,314,823,782.30
401-3-4	බස් රථ සඳහා බැටරි	141,297,896.49	108,142,756.06
401-3-5	බස් රථ අළුත්වැඩියා හා නඩත්තු වියදම්	282,156,301.59	118,567,722.19
401-3-6	බස් රථ - රක්ෂණ වියදම්	23,734,033.66	32,987,518.02
401-3-7	බස් රථ - ලියාපදිංචි ගාස්තු	540,000.00	7,147,589.43
401-3-7	බස් රථ - ආදායම් බලපත්‍ර ගාස්තු	14,181,258.55	
401-3-8	ටිකට් හා මාර්ග ලේඛන වියදම්	73,116,796.02	63,582,536.21
	එකතුව	**4,022,903,679.92**	**3,965,858,315.19**

17. වෙනත් මෙහෙයුම් ආදායම

ගිණුම් සංකේත	විස්තරය	2017.12.31 රු.	2016.12.31 රු.
303-1	කුලි ආදායම්	12,492,691.00	17,307,070.85
303-2	රියදුරු අභ්‍යාස විද්‍යාල	(16,600,343.41)	(33,017,651.63)
303-3	ඉන්ධන පිරවුම්හල් ආදායම්	17,411,696.57	22,123,738.99
303-4	සංචාරක බංගලා	24,232,712.96	15,941,499.00
303-5	ප්‍රචාරණය	13,275,815.00	32,276,437.16
303-6	දඩ අයකිරීම්	6,703,646.15	4,842,242.57
303-8	ලාභාංශ ලැබීම්	-	-
303-9	දැව් තෙල් විකුණුම්	46,887,801.99	17,926,629.30
303-10	මුදල් අධිකය	598,535.62	2,725,452.37
303-11	අලාභ අයකර ගැනීම්	24,978,902.20	31,032,635.56
303-12	දේපලවලින් ලද ආදායම්	905,927.50	350,351.79
303-13	ගොඩනැගිලි හා ආපන ශාලා කුලි	2,625,343.87	2,214,204.33
303-14	කොමිස් හා වට්ටම්	86,261,155.19	84,702,561.42
303-15	යෝග්‍යතා සහතික	9,786,222.56	9,184,476.91
303-16	බාහිර පාර්ශවයන්ගේ අළුත්වැඩියාවලින් ලැබු	4,294,803.50	292,558.40
303-17	දොඹකර ගාස්තු	816,975.50	514,376.22
303-18	රක්ෂණ කොමිස්	1,442,480.63	1,435,591.44
303-19	අයකැමි අධිකය	152,853.64	402,140.13
303-20	හැදුනුම්පත් ආදායම්	4,080,070.37	3,909,547.74
303-21	තොග ගැලපුම් ගිණුම්	20,173,895.32	(16,602,531.89)
303-22	ඉන්ධන තොගයේ අතිරික්තය/ හිඟය	33,962,408.84	46,673,819.57
303-23	අබලි ද්‍රව්‍ය විකුණුම්	21,862,906.95	6,308,741.50
303-24	වෙනත් ආදායම්	261,329,619.73	204,672,763.87
303-25	ශාලිකා ආදායම්	2,900,350.00	3,051,750.00
303-26	ඉන්ධන ආදායම්	14,521,544.75	13,762,091.22
303-27	බස්රථ විකුණුම් ලාභය	88,428,250.00	30,681,281.80
303-29	වෙනත් අයතම විකුණුම්	802,853.12	376,808.00
303-30	අබලි ද්‍රව්‍ය අතිරික්තය	43,761.00	132,590.64
303-31	අධි අඩමාන ණය	303,063.43	5,312,180.97
302-1-4	වෙනත් ප්‍රතිපාදන	11,341,769,083.37	12,629,204,153.81
302-3-C	සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිපාන	289,474,711.20	11,760,858.00
	එකතුව	**12,315,919,738.55**	**13,149,498,370.04**

18. ආයතන හා පරිපාලන වියදම්

ගිණුම් සංකේත	විස්තරය		2017.12.31 රු.	2016.12.31 රු.
	වැටුප් හා වේතන	18.1	1,114,021,949.25	1,551,884,551.33
	අතිකාල හා නිවාඩු දීමනා	18.2	266,746,434.89	236,944,980.50
	ජීවනාංක දීමනාව	18.3	541,618,643.02	743,128,730.07
	ගමන් වියදම් දීමනා	18.4	27,002,038.50	59,260,885.47
	වෙනත් විශේෂ දීමනා	18.5	740,415,072.45	1,156,946,211.55
	අළුත්වැඩියා හා නඩත්තු	18.6	171,592,918.49	144,410,669.43
402-1-6	සභාපති/අධ්‍යක්ෂ මණ්ඩල දීමනා		1,695,000.00	2,313,227.16
402-1-8	පෞද්ගලික ආරක්ෂක වේතන		53,761,523.68	28,138,666.06
402-1-9	වෛද්‍ය බිල්පත්		1,054,708.14	1,627,667.89
402-1-10	වෙනත් දීමනා		153,757,116.01	112,982,622.30
402-1-11	කොන්ත්‍රාත් හා දෛනික සේවක දීමනා		46,436,267.82	28,414,138.03
402-1-12	සේවක අර්ථසාධක අරමුදල්		284,860,093.41	391,684,602.37
402-1-13	සේවක භාරකාර අරමුදල්		114,925,987.19	87,616,695.50
402-2-5	මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය		88,171,322.57	79,743,050.69
402-2-6	කුලී හා නඩත්තු		30,700,029.67	27,522,688.83
402-2-7	දුරකතන		44,545,833.35	33,998,882.84
402-2-8	විදුලිය		106,055,996.74	108,494,965.77
402-2-9	ජලය		32,048,271.60	31,165,207.86
402-2-10	වාර්ෂික ප්‍රසාද දීමනා		108,536,141.28	68,734,742.82
402-2-11	පාරිතෝෂික දීමනා		3,588,757,243.11	1,144,831,511.75
402-2-12	වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැන්වීම		20,733,476.73	13,552,184.33
402-2-13	නීති වියදම්		75,467,190.22	29,351,864.64
402-2-14	සුභසාධන වියදම්		29,952,734.29	20,712,861.89
402-2-15	කරුණාසහගත දීමනා		26,443,386.89	34,217,124.38
402-2-16	සේවක වන්දි		1,228,843,093.93	2,295,138,353.70
402-2-17	පොලිස් ආරක්ෂක වියදම්		8,880,281.60	31,044.00
402-2-19	ඉන්ධන තෙල් හා ලිහිසි (වකු වියදම්)		30,557,095.77	28,461,440.75
402-2-20	සංග්‍රහ වියදම්		11,559,198.04	12,644,239.00
402-2-21	වෙනත් වියදම්		1,603,467,423.68	1,805,969,683.16
402-2-22	බොල්ණය වෙන් කිරීම්		-	1,250.00
402-2-23	ප්‍රවාරණ වියදම		5,291,750.92	4,440,742.45
402-2-24	වෙනත් වාහන සඳහා රක්ෂණ		1,769,194.41	5,312,596.32
402-3-2	ක්ෂය	18.7	167,180,513.35	38,202,735.84
	එකතුව		**10,726,847,931.00**	**10,327,880,818.69**

18.1	**වැටුප් හා වේතන**	**31.12.2017**	**31.12.2016**
402-1-1-A	වැටුප් හා වේතන - මෙහෙයුම් කාර්ය	475,579,164.56	713,167,239.35
402-1-1-B	වැටුප් හා වේතන - ගිණුම් කාර්ය මණ්ඩලය	171,639,022.36	214,959,587.54
402-1-1-C	වැටුප් හා වේතන - ඉංජිනේරු කාර්ය	191,091,966.21	282,105,619.74
402-1-1-D	වැටුප් හා වේතන - විගණන කාර්ය මණ්ඩලය	30,283,772.43	34,864,905.46
402-1-1-E	වැටුප් හා වේතන - විනය කාර්ය මණ්ඩලය	41,017,898.03	47,471,408.53
402-1-1-F	වැටුප් හා වේතන - ආරක්ෂක කාර්ය	110,870,007.98	144,552,104.78
402-1-1-G	වැටුප් හා වේතන - සැපයුම් කාර්ය මණ්ඩලය	82,616,676.30	106,012,539.94
402-1-1-H	වැටුප් හා වේතන - රියදුරු අභ්‍යාස විද්‍යාල	9,659,603.38	7,954,520.99
402-1-7	වැටුප් - පුහුණු උපාධිධාරී	1,263,838.00	796,625.00
		1,114,021,949.25	**1,551,884,551.33**

18.2 අතිකාල හා නිවාඩු දීමනා

402-1-2-A	අතිකාල හා නිවාඩු දීමනා - මෙහෙයුම් කාර්ය	122,788,166.59	97,502,506.34
402-1-2-B	අතිකාල හා නිවාඩු දීමනා - ගිණුම් කාර්ය	23,980,996.55	15,318,663.03
402-1-2-C	අතිකාල හා නිවාඩු දීමනා - ඉංජිනේරු කාර්ය	36,497,823.41	32,902,423.09
402-1-2-D	අතිකාල හා නිවාඩු දීමනා - විගණන කාර්ය	1,876,438.13	1,428,946.96
402-1-2-E	අතිකාල හා නිවාඩු දීමනා - විනය කාර්ය	4,217,108.46	5,380,133.26
402-1-2-F	අතිකාල හා නිවාඩු දීමනා -ආරක්ෂක කාර්ය	61,918,837.39	60,635,201.53
402-1-2-G	අතිකාල හා නිවාඩු දීමනා - සැපයුම් කාර්ය	14,019,399.03	13,987,664.62
402-1-2-H	අතිකාල හා නිවාඩු දීමනා - රියදුරු අභ්‍යාස	1,447,665.33	9,789,441.67
		266,746,434.89	**236,944,980.50**

18.3 ජීවනාංක දීමනාව

402-1-3-A	ජීවනාංක දීමනාව - මෙහෙයුම් කාර්ය	230,314,293.40	330,491,139.99
402-1-3-B	ජීවනාංක දීමනාව - ගිණුම් කාර්ය මණ්ඩලය	88,258,708.86	110,979,546.67
402-1-3-C	ජීවනාංක දීමනාව - ඉංජිනේරු කාර්ය	93,311,842.65	134,448,558.06
402-1-3-D	ජීවනාංක දීමනාව - විගණන කාර්ය මණ්ඩලය	13,095,046.00	15,502,415.32
402-1-3-E	ජීවනාංක දීමනාව - විනය කාර්ය මණ්ඩලය	19,428,389.66	24,073,868.63
402-1-3-F	ජීවනාංක දීමනාව - ආරක්ෂක කාර්ය	54,687,279.22	74,226,181.27
402-1-3-G	ජීවනාංක දීමනාව - සැපයුම් කාර්ය මණ්ඩලය	39,604,868.21	49,826,320.32
402-1-3-H	ජීවනාංක දීමනාව -රියදුරු අභ්‍යාස විද්‍යාල	2,918,215.02	3,580,699.81
		541,618,643.02	**743,128,730.07**

18.4 ගමන් වියදම් දීමනා

402-1-4-A	ගමන් වියදම් දීමනා -මෙහෙයුම් කාර්ය	12,722,793.66	18,906,947.81
402-1-4-B	ගමන් වියදම් දීමනා -ගිණුම් කාර්ය මණ්ඩලය	1,685,121.88	2,193,896.15
402-1-4-C	ගමන් වියදම් දීමනා - ඉංජිනේරු කාර්ය	2,030,114.24	2,981,931.81
402-1-4-D	ගමන් වියදම් දීමනා - විගණන කාර්ය	2,164,453.50	1,578,223.50
402-1-4-E	ගමන් වියදම් දීමනා - විනය කාර්ය මණ්ඩලය	1,778,598.55	1,827,132.20
402-1-4-F	ගමන් වියදම් දීමනා - ආරක්ෂක කාර්ය	1,329,668.66	894,630.70
402-1-4-G	ගමන් වියදම් දීමනා - සැපයුම් කාර්ය	3,323,242.51	1,858,593.50
402-1-4-H	ගමන් වියදම් දීමනා - රියදුරු අභ්‍යාස විද්‍යාල	1,968,045.50	29,019,529.80
		27,002,038.50	**59,260,885.47**

18.5 වෙනත් විශේෂ දීමනා

		31.12.2017	31.12.2016
402-1-5-A	වෙනත් විශේෂ දීමනා -මෙහෙයුම් කාර්ය	309,236,391.80	530,753,834.19
402-1-5-B	වෙනත් විශේෂ දීමනා -ගිණුම් කාර්ය	114,431,695.24	166,113,344.61
402-1-5-C	වෙනත් විශේෂ දීමනා - ඉංජිනේරු කාර්ය	125,033,134.25	197,651,233.27
402-1-5-D	වෙනත් විශේෂ දීමනා - විගණන කාර්ය	19,125,967.32	26,788,256.79
402-1-5-E	වෙනත් විශේෂ දීමනා -විනය කාර්ය	30,561,238.79	42,808,965.55
402-1-5-F	වෙනත් විශේෂ දීමනා -ආරක්ෂක කාර්ය	83,869,418.24	114,653,844.15
402-1-5-G	වෙනත් විශේෂ දීමනා - සැපයුම් කාර්ය	53,482,018.54	73,465,050.60
402-1-5-H	වෙනත් විශේෂ දීමනා - රියදුරු අභ්‍යාස	4,675,208.27	4,711,682.39
		740,415,072.45	**1,156,946,211.55**

18.6	අළුත්වැඩියා හා නඩත්තු		
402-2-1	අළුත්වැඩියා සහ නඩත්තු (ගරාජ ගොඩනැගිලි)	39,826,220.51	20,472,502.93
402-2-2	ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ නඩත්තු කිරීම්	18,806,316.96	19,803,795.90
402-2-3	අළුත්වැඩියා සහ නඩත්තු - නිලවාහන	85,779,598.43	85,115,866.05
402-2-4	පිරියත හා යන්ත්‍රෝපකරණ නඩත්තු කිරීම	27,180,782.59	19,018,504.55
		171,592,918.49	**144,410,669.43**

18.7	ක්ෂය		
402-3-2	ක්ෂය - වෙනත් වාහන	9,730,992.60	6,500,560.31
402-3-3	ක්ෂය - පිරියත හා යන්ත්‍රෝපකරණ	2,936,937.49	1,530,437.33
402-3-4	ක්ෂය - ලී බඩු හා කාර්යාල උපකරණ	6,904,085.81	6,198,048.43
402-3-5	ක්ෂය -ගොඩනැගිලි	885,939.97	6,125.00
402-3-6	ක්ෂය - පරිගණක	5,706,846.96	3,487,105.39
402-3-7	ක්ෂය - වෙනත් වත්කම්	3,138,179.19	2,574,177.84
402-3-8	ක්ෂය - තුවක්කු	-	-
402-3-9	ක්ෂය - වායු සමීකරණ	761,286.86	617,482.09
402-3-10	ක්ෂය - බස්රථ එන්ජින්	107,165,886.70	-
402-3-11	ක්ෂය -ඉඩම් සහ ගොඩනැගිලි (නවාතැන්)	561.75	561.75
402-3-12	ක්ෂය - ටිකට් මැෂින්	29,949,796.02	17,288,237.71
	Total	**167,180,513.35**	**38,202,735.84**

19. මූල්‍ය හා වෙනත් වියදම්

ගිණුම් සංකේත	විස්තරය	2017.12.31 රු.	2016.12.31 රු.
402-4-1	අයිරා පොලිය	52,320,222.16	58,745,338.60
402-4-2	බැංකු ගාස්තු	19,787,748.78	23,212,593.94
402-4-3	හර බදු	801,613.13	204,315.46
402-4-4	කල්බදු පොලී ගිණුම	189,453,445.06	323,399,174.65
402-4-5	වෙනත් මූල්‍ය වියදම්	473,038,263.98	314,682,140.85
	එකතුව	**735,401,293.11**	**720,243,563.50**

ගිණුම් සංකේත	විස්තරය	2017.12.31 රු.	2016.12.31 රු.
303-7	තැන්පතු පොලී ආදායම	80,426,024.50	56,663,229.15
	මුළු මූල්‍ය වියදම	**80,426,024.50**	**56,663,229.15**

ශුද්ධ මූල්‍ය වියදම	**654,975,268.61**	**663,580,334.35**

20. නිෂ්පාදන අලාභය

		2017.12.31 රු.		2016.12.31 රු.	
403-1	2017.01.01 දිනට නොනිමි වැඩ - අමුද්‍රව්‍ය	4,618,687.74		36,459,327.27	
	එකතු කලා				
403-2	අමුද්‍රව්‍ය මිලදී ගැනුම්	150,533,517.70		213,727,739.58	
	අඩු කලා		155,152,205.44		250,187,066.85
403-4	භාණ්ඩ ආපසු යැවුම්	313,608.08		850,042.63	
	2017.12.31 දිනට නොනිමි වැඩ	6,880,296.23	7,193,904.31	4,618,687.74	5,468,730.37
	නිමි භාණ්ඩවල මූලික පිරිවැය		147,958,301.13		244,718,336.48
	කම්හල් පොදු කාර්ය පිරිවැය				
403-1-A	කම්හල් වැටුප් හා දීමනා	183,943,344.44		206,628,034.54	
403-1-B	අතිකාල	6,724,617.97		6,021,034.21	
403-1-C	ගමන් වියදම් දීමනා	296,363.00		297,609.18	
403-1-D	සේවක අර්ථසාධක අරමුදල	15,659,054.60		17,077,870.06	
403-1-E	සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල	3,913,360.59		4,148,166.28	
403-1-F	වෙනත් වියදම්	3,951,465.35		4,762,627.35	
	කම්හල් පිරිවැය		214,488,205.95		238,935,341.62
	මුළු නිෂ්පාදන පිරිවැය		362,446,507.08		483,653,678.10
403-3	නිෂ්පාදන ආදායම්		295,220,508.49		354,538,224.55
	නිෂ්පාදන හිඟය		**67,225,998.59**		**129,115,453.55**

21. රජයේ ප්‍රතිපාදන

ගිණුම් සංකේත	විස්තරය	2017.12.31 රු.	2016.12.31 රු.
302-2-B	ප්‍රතිසංස්කරණ ප්‍රතිදාන	964,741,253.85	1,008,832,914.86
302-5-E	බස්රථ සඳහා රජයේ ප්‍රතිදාන	-	634,932,777.18
	එකතුව	**964,741,253.85**	**1,643,765,692.04**

ඉන්ධන පිරවුම්හල

ලාභ හා අලාභ ප්‍රකාශය

		රත්මලාන ඉන්ධන පිරවුම්හල			ඔරුගොඩවත්ත ඉන්ධන පිරවුම්හල		
	විකුණුම්			278,904,981.30			203,929,378.40
	ආරම්භක ශේෂය - ඩීසල්	2,163,477.75			1,031,890.00		
	ආරම්භක ශේෂය -පෙට්‍රල්	659,994.66			1,106,703.00		
	ආරම්භක ශේෂය -ලිහිසි තෙල්	333,993.04			521,453.00		
			3,157,465.45			2,660,046.00	
	එකතු කලා						
	මිලදී ගැනීම් - ඩීසල්	187,901,265.14			158,712,054.78		
	මිලදී ගැනීම් - පෙට්‍රල්	84,962,926.62			34,283,286.18		
	මිලදී ගැනීම් - ලිහිසි තෙල්	1,021,281.81			971,432.73		
			273,885,473.57			193,966,773.69	
			277,042,939.02			196,626,819.69	
	අවසාන ශේෂය - ඩීසල්	2,172,080.00					
	අවසාන ශේෂය -පෙට්‍රල්	983,151.00					
	අවසාන ශේෂය -ලිහිසි තෙල්	367,815.00			446,192.50		
			3,523,046.00			446,192.50	
				273,519,893.02			196,180,627.19
	ශුද්ධ ලාභය			5,385,088.28			7,748,751.21
	වෙනත් ආදායම්						
303-7	පොලී ආදායම ගිණුම					42,499.99	
303-15	යෝග්‍යතා සහතික ගිණුම						
							42,499.99
							7,791,251.20
	ආයතන හා පරිපාලන වියදම්						
402-1-1-A	වැටුප් හා වේතන - මෙහෙයුම් කාර්ය මණ්ඩල ගිණුම	1,367,376.62			1,719,020.76		
402-1-2-A	අතිකාල සහ නිවාඩු ගෙවීම් - මෙහෙයුම් කාර්ය මණ්ඩල ගිණුම	509,613.14			401,082.56		
402-1-3-A	ජීවන වියදම් දීමනාව - මෙහෙයුම් කාර්ය මණ්ඩල ගිණුම	777,300.00			1,014,236.19		
402-1-5-A	වෙනත් විශේෂ දීමනා - මෙහෙයුම් කාර්ය මණ්ඩල ගිණුම	1,580,580.68			1,885,311.31		
			4,234,870.44			5,019,650.82	
402-2-1	අළුත්වැඩියා සහ නඩත්තු (ගරාජ් ගොඩනැගිල්ල) ගිණුම	6,445.00					
402-2-2	ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ නඩත්තු කිරීම ගිණුම				97,580.18		
402-2-5	මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය ගිණුම	26,751.02			8,917.71		
402-2-7	දූරකථන ගිණුම	39,562.34			32,505.17		
402-2-8	විදුලි ගිණුම	210,358.00			3,625.50		
402-2-9	ජල ගිණුම	60,122.64			9,346.63		
402-2-14	මාණ්ඩලික සුභසාධන ගිණුම	18,410.36			4,530.00		
402-2-21	වෙනත් වියදම් ගිණුම	212,826.15			833,993.09		
			574,475.51			990,498.28	
	මූල්‍ය වියදම්						
402-4-2	බැංකු ගාස්තු ගිණුම		14,301.36			7,500.00	
	මුළු පිරිවැය			4,823,647.31			6,017,649.10
	ශුද්ධ ලාභය			561,440.97			1,773,602.10

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. } සිවිපි/ඒ/එස්එල්ටීබී/එෆ්ඒ/01/2017/88

ඔබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2019 ජනවාරි 08 දින

08 JAN 2019

සභාපති,

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 27 දරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනතේ 24 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

1.4 මතය වයාවනය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේ දැයි තීරණය කිරීමට මට නොහැකිය.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය ව්‍යාවනය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතු කොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

(i) වත්කම්වල සාධාරණ වටිනාකම එහි ධාරන අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස්වන විට ප්‍රත්‍යාගණනයක් සිදුකල යුතු නමුත් ප්‍රමිතයේ 34 ඡේදය ප්‍රකාරව වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 58 ඡේදය ප්‍රකාරව ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම වෙන් වෙන්ව හඳුනා ගතයුතු වුවද, ගිණුම්කරණ ප්‍රමිතයට පටහැනි ලෙස ඉඩම් හා ගොඩනැගිලිවල මුළු වටිනාකම වෙන්වෙන්ව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) මණ්ඩලය විසින් රු. 1,367,754,792 ක් වන අබලි බස්රථ වටිනාකමද දේපළ පිරියත හා උපකරණ යටතේ මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19

ප්‍රමිතයේ 57 ඡේදය ප්‍රකාරව අර්ථ දක්වන ලද ප්‍රතිලාභ වගකීම පුරෝකථනය කළ ඒකක බැර ක්‍රමය පදනම් කරගෙන ගණනය කළ යුතු වුවත් එලෙස කටයුතු නොකර සේවක මාසික වැටුප හෝ මාස භාගයක වැටුප සේවා කාලයෙන් ගුණකොට පාරිතෝෂික දීමනා වෙන්කිරීම් ප්‍රමාණය ගණනය කර තිබුණි.

2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ආයතනය විසින් පරිගණක මෘදුකාංග අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනා ගැනීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබූ අතර 2015 වර්ෂයේ මිලට ගෙන තිබුණු රු.9,510,486 ක් වටිනා මෘදුකාංග සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.2,377,621 ක ක්‍රමක්ෂය ප්‍රතිපාදන සලසා නොතිබුණි.

2.2.3 අවිනිශ්චිත ගිණුම්

සබරගමුව ප්‍රාදේශිකයෙහි හා කොළඹ ප්‍රාදේශිකයෙහි අවිනිශ්චිත ගිණුම් ශේෂ පිළිවෙලින් රු. 43,954 ක හර ශේෂය හා රු. 434,864 ක බැර ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත්කර නොතිබීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

	විෂයය	වටිනාකම	ඉදිරිපත් නොවූ සාක්ෂි
		(රු.)	
(i)	ක්‍රියාකාරී නොවන ගිණුම් - හර	9,935,459,128	විස්තරාත්මක උපලේඛන, කාල විශ්ලේෂණ හා ශේෂ සනාථ ලිපි.
	- බැර	26,054,954,882	
(ii)	වෙළඳ ණය හිමියෝ	3,042,220,390	
(iii)	අනෙකුත් ණය හිමියෝ	127,397,176	
(iv)	කැෂියර් හිඟ ශේෂය	34,388,213	
(v)	කොන්දොස්තර අක්‍රමිකතා ශේෂය	7,687,289	
(vi)	විවිධ ණය ගැති	111,795,741	
(vii)	ලැබිය යුතු ආදායම	243,166,958	
(viii)	වෙළඳ ණය ගැති ශේෂය	7,972,076	
(ix)	ගෙවිය යුතු සේවක අර්ථ සාධක අරමුදල් (SLTB)	607,284,153	

(x)	ගෙවිය යුතු සේවක අර්ථ සාධක අරමුදල් (මහ බැංකුව) 2017 පෙර	1,680,688,187	උපලේඛන හා කාල විශ්ලේෂණ හා ශේෂ සනාථ ලිපි
(xi)	ගෙවිය යුතු සේවක අරමුදල් (මහ බැංකුව) 2017	171,828,031	
(xii)	ගෙවිය යුතු සේවක භාරකාර අරමුදල් (මහ බැංකුව)	40,459,519	
(xiii)	මිලදී ගැණුම් අත්තිකාරම් (චෝගම්)	101,641,771	
(xiv)	ඉඩම් විකිණීමෙන් ලද අත්තිකාරම්	1,000,000,000	විකුණනද ලද ඉඩම් හා වටිනාකම් පිළිබඳ උපලේඛන

2.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මධ්‍යම බස්රථ කාර්යාලයෙහි හිඟ කඩකුලී ආදායම ලෙස රු. 1,863,414 ක මුදලක් 2009 වර්ෂයේ සිට පැවත එන අතර, එම මුදල අය කරගැනීම සඳහා සමාලෝචිත වර්ෂය අවසන්වන විටද, ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) වයඹ ප්‍රාදේශිකයේ අලවිව ඩිපෝවෙහි 2015 වර්ෂයට පෙර සිට ත්‍රස්ථ විපත්වලින් මියගිය සේවකයින්ට ගෙවූ වැටුප් සඳහා ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලයෙන් ලැබිය යුතු රු.2,174,752 ක ශේෂයක් විවිධ ණයගැති ශේෂය තුළ ඇතුළත්කර ඇති අතර, එම ශේෂය නිරවුල්කර නොතිබුණි.

(ඇ) ලැබිය යුතු ආදායම් ශේෂය තුළ සබරගමුව ප්‍රාදේශිකයේ හමුදා ප්‍රවාහනය, පොලිස් බලපත්‍ර හා හමුදා බලපත්‍ර ආදිය වෙනුවෙන් වසර 5 කට වැඩි කාලයක සිට එකතුව රු. 15,110,583 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2017 වර්ෂයට පෙර සිට සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට රු. 1,680,688,187 ක ගෙවිය යුතු ශේෂයක් පැවති අතර එම මුදල් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) කළුතර රියදුරු පුහුණු පාසලෙන් ලැබිය යුතු ශේෂය වන රු. 12,305,959 ක් වසර 3 ක් ඉක්මවා ඇතත් එය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) මහනුවර දකුණු ඩිපෝවෙහි රු. 4,737,950 ක්ද, පානදුර ඩිපෝවෙහි රු. 23,546,483 ක් ද, මතුගම ඩිපෝවෙහි රු. 26,952,578 ක් ද, අළුත්ගම ඩිපෝවෙහි රු. 6,179,118 ක් ද, වූ ණය හිමි ශේෂ අවුරුදු 5 ට වැඩි කාලයක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) 2014 හා 2015 වර්ෂවලදී කල්බදු පදනම යටතේ මිළදී ගෙන තිබුණු බස්රථ 2200 ක් වෙනුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට කල්බදු වාරික වශයෙන් රු. 6, 726,713,973 ක මුදලක් ගෙවිය යුතු අතර ඒ සඳහා ඩිපෝ වෙතින් රු . 6,692, 000,000 ක මුදලක් ලැබිය යුතුව පැවතුණි. එම මුදල් ලබාගෙන කල්බදු වාරික නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) එකතුව රු.1,565,050,215 ක් වූ නොපියවූ මිලදී ගැනුම් අත්තිකාරම් ශේෂයෙන් රු.914,763,169 ක් හෙවත් සියයට 58 ක් වසර 01 සිට වසර 03 ක කාල පරාසයක් තුළ දී හා සියයට 30 ක් එනම් රු. 479,811,048 ක් වසර 3 ට වැඩි කාලයක් තුළ දී නිරවුල් කර නොතිබුණි.

2.4 නීතිරීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

නීතිරීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව		අනුකූල නොවීම්
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය **මුදල් රෙගුලාසි 177**		බදුල්ල ඩිපෝවෙහි මුදල් අඩුවෙන් බැංකුගත කිරීම හේතුවෙන් 2012 වර්ෂයේ සිට වර්ධනය වෙමින් පවතින රු.34,249,522 ක ශේෂයක් පැවති අතර ඒ පිළිබඳව ඩිපෝව විසින් අදාල මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතුකර නොතිබුණි.
(ආ) 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය 1.16 වගන්තිය		නිලධාරීන් සඳහා නිල වාහන අනුයුක්ත කිරීමේදී අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගතයුතු වුවත්, මණ්ඩලය විසින් මෙම චක්‍රලේඛයට පටහැනිව නිලධාරීන් සඳහා නිල වාහන ලබා දී තිබුණි.
(ඇ) 2003 ජුනි 02 දිනැති පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 8.3.9 වගන්ති	i.	චක්‍රලේඛයට පටහැනි ලෙස මණ්ඩලය සතු වාහන 02ක් ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යාංශ කාර්යාලයට හා ජාතික සේවක සංගමය වෙත ලබා දී තිබුණු අතර ඒ සඳහා 2017 වර්ෂය සඳහා පිළිවෙලින් ලීටර් 390ක් හා ලීටර් 1667ක් ඉන්ධන ලබා දී තිබුණි. තවද මෙම චක්‍රලේඛයට පටහැනි ලෙස

කොන්දොස්තරවරුන් දෙදෙනෙකු, රියැදුරෙකු හා ආරක්ෂක නියාමකවරයකු වැටුප් ප්‍රතිපූර්ණයට යටත්ව බාහිර ආයතන වෙත මුදාහැර තිබුණි.

(ඇ) 2003 ජුනි 02 දිනැති පී‍ඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛය 9.7 වගන්තිය හා 2000 ජනවාරි 11 දිනැති පීඑෆ්පීඊ 5 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය

(i) චක්‍රලේඛය ප්‍රකාරව මහා භාණ්ඩාගාරයේ අවසරයකින් තොරව නිළධාරීන් සඳහා දීමනා ලබා නොදිය යුතු වුවත්, මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේ පමණක් නිළධාරීන් 19 දෙනෙකුට 2017 වර්ෂය තුළදී, විශේෂ දීමනා වශයෙන් රු. 1,900,000 ක් ගෙවා තිබුණි.

(ii) චක්‍රලේඛ ප්‍රකාර මහා භාණ්ඩාගාරයේ අවසරයකින් තොරව ඩිපෝවල කාර්යසාධනය පදනම් කරගෙන ඩිපෝ කළමනාකරු, සහකාර කළමනාකරු මුදල්, ධාවන හා ඉංජිනේරු යන නිලධාරීන් වෙත මාසිකව උපරිමය රු. 100,000 යටත්ව දිරි දීමනා ගෙවීම් කර තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු. 1,616,709,589 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු. 632,619,173 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී අතිරික්තය රු. 2,249,328,762 කින් වර්ධනය වී තිබුණි. මණ්ඩලයේ ආදායම රු. 3,667,752,180 කින් වැඩි වීමද මූල්‍ය ආදායම රු. 23,762,795 කින් වැඩිවීම ද නිෂ්පාදන අලාභය රු. 61,889,455 කින් අඩුවීමද ඉහත වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා මණ්ඩලයේ ඌණතාවය ක්‍රමයෙන් අඩු වී තිබුණු අතර 2017 වර්ෂයේදී අතිරික්තයක් නිරීක්ෂණය විය. සේවක පාරිශ්‍රමික සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමේදී මණ්ඩලයේ 2013 වර්ෂයේදී රු. 12,709,377,743 ක් වූ දායකත්වය 2017 වර්ෂයේදී රු.20,231,073,915 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 සැලසුම් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛයේ 5.1.2 ඡේදය ප්‍රකාරව සැලසුම් කරනලද කාලය තුළ අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීමට හැකිවන පරිදි කළමනාකරණයේ වගකීම පැහැදිලිව හඳුනාගෙන ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවද ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සැලකිල්ලට ගැනීමකින් තොරව ළඟා කරගත නොහැකි අරමුණු හා ඉලක්ක ඇතුළත් කර පිළියෙල කර තිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ මූල්‍ය අර්බුදයට විසඳුම් වශයෙන් 2015 වර්ෂයේදී ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය හා මහා භාණ්ඩාගාරයේ මහපෙන්වීම මත, ප්‍රතිව්‍යුහගත සැළැස්මක් නිර්මාණය කර තිබුණි. මේ තුළින් මණ්ඩලය යම් ස්ථාවර තත්වයකට පත්කර කාර්යක්ෂමව හා ඵලදායී ලෙස සේවාවක් ඇති කිරීම තුළින් මහජනතාවට මෙන්ම සේවය කරන සේවකයින්ටද, යහපත් අනාගතයක් හා ගුණාත්මක සේවාවක් ලබාදීමට අපේක්ෂා කර තිබුණි. මේ යටතේ මණ්ඩලය තුළ විවිධ යෝජනා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කළද, සේවකයින් 3747ක් ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීම පමණක් සිදුකර, ඒ සඳහා වන්දි වශයෙන් රු.7,580,000,000 ක් ගෙවා තිබුණි.

2016 අංක 1 දරන මණ්ඩලයේ මානව සම්පත් කළමනාකරණ කොටයාශ වක්‍රලේඛය පරිදි අනුචිත කාර්යන්හි සේවයේ සිටින රියදුරු කොන්දොස්තරවරු සිය කැමැත්තෙන් විශ්‍රාම ගනු නොලබන්නේනම්, ඔවුන් පෙර සිටි තනතුරේ සේවය සඳහා නැවත මුදාහල යුතු වුවද, ඊට පටහැනිව 2017දෙසැම්බර් 31 දිනට අනුචිත කාර්යන්හි රියදුරු හා කොන්දොස්තරවරු පිළිවෙලින් 328ක් හා 674 ක් වශයෙන් 1002 ක් සේවයේ යොදවා තිබූ අතර, රියදුරු හා කොන්දොස්තරවරු 1489 ක් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණි.

(ආ) මණ්ඩලයේ ඩිපෝ හා ප්‍රාදේශීය වැඩපල සඳහා අවශ්‍ය අමතර කොටස් පුද්ගලික සමාගම්වලින් මිලදී ගත් අතර, 2017 අවසන් අර්ධ වර්ෂය තුළදී පුද්ගලික සම්ගම් වලින් මිලදී ගෙන ගබඩාවට ගෙනඑන ලද රු.6,115,908 ක් වටිනා අමතර කොටස් පිරිවිතරයන්ට අනුකූල නොවූ නිසා ප්‍රතික්ෂේප කර ප්‍රධාන ගබඩාවේ ගබඩා කර තිබුණි.

(ඇ) සංශෝධිත ගාස්තු ක්‍රියාත්මක වන විට අදාල බදු ගැනුම්කාර පාර්ශවය විසින් සියලු හිඟ බදු මුදල් ගිවිසුම් ප්‍රකාරව මණ්ඩලය වෙත ගෙවිය යුතු වූවද, එසේ අය කර නොගෙන 2018 මැයි 28 දින වන විට දින 45ක බදු කුලී මුදල, විදුලිය හා ජල බිල්පත් පිළිවෙලින් රු. 1,035,000, රු. 85,858 හා රු.235,666 ක් ලෙස හිඟව පැවති අතර, ඒ අනුව අදාල ගාස්තු සංශෝධනය ක්‍රියාත්මක වූවද, හිඟ මුදල් ලබා ගැනීමට කළමනාකරණය ක්‍රියාමර්ග ගෙන නොතිබුණි.

(ඈ) 2017 අගෝස්තු 30 දින පුද්ගලික සමාගමකින් ප්‍රධාන කාර්යාලය විසින් මිලදී ගන්නා ලද රු. 700,350 ක් වටිනා අමතර කොටස් ප්‍රධාන ගබඩාවට ලබා ගැනීමේදී පාවිච්චියට සුදුසු බවට ප්‍රධාන කාර්යාලයේ පරීක්ෂණ ඉංජිනේරු විසින් සහතික කිරීමෙන් අනතුරුව ගම්පහ ප්‍රාදේශිය වැඩපල වෙත භාර දී තිබුණි. එසේ වුවද, 2018 ජනවාරි 11 දින ප්‍රාදේශීය වැඩපල ඉංජිනේරු විසින් අමතර කොටස් ගුණත්වයෙන් ඉතා පහත් බවට සහතික කරමින් රු. 408,590 ක් වටිනා අමතර කොටස් නැවත ප්‍රධාන ගබඩාවට එවා තිබීම විගණනයේදී ගැටළුකාරී විය.

(ඉ) මධ්‍යම බස්රථ කාර්යාලයේ ආරක්ෂක අංශයෙහි ගිනි අවි 06 ක් සහ නොම්බර 12 ජීව උණ්ඩ 63 ක් ද,නොම්බර 16 ජීව උණ්ඩ 08 ක් ද, භෞතිකව දක්නට ලැබුණි. ඒ පිළිබඳ විස්තර ලේඛනගත කර නොතිබුණු අතර, 2017 ඔක්තෝබර් 18 දිනැති ලිපියෙන්, හිටපු ආරක්ෂක පරීක්ෂක නිළධාරීවිසින් භාණ්ඩ හා ලේඛන, වත්මන් ආරක්ෂක පරීක්ෂක නිළධාරීට භාර දී තිබූ අතර, එම ලිපියෙහි ගිනි අවි 06 ඇතුලත් කර නොතිබුණි. තවද, එකී ලිපියෙහි ජීව උණ්ඩ 70ක් භාරදී තිබූ බව සඳහන් කර තිබූ අතර, භෞතිකව ජීව උණ්ඩ 71ක් තිබුණි. ඉන් නොම්බර 16 ජීව උණ්ඩ 8ක් තිබූ අතර,ඉන් එකක කැප් එකක් නොතිබුණි. තවද, නොම්බර 12 හිස් කොපු 30ක් ද, භාරදුන් ලිපියේ සඳහන් වුවද ඒවා ලේඛනගත කර නොතිබුණි.

(ඊ) විවිධ අරමුණු සඳහා 2017 වර්ෂය තුළ ප්‍රධාන කාර්යාලය විසින් නිසි අනුමැතියකින් තොරව වර්ෂ අවසානයේ එකතුව රු. 1,058,596,564 ක් වූ ජංගම ගිණුම් 21 ක් පවත්වාගෙන ගොස් තිබූ අතර එම අරමුණු නොසලකා හරිමින් ගිණුම් අතර මුදල් මාරු කිරීම සිදු කර තිබුණද එම මාරු කළ මුදල් නැවතත් අදාල ගිණුම්වලට අයකර ගැනීම සිදු නොකරයි. මෙවැනි විශාල ගිණුම් සංඛ්‍යාවක් පවත්වාගෙනයාම තුලින් මණ්ඩලයේ මූල්‍ය කටයුතු සංකීර්ණවී තිබූ අතර, එමගින් මූල්‍ය පාලනය දුර්වල තත්වයක පැවතුණි.

(උ) මණ්ඩලය සතු වාහන 61 ක් පවතින අතර එම සියළුම වාහනවල මයිලෝ මීටරය විගණිත දින වන විටත් ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතුණි.

(ඌ) එක් පිටුවක ටිකට් පත් 10 බැගින් වූ ටිකට් 100 කින් යුත් මගී ටිකට් පොත් 19950 ක් අනුක්‍රමික අංක රහිතව මුද්‍රණය කර ප්‍රාදේශීය කාර්යාල වෙත පොත් 9750 ක් නිකුත් කර තිබුණි. ඉන් ටිකට් පොත් 6333 ක් පමණක්, ගබඩාවට ආපසු භාර දී තිබුණි. මෙසේ අංක රහිතව පොත් මුද්‍රණය කිරීම සම්බන්ධයෙන් මණ්ඩලය විසින් විමර්ෂන කටයුතු සිදු කර, එම වාර්තාව 2017 සැප්තැම්බර් 14 දින ශ්‍රී ලංගම/ආ/12/2017 ප්‍රධාන ආරක්ෂක නිලධාරී මගින් මණ්ඩලයේ සභාපති වෙත ඉදිරිපත් කර තිබුණි. 2017 නොවැම්බර් 15 දින මේ සම්බන්ධයෙන් ප්‍රධාන සම්පාදක නිලධාරී වෙත චෝදනා පත්‍රයක් ලබා දී ඇතත්, 2018 අගෝස්තු 31 විගණිත දින වන විටත් අදාල පරීක්ෂණ සිදුකර නොතිබුණි.

(එ) මධ්‍යම බස්රථ කාර්යාලයෙහි පවත්වාගෙන යන කඩ කාමර වෙනුවෙන් අංක: ඒ 1167/67 යටතේ ලියාපදිංචි කරන ලද බදු ගිවිසුම් අංක 05 හා 14 අනුව, එල්එච් 32 හා එල්එච් 34 යන කඩ කාමර හා වැසිකිළි පද්ධතිවල කුලී මුදල් හා ජල හා විදුලි බිල්පත් බදුකරුවන් විසින් නොගෙවීම හේතුවෙන් බදු ගිවිසුම් උල්ලංඝනය වී ඇතත් බදු ගිවිසුම් අවලංගු කිරීමට කටයුතුකර නොතිබුණි. එලෙසම මෙම මුදල් නිසි වේලාවට නියමිත පරිදි අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඒ) මධ්‍යම බස්රථ කාර්යාලයේ යොදවා ඇති ආරක්ෂක කැමරා පද්ධතිය කැමරා 16 කින් යුක්ත විය. එහෙත්, කැමරා මගින් ලබාදෙන දර්ශන වලින් පැහැදිලි දසුන් ලබාගැනීමට නොහැකි වීමත්, එම දසුන් පසුව විමර්ශණ කටයුතු සඳහා ලබාගත නොහැකි වීමත්,වැදගත් ස්ථාන සියල්ල ආවරණය නොවීමත් නිසා, කැමරා පද්ධතිය සවිකිරීම මගින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.

4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් පරීක්ෂණ කරනු ලැබේ.

(අ) බදුල්ල ඩිපෝවෙහි බස්රථ 115 ක් පමණ දෛනිකව ධාවනය වුවද, නිසි වේලාවට තඩාග සේවා හා ග්‍රීස් සේවා සිදු නොකරන බවත්, ග්‍රීස් විදින යන්ත්‍රය දිගින් දිගටම කැඩියාම, ග්‍රීස් සේවා අතපසුවීමට ප්‍රධාන හේතුව වී තිබුණි. ග්‍රීස් සේවා කිරීම නිසි ලෙස අදාල කාලසීමාව තුළදී සිදු නොකිරීම නිසා, බස්රථ වල එන්ජින් සහ අනෙකුත් උපාංගවලට විශාල බලපෑමක් සිදුවන අතර, නැවත අමතර කොටස් යොදා අලුත්වැඩියා කිරීමට සිදුවේ.නිසි වේලාවට අවශ්‍ය ග්‍රීස් සේවා හා තඩාග සේවා සිදුකිරීම තුළින්, බස්රථ අඩු පිරිවැයක් යටතේ කාර්යක්ෂමව දිගු කාලයක් නඩත්තු කරගෙන පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

(ආ) බදුල්ල ඩිපෝවෙහි භූගත ඉන්ධන ටැංකි 03 ක් තිබූ අතර, එම ටැංකි 03 භෞතික පරීක්ෂාවේදී ඉන් එක් ටැංකියක ඉන්ධන සම්පූර්ණයෙන් පිරී තිබූ අතර, අනෙක් ටැංකි 02 හි කොටස් වශයෙන් තිබුණි. සම්පූර්ණයෙන්ම පිරී තිබූ ටැංකියෙහි භෞතික තිබෙන ඉන්ධන ප්‍රමාණය මැනීම සඳහා ගිල්වුම් කෝදුව ප්‍රමාණවත් නොවූයෙන්, භෞතික ප්‍රමාණය කොතෙක් දැයි මැනිය නොහැකි විය. ඒ හේතුවෙන් ටැංකි 03 හි භෞතිකව තිබූ තෙල් ප්‍රමාණය ගණනය කළ නොහැකි විය.එමෙන්ම මණ්ඩලය විසින් ටැංකි වල සම්පූර්ණයෙන්ම තෙල් පිරී තිබෙන විට මැනිය හැකිපරිදි ක්‍රමෝපායන් සකසාගත යුතුව තිබුණි. තවද, ඉන්ධන ඇණවුම් කිරීමේදී යළි ඇණවුම් මට්ටම, අවමතොග මට්ටම, ආරක්ෂිත තොග මට්ටම පිළිබඳව අවධානය යොමු කර නොතිබුණි. ඉන්ධන ඌනතා හා අතිරික්තතා විශාල වශයෙන් දක්නට ලැබුණු අතර අතිරික්තතා ගිණුම්වල ශේෂය රු.33,962,408 ක් වෙනත් ආදායම් ලෙස ලාභයට ගලපා තිබීම ව්‍යාජ ලාභ තත්ත්වයක් බව නිරීක්ෂණය විය.

4.4 නිෂ්ක්‍රිය හෝ ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් පරීක්ෂණ කරනු ලැබේ.

(අ) මධ්‍යම බස්රථ කාර්යාලයෙහි ලංකා බැංකුව පවත්වාගෙන යන කාර්යාල පරිශ්‍රයෙහි ඉදිරිපස, වර්ග අඩි 2500 කට වැඩි ඉඩ ප්‍රමාණයක් 2016 වර්ෂයේ සිට ලිපි ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා පවත්වාගෙන යන අතර, එම කොටස වෙනත් කාර්යයකට යෙදවීමෙන් ලබා ගත හැකිව තිබූ ප්‍රතිලාභ මණ්ඩලයට අහිමි වී තිබුණු අතර, වසර 3 කට ආසන්න කාලයක් නිෂ්කාර්යව පැවතුණි.

(ආ) ටාටා බස්රථ ධාවනයෙන් ඉවත්කර හිනෝ ටර්බෝ බස්රථ යෙදවීම නිසා මධ්‍යම බස්රථ නැවතුම්පල කාර්යාලයෙහි 2011 වර්ෂයේ සිට රු.117,978 ක් වටිනා අයිතම 27ක්, නිශ්ක්‍රීයව පැවතුණි.

4.5 හඳුනාගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 ජූලි 03 දින මණ්ඩලයේ ප්‍රධාන ගබඩා පරීක්ෂාවේදී ගබඩාවට ගෙන එන ලද, ටිකට් මැෂින් සඳහා භාවිතා කරනු ලබන තර්මල් කඩදාසි ටිකට් රෝල් 30,000 පිළිබඳව නියැදි පරීක්ෂාවන් සිදු කරන ලදී. එහිදී නියැදිය අදාල පිරිවිතර සමඟ අනුකූල වී නොතිබුණි. තවද එම දිනට පෙර ගබඩාවට ගෙන එන ලද ගබඩාවේ පැවති ටිකට් රෝල්ද නියැදී පරීක්ෂාවට භාජනය කළ අතර එම නියැදියද පිරිවිතර හා එකඟ වී නොතිබුණි. ඒ අනුව 2017 ජූලි 12 දින දක්වා ගබඩාවට

ලැබී තිබුණු ටිකට් රෝල් 1,623,800ම දිගින් අඩු නොවේය යන්න විගණනයේදී බැහැර කල නොහැකි අතර, ඒ අනුව මණ්ඩලයට දළ වශයෙන් රු. 9,711,268 ක අලාභයක් සිදු වී තිබුණි. රු. 7,888,000 ක් වූ කාර්යය සාධන ඇපකරය 2017 ජූලි 14 දින වන විට කල් පිරී තිබුණද, මණ්ඩලය එම කාර්යය සාධනය ඇපකරය දීර්ඝ කර ගැනීමකින් තොරව ටිකට් රෝල් මිලදී ගැනීමට කටයුතු කර තිබුණි.මේ සම්බන්ධයෙන් 2017 ජූලි 13 හා අගෝස්තු 25 දින විගණන විමසුම් නිකුත් කල අතර, එහිදී විගණන විමසුම මගින් පෙන්වා දී තිබුණු පරිදි එම අවස්ථාවේදී පිරිවිතර හා එකඟ නොවූ ටිකට් රෝල් සපයා ඇති බවට සැපයුම්කරු හා මණ්ඩලය එකඟ වී තිබුණි. ඒ අනුව මණ්ඩලයේ සභාපතිතුමාගේ අංක: ශ්‍රී ලංගම/ප්‍ර.ස.ක/පොදු/01/2017 හා 2017 සැප්තැම්බර් 07 දිනැති ලිපියෙන් පහත පරිදි කටයුතු සිදුකරන බව සඳහන් කළද, ඒ අනුව කටයුතු සිදුකර නොතිබුණි.

i. මණ්ඩලයට සිදුවී ඇති අලාභය සම්බන්ධයෙන් පූර්ණ විධිමත් පරීක්ෂණයක් පවත්වන බව සඳහන් වුවද, 2018 අගෝස්තු 31 දින වන විටද, එම පරීක්ෂණ කටයුතු පවත්වා වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි.

ii. පරීක්ෂණ කටයුතු අවසන් වන තෙක් ගෙවීම් නොකරන බව සඳහන් කර තිබුණද, 2017 ඔක්තෝබර් 23 දින රු. 1,021,050 ක් ද, 2018 ජනවාරි 08 දින රු. 2,382,450 ක්ද, ගෙවා තිබුණි.

iii. කාර්ය සාධන ඇපකරයේ කාලය 2017 ජුනි 14 දින කල්පිරී තිබුණු බැවින්, සැපයුම්කරු 2017 වර්ෂයේ ඉදිරිපත් කරන ලද, ටෙන්ඩරය සඳහා තබා තිබුණු රු. 1,000,000 ක ලංසු ඇපකරය ආදායමට ගැනීමට කටයුතු කරන බව සඳහන් වුවද, එම ඇපකරය 2017 ඔක්තෝබර් 10 දින සැපයුම්කරු වෙත මුදාහැර තිබුණි. ඒ සඳහා සභාපතිතුමාගේ අනුමැතිය ලබාගත් බවට තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය. තවද, 2017 අගෝසතු 29 දින නීති නිළධාරී මගින් එම ලංසු සුරක්ෂණය මණ්ඩලයට අයකරගැනීමේ හැකියාවක් ඇති බව දන්වා තිබුණද, මණ්ඩලය ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත හා 1980 අංක 46 දරන සේවා නියුක්තියන්ගේ භාර අරමුදල් පනත අනුව නියමිත පරිදි දායක මුදල් නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය කාර්යාල 4 කට අදාලව රු.712,069,120 ක් අධිභාර වශයෙන් ගෙවා තිබුණු අතර, දෙසැම්බර් 31 දිනට රු. 96,348,905 ක ගෙවිය යුතු ශේෂයක් පැවතුණි.

4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

2003 ජුනි 02 දිනැති අංක පිඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.2 ඡේදයට අනුකූලව මණ්ඩලය සඳහා සංවිධාන සටහනක්, බඳවා ගැනීමේ පරිපාටියක් හා උසස්වීම් පරිපාටියක් පිළියෙල කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරවා ගෙන නොතිබුණි.

5. තිරසාර සංවර්ධනය

5.1 තිරසාර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 'න්‍යාය පත්‍රය' ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළයුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක වියයුතුද යන්න පිළිබඳ දැනුවත් වී නොතිබුණි.

6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

6.1 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

6.1.1 ප්‍රසම්පාදනයන්

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය පරිදි මණ්ඩලය විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබුණද, 4.2.1 (ආ) පරිදි අවම වශයෙන් වසර 3 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තුගත කර තිබිය යුතු වුවද, ඉදිරිපත් කරන ලද ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම එසේ සකස් කර නොතිබුණි.

(ආ) මෙවලම් හා යන්ත්‍රෝපකරණ ප්‍රසම්පාදනය

2016 වර්ෂයේදී සේවකයන් ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ වැඩ සටහනින් පසුව මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීමට තීරණය කර තිබුණු අතර, එහි එක් අදියරයක් ලෙස දිස්ත්‍රික් කාර්යාල 21 ක් සහ ප්‍රාදේශීය වැඩපල 11 ක් පිහිටුවීමට යෝජනා කර තිබුණි. එමෙන්ම සේවකයින් විශ්‍රාම යාම නිසා යන්ත්‍රසූත්‍ර වැඩිකර කාර්යක්ෂමතාවය වැඩිකර ගැනීමේ අරමුණින් හා අළුත්වැඩියාවන් කාර්යක්ෂමව සිදුකර ගැනීම සඳහා මෙම යන්ත්‍ර සූත්‍ර හා මෙවලම් මිලදී ගැනීමේ ව්‍යාපෘති යෝජනාවක් සහ ව්‍යාපෘතිය වෙනුවෙන් රු. 320,548,000 ක් වූ පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබූ අතර, ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන නොතිබුණි. මේ පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) බස්රථ එංජින් අලුත් වැඩියා කිරීමට අවශ්‍ය මෙවලම් සහ යන්ත්‍රෝපකරණ අයිතම 22 ක් ප්‍රසම්පාදනය කිරීමට මණ්ඩලය තීරණය කර තිබූ නමුත්, 2017 වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන සැළැස්මෙහි හා ක්‍රියාකාරී සැළැස්මෙහි අදාල ප්‍රසම්පාදනයක් ඇතුලත්කර නොතිබුණු අතර, වාර්ෂික අයවැය ලේඛනයෙහිද ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ii) ව්‍යාපෘති යෝජනාව තුළ ව්‍යාපෘතියේ අරමුණු, ව්‍යාපෘති කාල රාමුව, ව්‍යාපෘති සැලැස්ම, අරමුදල් සපයාගන්නා ආකාරය හා සපයා ගැනීමේ හැකියාව යනාදී කරුණු පිළිබඳව විස්තර සඳහන් කර නොතිබුණි.

(iii) 2017 ජනවාරි 02 දිනැති ව්‍යාපෘති යෝජනාව සමඟ එහි පිරිවැය ඇස්තමේන්තුව ඉදිරිපත් කර තිබුණු අතර, එම පිරිවැය ඇස්තමේන්තුවෙහි ඇතුලත් නොවූ වටිනාකම රු. 33,434,426ක් වූ යන්ත්‍ර සූත්‍ර 12 ක් සඳහාද ප්‍රසම්පාදන කටයුතු සිදුකර තිබුණි.

(iv) මෙවලම් සහ යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන අත්පොතෙහි 5.3.2 ඡේදය පරිදි පලකල පුවත්පත් දැන්වීමෙහි ණය පදනම මත භාණ්ඩ ලබාදිය යුතු බව, මිලදී ගැනීමට බලාපොරොත්තු වන භාණ්ඩ පිළිබඳ විස්තර හා ලංසු ලේඛණ ලබා ගැනීම සඳහා ආපසු නොගෙවන ලද රු.12,500 ක් මණ්ඩලයට ගෙවිය යුතු බව ආදී තොරතුරු ඇතුළත් කර නොතිබීම නිසා මණ්ඩලය බලාපොරොත්තු වූ පරිදි තරඟකාරීත්වය තුලින් හොඳම සැපයුම්කරු තෝරාගැනීමේ අරමුණ ඉටුවී නොතිබුණ බව නිරීක්ෂණය විය.

(v) මණ්ඩලය ටොන් 5 ක ෆෝක් ලිෆ්ට් 2 ක් මිලදී ගැනීමට තීරණය කර තිබුනු අතර ඒ සඳහා විශාල සැපයුමකරුවන් ප්‍රමාණයක් නොසිටින බැවින් මිල සැදහුම් ක්‍රමය යටතේ ලියාපදිංචි සැපයුම්කරුවන් හෝ දුරකථන නාමාවලියේ කහ පිටුවල සඳහන් සැපයුම්කරුවන් තෝරාගෙන මිල ගණන් කැඳවීමේ හැකියාව තිබියදී මෙම මිලදී ගැනීම ඉහත මෙවලම් හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමේ පුවත්පත් දැන්වීම් යටතේ මිලගණන් කැඳවා තිබීම නිසා එක් ආයතනයකින් පමණක් මිල ගණන් ලැබී තිබුණි.

(vi) මෙවලම් සහ යන්ත්‍රෝපකරණ ප්‍රසම්පාදන ලැයිස්තුවෙහි ටොන් 5 ෆෝක් ලිෆ්ට් එකක පිරිවැය රු. 1,500,000 ක් ඇස්තමේන්තුකර තිබූ අතර, සැපයුම් සමාගම ඉදිරිපත් කරන ලද මිල රු.7,200,000 (වැට් රහිත) වූයෙන්, මිල ගණන් අතර රු. 5,700,000ක වෙනසක් එනම්, එය සියයට 380 ක විචලනයක් තිබියදී, තාක්ෂණික ඇගයීම් කමිටුව ඒ පිළිබඳව හෝ වෙළඳපළ වටිනාකම කෙරෙහි අවධානය යොමු නොකර මිලදී ගැනීම් නිර්දේශ කර තිබුණි.

(vii) මණ්ඩලයේ අවශ්‍යතාවය වී තිබුණේ ටොන් 5 ෆෝක් ලිෆ්ට් 2 ක් මිලදී ගැනීම සඳහා වූවද, රු.7,200,000 ක මුදලකට (වැට් රහිත) ටොන් 5 එක් යන්ත්‍රයක් හා ටොන් 2.5 ෆෝක් ලිෆ්ට් යන්ත්‍ර 2 ක් වෙන් කරන ලද වටිනාකමට මිළදී ගෙන තිබුණි. එම යන්ත්‍ර විගණිත දින වූ 2018 අගෝස්තු 28 වන ටද නිෂ්කාර්යව පැවතුණි.

(viii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 ඡේදය හා අතිරේක 33 හි සංශෝධිත සීමාවන් අනුව මිල සැදහුම් ක්‍රමය යටත් අවම වශයෙන් සීල් තබන ලද මිල ගණන් තුනක් ලබාගෙන ඒ අතරින් සැපයුම්කරු තෝරාගත යුතු වුවත් ඊට පටහැනි ලෙස රු.419,750 ක් වටිනා Air compressor යන්ත්‍රයක් මිලදී ගැනීමේදී එක් පෞද්ගලික ආයතනයකින් ඇණවුමකින් තොරව භාණ්ඩ සපයා ඇති බවත් ගබඩාවට භාණ්ඩ ලැබී දින 14 කට පසුව භාණ්ඩ ලද බවට සහතිකය නිකුත් කර තිබුණි.

(ix) පුද්ගලික සමාගමකින් සපයන ලද වටිනාකමරු.850,815 ක Feeler Gauge, Torque Wrench and Horning Heads යන අයිතම03 ක ඒකක 13ක් දෝෂ සහිත බැවින් ප්‍රතික්ෂේප කර තිබුණද, විගණිත දිනය 2018 අගෝස්තු 08 දින වන විටත් ගබඩාවේ තිබූ අතර ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(x) 2018 පෙබරවාරි 06 දින වන විට මාල්බෝ ට්‍රේඩිං ප්‍රයිවට් ආයතනයෙන් මිලටගත් වටිනාකම රු.7,190,662 ක අයිතම 3ක් සඳහා මණ්ඩලයේ පිරිවිතරයන් හා ගැලපේද යන්න පරීක්ෂාකර නොතිබුණි.

(ඇ) බස්රථ එන්ජින් මිළදී ගැනීම හා සවිකිරීම පිළිබඳ ප්‍රසම්පාදන විගණනය

(i) බස්රථ එන්ජින් 326 ක් රු. 2,383,089 බැගින් හා රු. 2,381,044 බැගින් බස් රථ එන්ජින් 163 ක් වශයෙන් රු. 1,164,997,186 ක් වටිනා එන්ජින් 489 ක් අමාත්‍යාංශය විසින් මණ්ඩලය වෙත ලබා ද තිබුණි. මණ්ඩලය විසින් අදාළ ප්‍රාදේශිකයන්වල නව එන්ජින් කට්ටල සවි කල යුතු බස් රථ පිළිබඳව තොරතුරු කැඳවීම් කර තිබුණු අතර අදාළ ප්‍රාදේශික ඉංජිනේරු විසින් එන්ජින් කට්ටලසවිකළ යුතු බස්රථ ලේඛනයක් ඉදිරිපත් කර තිබුණි. එසේ අදියර 01 දී නිර්දේශිත බස්රථ සඳහා එන්ජින් සවිකර නොතිබුණු අවස්ථා 172 ක් විය.

(ii) නව එංජින් කට්ටල සවි කිරීමක් සඳහා ගලවන ලද එංජින් 124 ක් අලුත්වැඩියාවකින් තොරව බස් රථ වලට සවිකල හැකි හොඳ තත්ත්වයේ පැවතුණි.එංජින් 83 ක් ඩිපෝ මට්ටමින් අලුත් වැඩියා කර ගබඩාවල තබා තිබුණු අතර ප්‍රාදේශීය වැඩපල වලට සහ ජර්මන් කාර්මික විදුහලෙන් අළුත්වැඩියා කටයුතු සිදුකර එංජින් 86 ක් විගණිත දින තෙක් ඩිපෝ වෙත ලැබී නොතිබුණි.

(ඇ) මුද්‍රණ යන්ත්‍ර මිළදී ගැනීම.

(i) මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේ ධාවන අංශය සඳහා රු. 397,000 ක් වටිනා ගමන්අවසර පත්‍ර මුද්‍රණ යන්ත්‍රයක් 2017 පෙබරවාරි 24 දින පුද්ගලික සමාගමකින් මිළදී ගෙන තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (අ) වගන්තිය අනුව ගිවිසුමකට එළඹ නොතිබුණු අතර, එම භාණ්ඩ ගබඩාවට ලැබුණු පසු එහි පිරිවිතර හා ක්‍රියාකාරිත්වය පිළිබඳව පරීක්ෂාවකින් තොරව භාර ගෙන තිබුණි. නමුත් මෙය ක්‍රියාත්මකවීමේදී දෝෂ සහිත බැවින්, අදාල ආයතනය වෙත ආපසු භාර දී තිබුණද විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණු හෙයින්, අදාල පාඩුව මණ්ඩලයට අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ii) මණ්ඩලය 2017 ඔක්තෝබර් 24 දින මුද්‍රණ යන්ත්‍ර 02 ක් සඳහා නැවත මිළගණන් කැඳවා තිබුණු අතර ප්‍රසම්පාදන තීරණයකින් තොරව ඉහත ප්‍රතික්ෂේපිත ආයතනය වෙතින්ම රු.2,550,000 කට හැදුනුම්පත් මුද්‍රණයන්ත්‍ර 02 ක් මිළදීගෙන තිබුණි.

(ඉ) මධ්‍යම බස් රථ කාර්යාලයෙහි ප්‍රසම්පාදන සැලැස්මක් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් බස්රථ අලුත්වැඩියාව සඳහා අවශ්‍ය අමතර කොටස් පංචිකාවත්තේ ඇති වෙළඳසැල් වලින් මිලදී ගෙනතිබුණි. මේ හේතුවෙන් නියමිත වේලාවට නියමිත ප්‍රමිතියෙන් හා ගුණාත්මක බවින් යුත් අමතර කොටස් සාධාරණ මිලකට ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

(ඊ) වටිනාකම රු. 7,890,664 ක් වූ අමතර කොටස් පරීක්ෂණ කණ්ඩායම විසින් පරීක්ෂා කිරීමෙන් පසු අදාල පිරිවිතරයන් සමඟ නොගැලපෙන බව ඉන්වොයිස් පත්වල නිර්දේශයන් සිදු කර තිබුණද, එසේ ප්‍රතික්ෂේපිත අමතර කොටස් 2017 ඔක්තෝබර් 17 දින පැවති අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් මිළදී ගැනීමට තීරණය කර තිබුණි. ඒ අනුව එම අමතර කොටස් ඩිපෝ හා ප්‍රාදේශීය වැඩපොළ වෙත නිකුත් කර තිබුණි.

6.2 පාරිසරික හා සමාජ වගකීම් ඉටු කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මධ්‍යම බස්රථ නැවතුම්පල කාර්යාලයෙහි ඉංජිනේරු අංශය සඳහා ප්‍රමාණවත් ගබඩා පහසුකම් නොතිබුණු අතර, ගබඩා භාරකරු ඉතා කුඩා පරිශ්‍රයක තම රාජකාරී කටයුතු කරගෙන යන අතර, රාජකාරී කටයුතු කිරීමට ප්‍රමාණාත්මක පහසුකම් සහිත වාතාවරණයක් නොතිබුණි.

(ආ) සියලුම වාහන සේවා කටයුතු ඩිපෝව විසින් සිදු කරන අතර ඊට අදාළව බලපත්‍රයක් ලබා ගතයුතු බව 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් හා 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතට අනුව දක්වා තිබුණද, මණ්ඩලයේ ඩිපෝ 107 කින් ඩිපෝ 09 ක් පමණක් මෙම බලපත්‍රය ලබා ගෙන තිබුණි.

(ඇ) මධ්‍යම බස් රථ කාර්යාලය භූ ගත ජල ටැංකි පවත්වාගෙන යනු ලබන අතර, එම ටැංකි විවෘතකල විට කැරපොත්තන් හා වෙනත් කෘමීන්, 2018 ජුනි 05 දින සිදුකරන ලද ස්ථානීය පරීක්ෂාවේදී දැක ගතහැකි වූ අතර, ජල ටැංකිය අසළ මී ගුල්ද තිබුණි.ඒ අනුව මධ්‍යම බස් රථ පරිශ්‍රයෙහි පරිභෝජනය කරනු ලබන ජලයෙහි පවිත්‍රතාවය පිළිබඳව ගැටළුකාරී විය. එමෙන්ම ජල ටැංකිය අසල ඇති කඩයට අයත් ජල බෝතල් හා බිම බෝතල් පොම්පාගාරයේ ගොඩ ගසා ඇති අයුරු නිරීක්ෂණය වුණි.

6.3 අයවැය ලේඛනමය පාලනය

2003 ජූනි 02 දිනැති හා අංකපී.ඊ.ඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රෙල්ඛයේ 5.2 ඡේදය පරිදි අයවැයගත ආදායම් සහ වියදම් ප්‍රකාශය අයවැයගත ශේෂපත්‍රය, අයවැයගත මුදල් ප්‍රවාහ ප්‍රකාශයක හා ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව අයවැයගත ප්‍රාග්ධන වියදම් වාර්තාවක් පිළියෙල කර නොතිබුණි.

7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු විය.

	පද්ධති හා පාලන ක්ෂේත්‍ර		නිරීක්ෂණ
(අ)	ස්ථාවර වත්කම් පාලනය	(i)	මණ්ඩලයේ බස් රථවල විස්තර ඇතුළත් ලේඛනයක් පවත්වා නොගැනීම.
		(ii)	මණ්ඩලය සතු ඉඩම් පිළිබඳව ලේඛනයක් පවත්වා නොගැනීම.
		(iii)	වත්කම්වල ආරක්ෂාව ඇතිවන පරිදි භාරකාරත්වය නොපැවරීම.
		(iv)	වත්කම් මිලට ගැනීම හා ගිණුම්ගත කිරීමේ අභ්‍යන්තර පාලනය දුර්වල වීම.
		(v)	වාර්ෂික වත්කම් සත්‍යාපනයන් නොකිරීම.

(ආ)	ලැබිය යුතු හා ගෙවිය යුතු මුදල්		ලැබිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු නොකිරීම හා ගෙවිය යුතු මුදල් ගෙවීමට කටයුතු නොකිරීම.
(ඇ)	අත්තිකාරම් පියවීම	(i)	අත්තිකාරම් ලේඛන පවත්වා නොගැනීම.
		(ii)	ලබාගත් අත්තිකාරම් අදාළ කාර්යය නිමවූ විගසම පියවීමට කටයුතු නොකිරීම.
		(iii)	වගකිව යුතු නිලධාරියෙකු විසින් අධීක්ෂණය නොකිරීම.
		(iv)	කාලීන සැසඳීම් හා පියවීම් නොකිරීම.
(ඈ)	සේවක ඇප තැන්පත්		සේවක ඇප තැන්පත් සඳහා ලේඛන පවත්වා නොගැනීම හා සේවක ඇප තැන්පත් මුදල් මණ්ඩලයේ වියදම් සඳහා යොදා ගැනීම.
(ඉ)	බැංකු ගිණුම්		මුදල් අංශය විසින් අවශ්‍යතාවයකින් තොරව බැංකු ගිණුම් පවත්වාගෙන යාම, සැසඳුම් නොකිරීම හා ගැලපීම් නොකිරීම.
(ඊ)	ගමන් බලපත්‍ර ආදායම		ගමන් බලපත්‍ර ආදායම් එකතු කිරීම් සඳහා අනුක්‍රමික අංක සහිත මුද්‍රිත ඉන්වොයිස් පත්‍ර භාවිතා නොකිරීම.
(උ)	ගබඩා පාලනය	(i)	ගබඩාවට ලැබෙන භාණ්ඩ වගකිව යුතු නිලධාරියෙකුගේ අධීක්ෂණයට ලක් නොවීම.
		(ii)	දීර්ඝ කාලයක සිට පැවතෙන පාවිච්චියට ගත නොහැකි භාණ්ඩ ඉවත් කිරීමට කටයුතු නොකිරීම.
		(iii)	අමතර කොටස් සැපයීමේදී මධ්‍යම ගබඩාව හරහා ඩිපෝව වෙත නිකුත් නොකිරීම.
		(iv)	ගබඩා දත්ත හා ඩිපෝවල දත්ත සැසඳීම් නොකිරීම.
(ඌ)	වාහන පාලනය	(i)	සෑම වාහනයක් වෙනුවෙන්ම ලොග් පොතක් පවත්වා නොගැනීම.

(ii) වාහන භාවිතයේදී ධාවන සටහන් නිවැරදිව සම්පූර්ණ කර පවත්වා නොගැනීම හා ඉන්ධන තුලනයන් සිදු නොකිරීම.

(iii) එක් එක් වාහනය සම්බන්ධයෙන් ඒවා මිලට ගත් දිනය, වටිනාකම, අළුත්වැඩියා පිළිබඳ වාර්තා පිළියෙල නොකිරීම.

(iv) වාහනවල මයිලෝ මීටර් ක්‍රියාත්මක තත්ත්වයේ පවත්වා නොගැනීම.

(v) වාහනවල ගමන්කළ දුර, භාවිතා කළ ඉන්ධන ප්‍රමාණය, ගමනට අදාළ අනුමැතිය ආදිය නිවැරදි ලෙස සටහන් නොකිරීම.

(vi) වාහන ලබා දීමේදී නිසි අනුමැතීන් ලබා දී නොතිබීම.

(vii) නිසි ඉන්ධන ටැංකි ධාරිතාවයක් සහතික කර නොගැනීම.

(viii) ඉන්ධන මිනුම් සඳහා නිවැරදි ගිල්වුම් කොදු භාවිතා නොකිරීම.

(ix) ඉන්ධන ඌනතා හා අතිරික්තතා පිළිබඳව පාලනය දුර්වල වීම.

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති